


# උප දෙවි ලිපි ගොනු

# PERCY JACKSON

## THE DEMIGOD FILES

පරිවර්තනය

**සවින්දි ආරියතිලක**

Scanned by TapScanner

PERCY JACKSON AND

# THE DEMIGOD FILES

පර්සි ජැක්සන්

# උප දෙවි ලිපිගොනු

Scanned by TapScanner

ආදරණීය තරුණ උප දෙවියාණෙනි,

ඔබ මේ පොත කියවමින් සිටිනවා නම්, මට කළ හැකි එකම දෙය සමාව ඉල්ලීම පමණි. ඒ ඔබගේ ජීවිතය තව තවත් අනතුරුදායක වීමට ආසන්න බැවිනි.

මේ වන විට, ඔබ මනුෂ්‍යයෙකු නොවෙන බව ඔබ තේරුම් ගෙන තිබෙනවා විය යුතුය. මේ පොත තුළින් සාමාන්‍ය මනුෂ්‍ය දරුවෙකුට කිසිදා දැකීමට නොලැබෙන උප දෙවිවරුන්ගේ ලෝකයට එබී බැලීමට ඉඩක් ඔබට ලැබෙනු ඇත. අර්ධ-ලෝහිත කඳවුරේ ජ්‍යෙෂ්ඨ ලේකම් ලෙස, මම ඔබට ලබා දෙන මේ අතිශයින් රහසිගත තොරතුරුවලින් ඔබට පුහුණුවීම් අතරතුරේ දී පණ බේරාගෙන සිටීමට වැදගත් වන උපදෙස් සහ හෝඩුවාවන් ලැබෙනු ඇති කියා මම බලාපොරොත්තු වෙමි.

'උපදෙවි ලිපිගොනුව'ට මීට පෙර ලේඛනගත නොවූ පර්සි ජැක්සන්ගේ අතිශයින්ම අන්තරාදායක වික්‍රමයන් තුනක් ඇතුළත් වේ. ඔහුට ඒරීස්ගේ අමරණීය සහ බිහිසුණු පුත්‍රයින් දෙදෙනා මුණ ගැසුණු අන්දම මෙයින් ඔබට දැනගැනීමට ලැබෙනු ඇත. දිගු කාලයක් තිස්සේ අර්ධ-ලෝහිත කඳවුරේ පුරාවෘත්තයක් පමණක් ලෙස සැලකූ ලෝකඩ මකරා ගැන සත්‍ය සොයාගැනීමට ද ඔබට ලැබෙනු ඇත. එමෙන්ම හේඩීස් අලුත් රහසිගත ආයුධයක් ලබාගත් අන්දමත්, එය නිර්මාණය කිරීමට පර්සි නොදැනුවත්ව ම දායක වී ඇති ආකාරයත් අනාවරණය කර ගැනීමට ඔබට ඉඩ ලැබේවි. මෙම කතාවලින් ඔබව බිය ගැන්වීමට මම උත්සහ නොකරමි, එහෙත් වීරයෙකුගේ ජීවිතය කොයි තරම් උපද්‍රවවලට ලක් වීය හැකි ද යන්න ඔබ අවබෝධ කර ගැනීම වැදගත්ය.


ඔබ මෙම විස්තර උප දෙවියෙකු-නොවෙන අයෙක් අතට පත් නොකිරීමට වග බලා ගන්න, එසේ නොකළහොත් ක්ලැරිස්, ඇයගේ විදුලි ධාරා නිකුත් කරන හෙල්ලය ද රැගෙන ඔබ පසුපස එනු ඇත. මාව විශ්වාස කරන්න, එය ඔබට අත්දැකීමට අවැසි දෙයක් නොවේවි.

මෙම පොත හොඳින් අධ්‍යයනය කර, ඒ දැනුම ඔබගේ අලුතින් ආරම්භ වූ වික්‍රමාන්විත ජීවිතයට රැකුලක් කරගන්න. ඔබට සියලු දෙවි දේවතාවියන්ගේ පිහිට ලැබේවා, තරුණ උප දෙවියනි!

ඔබේ විශ්වාසවන්ත,

රික් රියෝඩන්,
ජ්‍යෙෂ්ඨ ලේකම්,
අර්ධ-ලෝහිත කඳවුර.

Scanned by TapScanner


ලෝන්ග් අයිලන්ඩ් මුහුදු තීරය
මල් වෙඩි වෙරළ
සෙපිරොස් ඇළ
භෝජන මණ්ඩපය
රංගාවාටය
සුද්ධායුධ ගබඩාව
කැබින්
විල
ඉස්තාල
මල්ලව ඇමිය
කලා + ශිල්පාගාරය
ස්ට්‍රෝබෙරි යාය
අත්පන්දු ක්‍රීඩාංගනය
තාලියාගේ පයින් ගස
මහා ගෙදර
අර්ධ-ලෝහිත කන්ද
ධ-ලෝහිත කඳවුර

# පර්සි ජැක්සන් සහ ලෝකඩ මකරා

එක මකරෙකුට ඔයාගේ මුළු දවසම කාබාසිනියා කරන්න පුළුවන්.

මං කියනවට විශ්වාස කරන්න, උප දෙවියෙක් විදිහට මට නරක අත්දැකීම් ගොඩක් ලැබිලා තියෙනවා. මාව හපාකාලා තියෙනවා, හූරලා තියෙනවා, පිච්චිලා වගේම විෂ කැවිලත් තියෙනවා. මම තනි-ඔළුවේ මකරු, ඔළු-දෙකේ එවුන්, ඔළු-අටේ එවුන්, ඔළු-නමයේ එවුන් වගේම, ඔළු ගාන ගණන් කර කර හිටියොත් මැරුම් කන්න වෙන නිසා ගණන් කර ගන්න බැරි තරම් ඔළු ගොඩක් තිබුණු මකරු සමගත් මම සටන් කරලා තිබුණා.

ඒත් ලෝකඩ මකරෙක් එක්ක? මං හිතුවෙම මාවයි මගේ යාළුවන්වයි චූටි කෑලි ගොඩක් වෙලා නතර වෙයි කියලයි.

★★★

ඒ සැඳෑ වරුවත් පටන් ගත්තේ සාමාන්‍ය විදියටමයි.

ඒ ජූනි මාසයේ අග බාගයයි. මම මෑතකදී ම ගිය ගවේෂණයෙන් ආපසු ඇවිත් සති දෙකක් විතර ගත වී තිබුණා. දැන් අර්ධ-ලෝහිත කඳවුරේ ජීවිතය නැවතත් යථා තත්ත්වයට හැරෙමින් තිබුණා. සැටර්ලා රුක් දෙවඟනන් පස්සේ පැන්නුවා. වනාන්තරයේ රාක්ෂයෝ උඩු බිරුවා. කඳවුරුකරුවෝ එකිනෙකාට

විහිළු කොළොප්පම් කර ගත්තා. ඒ වගේම අපේ කඳවුරු අධ්‍යක්ෂක, ඩයනයිසියස්, නරක වැඩ කරන කාව වුණත් පඳුරකට හැරෙව්වා. සාමාන්‍ය ගිම්හාන-කඳවුරක වෙන දේවල්ම තමයි.

රෑ කෑමෙන් පසුව, කඳවුරුකරුවෝ හැමෝම භෝජන මණ්ඩපයේ නැවතුණා. අපි හැමෝම උද්දාමිමත් වී සිටියේ, එදා රෑ පැවැත්වීමට නියමිතව තිබුණු කොඩිය ඇල්ලීමේ තරඟය දරුණු එකක් වෙන්න ගිය නිසයි.

ඊට කලින් රෑයේ, හෙෆාස්ටස් කැබිනයේ අය මහ විපර්යාසයක් කළා. එයාලා ඒරිස්ගෙන් කොඩිය අල්ලා ගත්තා - මගේ උදවුව ඇතිව, බොහෝම ස්තුතියි - ඒ කියන්නේ අද රෑට ඒරිස් කැබිනයේ අය ඒකට වාඩුව ගන්න බලයි. හොඳයි.... එයාලා හැම වෙලාවෙ ම බලන්නේ කාගෙන් හරි වාඩුවක් ගන්න තමයි, ඒත් මේ රෑ විශේෂයි.

නිල් කණ්ඩායමට හෙෆාස්ටස් කැබිනය, ඇපලෝ, හර්මිස් සහ මම - පොසෙයිඩන් කැබිනයේ එකම උප දෙවියා - සිටියා. නරක ආරංචිය තමයි මේ වතාවට ඇතීනා සහ ඒරිස් - යුධ දෙවිවරුන්ගේ කැබින් දෙකම - අපිට විරුද්ධව රතු කණ්ඩායමට එකතු වී සිටියා. එයාලට ඇෆ්‍රෝඩයිටි, ඩයනයිසියස් සහ ඩිමීටර් කැබින්වල සහයත් ලැබුණා. අනෙක් කොඩිය දරාගෙන සිටියේ මගේ යාළුවා ඇනබෙත්ගේ නායකත්වය යටතේ තිබූ ඇතීනා කැබිනයයි.

ඇනබෙත් කියන්නේ ඔයාට හතුරු කරගන්න හොඳ කෙනෙක් නම් නෙවෙයි.

තරඟය පටන් ගන්න මොහොතකට කලින්, එයා මගේ ළඟට ඇවිද ආවා. "හේයි, පාසි මොළේ."

"ඔය නම කියලා මට කතා කරන එක නතර කරන්න බැරි ද?"

මට ඒ නම පෙනෙන්න බැහැ කියලා එයා දැනගෙන හිටියා. වැඩියෙන් ම ඒ එයාට එකට-එක කියන්න තරම් හොඳ නමක් කවදාවත් මගේ කටට ආවේ නැති නිසයි. එයා ඇතීනාගේ දුවෙක් නේ, ඉතින් ඒකෙන් එයාට නමක් පටබඳින්න මට වැඩි දෙයක් ලැබුනේ නැහැ. මං කියන්නේ 'බකමූණු ඔළුවා' නැත්නම් 'පණ්ඩිත ආච්චි' වගේ නම් ඒ හැටි හිත් ගන්නා අපහාස නෙවෙයි නේ.



"ඔයා ඒකට ආසයි කියලා ඔයා ම දන්නවා නේ." එයා මට උරහිසෙන් පාරක් ගැහුවා. මං හිතන්නේ එයා ඒක කරන්න ඇත්තේ යාළුකම අඟවන්නයි. ඒත් එයා සම්පූර්ණ ග්‍රීක යුධ සන්නාහයෙන් සැරසී සිටි නිසා ඒ පාර ටිකක් රිදුණා.

යුධ හිස්වැසුමට යටින් එයාගේ අළු පාට ඇස් තරු කැට දෙකක් වගේ දිස්න දුන්නා. එයාගේ තඹ පාට පෝනිටේලය උරහිසක් මත කැරලි ගැසී තිබුණා. යුධ සන්නාහයෙන් සැරසිලා ලස්සන වෙන්න කාටත් අමාරු වැඩක් වුණත්, එයා ඒ අභියෝගය ජයගෙන තිබුණා.

"මං ඔයාට දෙයක් කියන්නම්." එයා කටහඬ පහත හෙළුවා. "අද රෑට අපි ඔයාලව කුඩුපට්ටම් කරන්නයි යන්නේ. ඒත් ඔයා ආරක්ෂක ස්ථානයක් තෝරගත්තොත්... හරියට දකුණු අංශය වගේ... ඔයාව ඒ හැටි කුඩුපට්ටම් නොකරන්න මම වගබලා ගන්නම්."

"අනේ, බොහෝම ස්තුතියි," මම කිවුවා. "ඒත් මම සෙල්ලම් කරන්නේ දිනන්න."

එයා හිනාවක් පෑවා. "යුද්ධ පිටියෙදි හම්බෙමු."

එයා එයාගේ කණ්ඩායම් සගයෝ වෙත දිවුවා. එයාලා මහ හඬින් හිනාවෙමින් ඇනබෙත්ට 'පහක්' දුම්මා. එයා මේ තරම් සතුටින් ඉන්නවා මම කවදාවත් දැකලා තිබුනේ නැහැ. මාව පරද්දන්න අවස්ථාවක් ලැබුණු එක එයාගේ ජීවිතේට ලැබුණු හොඳම දේ වගෙයි.

බෙකන්ඩොර්ෆ් යුධ හිස්වැසුම කිහිල්ලක් යට රුඳවාගෙන මගේ ළඟට ආවා. "එයා ඔයාට කැමතියි, කොල්ලෝ."

"ආයෙත් අහලා," මම කෙඳිරුවා. "එයා ඉලක්ක පුහුණුවක් විදිහට මට කැමතියි."

"නැහ්, එයාලා හැම වෙලාවෙම කරන්නේ ඒක තමයි. කෙල්ලෙක් ඔයාව මරන්න උත්සහ කරන්න පටන් ගන්නවා නම්, ඒ කියන්නේ එයාගේ හිතේ ඔයාට කැමැත්තක් ඇතිවෙලා."

"සැහෙන තේරුමක් ඇති කතාවක්."

Scanned by TapScanner

බෙකන්ඩොර්ෆ් උරහිස් ඇකිළුවා. "මං මේ වගේ දේවල් ගැන කතා කරන්න ම දන්නවා. ඔයා එයාට ගිනිකෙළි බලන්න යන්න ඕනෑ."

එයා ඒක කිවුවේ ඇත්තටම ද කියලා මට හිතාගන්න බැරිවුණා. බෙකන්ඩොර්ෆ් කියන්නේ හෙෆාස්ටස් කැබිනයේ ප්‍රධාන උපදේශක. එයා වෙනස් නොවෙන රැවුමක් සටහන් වූ මුහුණකුත්, ක්‍රීඩකයෙකුගේ වගේ වැඩුණු මාංශ පේශී සහ කම්මලේ වැඩ කිරීමෙන් ගොරෝසු වූ දෑත් ඇති යෝධ හාදයෙක්. වයස අවුරුදු දහ අට ලබා සිටි එයා මේ සරත් සෘතුවේ දී නිව්යෝක් සරසවියට ඇතුළු වීමට සූදානම්ව සිටියා. එයා මට වඩා වැඩිමල් කෙනෙක් නිසා, සාමාන්‍යයෙන් එයා කියන දේවල් අහන්න මම පුරුදු වෙලා සිටියා, ඒත් ජූලි හතර වෙනිදා වෙරළේ පවත්වන ගිනිකෙළි සංදර්ශනය - ඒක හරියට ගිම්හානයේ ලොකුම ආදර හමුවීම් දිනය වගෙයි - බලන්න යන්න ඇනබෙත්ට කතා කරන එක... ඒ ගැන හිතද්දිත් මගේ බඩ පිනුම් ගැසුවා.

ඒ වෙලාවේ සිලේනා බියුරිගාඩ්, ඇෆ්‍රොඩයිට් කැබිනයේ ප්‍රධාන උපදේශිකාව එතැනින් ගියා. බෙකන්ඩොර්ෆ් අවුරුදු තුනක් තිස්සේ එයා ගැන අදහසක් හිතේ තියාගෙන ඉන්න බව කඳවුරේ කාටවත් රහසක් වුනේ නැහැ. දිග කළු කොණ්ඩයක් සහ ලොකු තිල් දෑසක් තිබුණු සිලේනා බියුරිගාඩ් ඇවිදගෙන යද්දි එයා දිහා හැරිලා නොබලන කොල්ලෙක් නැහැ. "සුබ පැතුම්, චාර්ලී." එයා කිවුවා, (බෙකන්ඩොර්ෆ්ට මුල් නමෙන් කිසිම කෙනෙක් කවදාවත් කතා කරන්නේ නැහැ.) බෙකන්ඩොර්ෆ්ට වශී කරවනසුලු හිනාවක් පෑවා එයා රතු කණ්ඩායමේ ඇනබෙත්ට එකතු වෙන්න ගියා.

"අහ්..." බෙකන්ඩොර්ෆ් තදින් කෙළ ගිල්ලේ හරියට එයාට හුස්ම ගන්න විදිහත් අමතක වෙලා වගෙයි.

මම එයාගේ උරහිසට තට්ටුවක් දැමුවා. "අවවාදෙට ස්තුතියි, මචෝ. කෙල්ලෝ ගැන ඔයාට ඔච්චර දැනුමක් තියෙන එකම කොච්චර දෙයක් ද. දැන් එන්න. අපි කැලේ පනිමු."

***

සුපුරුදු විදිහටම, බෙකන්ඩොර්ෆ් සහ මම වඩාත්ම අනතුරුදායක රාජකාරිය බාරගත්තා.



ඇපලෝ කැබිනයේ අය එයාලගේ දුනු ඊතලවලත් ආරක්ෂාව සලසන අතරේ, හර්මීස් කැබිනයේ අය හතුරාව වෙනතකට යොමු කරන්න වනාන්තරය මැදට පහර දේවි. ඒ අතරවාරයේ, බෙකන්ඩොර්ෆ් සහ මම වම් අංශය වටෙත් හොරෙන් ගිහින්, හතුරු පාර්ශවයේ කොඩිය ඇති තැන හඳුනාගෙන, එහි ආරක්ෂකයින්ට පහර දිලා, කොඩිය අරගෙන ආපහු අපේ පැත්තට එනවා. හරිම සරලයි.

ඇයි වම් අංශයම?

"මොකද ඇනබෙත් මට කිවුවේ දකුණට යන්න කියලා," මම බෙකන්ඩොර්ෆ්ට කිවුවා, "ඒ කියන්නේ අපිව වම් පැත්තට නොයවා ඉන්නයි එයාට ඕනෑ."

බෙකන්ඩොර්ෆ් ඔළුව වැනුවා. "අපි ලෑස්ති වෙමු."

එයා අපි දෙන්නට රහසිගත ආයුධයක් සාදා තිබුණා - පරිසරය අනුව අනුවර්තනය වෙන්න මායාවක් කැවූ ලෝකඩ කවුසු සන්නාහයක්. ඒක ඇඳගෙන අපි ගල් ගොඩක් ඉදිරියේ සිටගත්තා ම, අපේ උර තහඩු, හිස්වැසුම් සහ පලිහ අළු පාටට හැරුණා. අපි පඳුරක් ඉදිරියේ සිටගත්තා ම, ලෝහය කැලෑ කොළ පාටට හැරුණා.

ඒක නියම අදෘශ්‍යමාන වීමක් නොවුණත්, එයින් අපිට සෑහෙන හොඳ මුවාවක් ලැබුණා. අඩු තරමේ දුරටවත්.

"මේක හදන්න කල්පයක් විතර ගියා," බෙකන්ඩොර්ෆ් මට අවවාද කළා. "ඒකට මොනවත් කරන්න එහෙම එපා."

"හොඳමයි, කැප්ටන්."

බෙකන්ඩොර්ෆ් ගෙරෙව්වා. එයාට කැප්ටන් කියලා කතා කරනවාට එයා කැමතියි කියලා මට තේරුණා.

හෙෆාස්ටස් කැබිනයේ ඉතිරි අය අපිට සුබ පැතුවා. ඊට පස්සේ කැලෑවට රිංගාගත් අපිව, එසැණින්ම ගස්වලට ගැළපෙන්න දුඹුරු සහ කොළ පාටට හැරුණා.

***

අපි කණ්ඩායම් දෙක අතර සීමාව ලෙස සැලකූ දොළ පාර පසු කළා.

Scanned by TapScanner

අපිට ඇතින් සටන් කරන හඬවල් ඇසුණා - කඩු සහ පලිහ එකිනෙක ගැටෙන හඬවල්. මොකක්හෝ මායා ආයුධයක එළි ධාරාවක් මගේ ඇස ගැටුණා, ඒත් එය පාවිච්චි කරන කෙනෙක් පෙනුනේ නැහැ.

"සීමා මුරකාරයෝ නැද්ද?" බෙකන්ඩොර්ෆ් මිමිණුවා. "හරිම අමුතුයි."

"අධිමාන්නේ," මම අනුමාන කළා. ඒත් මටත් නොසන්සුන්කමක් දැනුණා. ඇනබෙත් කියන්නේ අති දක්ෂ උපාය සැලසුම්කාරියක්. එයාගේ පිළ අපේ පිළට වඩා ගණනින් වැඩි වුණත්, එයා ආරක්ෂාව ගැන නොසලකා හරියි කියලා හිතන්න අමාරුයි.

අපි සතුරු භූමියට ඇතුළු වුණා. අපේ කණ්ඩායම ආරක්ෂාව පිණිස සටන් කරමින් සිටි නිසා අපි ඉක්මන් කළ යුතු බව මම දැන සිටියා. එයාලට වැඩි වෙලාවක් ඒක කරගෙන යන්න පුළුවන්කමක් නැහැ. කොයි වෙලාවක හරි හතුරෝ ඇපලෝ ළමයින්ව ඉක්මවා යාවි. ඊතල වගේ පුංචි දේවල්වලින් ඒරීස් කැබිනය නතර කරන්න බැහැ.

අපි ඕක් ගසක් යටින් බඩගා ගියා.

"ෂූහ්!" එක පාරටම ගහේ කඳ මැදින් ගෑනු ළමයෙකුගේ මූණක් මතු වෙද්දි මම උඩ ගියා. ඊට පස්සේ එයාගේ මූණ ආපහු ගහේ පොත්ත තුළට වියැකුණා.

"රුක් දෙවඟනෝ," බෙකන්ඩොර්ෆ් මැසිවිලි කිවුවා. "කුකුළ් කේන්තිකාරියෝ."

"මම එහෙම නෑ!" ගහ ඇතුළෙන් හිරවුණ හඬක් කිවුවා.

අපි නොනැවතී ඉදිරියට ගියා. අපි ඉන්න තැන හරියටම හඳුනා ගන්න අමාරු වුණා. දොළ පාර, සමහර කඳු ප්‍රපාත සහ ගොඩක් පරණ ගස් වගේ මායිම් ලකුණු තිබුණා වුණත්, වනාන්තරය නිතර තැන් මාරු කරන ගතියක් තිබුණා. මං හිතන්නේ සොබාදහමේ බලවේග චංචල වෙලා. ඒ නිසා පාරවල් වෙනස් වුණා. ගස් තැනින් තැනට මාරු වුණා.



ඊට පස්සේ එක පාරටම අපි එළිමහන් බිමක් අද්දරට ගොස් තිබුණා. ඒ මැද වූ පස් කන්ද දැකපු හැටියේ අපි කරදරේක වැටුණු බව මම දැනගත්තා.

"හෙෆාස්ටස්ටම ඔප්පු වෙච්චාවේ," බෙකන්ඩොර්ෆ් කෙඳිරුවා. "කූඹි කන්ද."

මට ඕනෑ වුණේ ආපස්සට හැරිලා දුවන්නයි. මීට කලින් මම කූඹි කන්ද දැකලා තිබුනේ නැති වුණාට, පරණ කඳවුරුකරුවන්ගෙන් ඒ ගැන කතන්දර අහලා තිබුණා.

ඒ පස් ගොඩැල්ල ගස් මුදුන් තරමටම උස් වුණා - ඒ කියන්නේ අඩු තරමේ තට්ටු හතරක් විතර. එය වටේටම පෙනේරයක් වගේ ගුල්වලින් සිදුරු වැටී තිබුණා. ඒ ගුල්වලින් එළියටත් ඇතුළටත් යමින් සිටියේ දහස් ගාණක...

"මිර්මිකීලා," මම කෙඳිරුවා.

ඒක තමයි පෞරාණික ග්‍රීක භාෂාවෙන් 'කූඹින්' ට කියන වචනේ, ඒත් මුන් කූඹි විතරක් නෙවෙයි. හානිකර කූඹින්ව විනාශ කරන්න එන ඕනෑම කෙනෙක්ට හෘදයාබාධයක් ඇති කරවන්න මුන්ට හැකියාව තිබුණා.

මේ මිර්මිකීලා ජර්මන් ෂෙපර්ඩ් බල්ලෙක් තරම් ලොකු වුණා. උන්ගේ ආරක්ෂක වැසුම් ලේ රතු පාටින් දිලිසුණා. උන්ට පබළු ඇට වගේ දිලිසෙන කළු ඇස් සහ තියුණු යටි හනු තිබුණා.

උන්ගෙන් සමහරු ගස් අතු රැගෙන යමින් සිටියා. තවත් එවුන් ඔසවාගෙන ගිය අමු මස් කුට්ටි මොනවද කියලා නම් දැනගන්න මට කොහෙත්ම ඕනෑ වුනේ නැහැ. වැඩි දෙනෙක් අරන් යමින් සිටියේ ලෝහ කැබලියි - පරණ සන්නාහ, කඩු, වගේම භෝජන මණ්ඩපයේ සිට එළියට එන්න කොහොමදෝ පාර හොයාගෙන තිබුණ කෑම බත්දේසිත් ඒ අතර තිබුණා. එක කූඹියෙක් ස්පෝර්ට්ස් කාරයක දිලිසෙන කළු වැස්මක් ඇදගෙන යමින් සිටියා.

"උන් දිලිසෙන ලෝහවලට ආසයි," බෙකන්ඩොර්ෆ් මිමිණුවා. "විශේෂයෙන් ම රත්තරන්වලට. උන්ගේ ගුල අස්සේ ෆෝර්ට් නොක්ස්වල (ඇමරිකානු භාණ්ඩාගාරයට අයත් රන් ගබඩා කර ඇති

හමුදා මූලස්ථානයක්.) තියෙනවටත් වඩා රත්තරන් තියෙනවලු." එයා කතා කළේ ඉරිසියාවෙන් වගෙයි.

"ඒවා ගැන හිතන්නවත් එපා," මම කිවුවා.

"නෑ, බං," එයා පොරොන්දු වුණා. "අපි මෙතැනින් අහකට ගිහිල්ලා..."

එයාගේ ඇස් පළල් වුණා.

යාර පහළොවකට එහායින්, කුඹියෝ දෙන්නෙක් ලොකු ලෝහ කුට්ටියක් ගුලට ඇදගෙන යන්න දඟලමින් සිටියා. ශීතකරණයක් විතර විශාල, දිලිසෙන රන් හා ලෝකඩවලින් සෑදූවක් වූ එහි දෙපස අමුතු නෙරුම් සහ ගැටිතිත්, යට පැත්තෙන් එළියට පැන්න වයර් පොකුරකුත් තිබුණා.

ඒ වෙලාවේ කුඹියෝ ඒක අනෙක් පැත්ත හරවද්දි, මට එහි මුහුණ දකින්න ලැබුණා.

මට පුදුමයෙන් කෑගැස්සුණා. "ඒක-"

"ෂ්ෂ්ෂ්!" බෙකන්ඩොර්ෆ් මාව ආපසු පඳුර යටට ඇදලා ගත්තා.

"ඒත් ඒක-"

"මකර ඔළුවක්," එයා කිවුවේ විස්මයෙන්. "ඔව්. මටත් ඒක පේනවා."

ඒ හොම්බ මං තරමට ම දිග ඇති. පළලට ඇරී තිබුණු එහි කට තුළින් මෝරෙකුගේ වගේ ලෝහ දත් පෙනුණා. රන් සහ ලෝකඩ කොරපොතු ඒකාබද්ධ කර එහි හම සාදා තිබුණා. ඒ වගේම ඌගේ ඇස්වලට සවි කර තිබුණු රතු කැට මගේ මිට මෙළවූ අතක් තරම් ලොකුයි.

ඒ ඔළුව කඳෙන් කපාගෙන වගෙයි පෙනුණේ - කුඹි හනුවලින් හපා වෙන්කරගෙන. එහි වයර් අග ගෙවී ගොස්, පැටලී තිබුණා.

ඒ මකර ඔළුව සෑහෙන බර වෙන්න ඇති, මොකද එය ගෙනයන්න දඟලමින් සිටි කුඹින්ගේ එක ඇදිමක දි එය ඉස්සරහට ඇදුණේ අඟල් දෙක තුනක් විතරයි.



"උන් ඒක කඳුදට අරන් ගියොත්," බෙකන්ඩොර්ෆ් කිවුවා. "අනිත් කුඹි ටිකත් උන්ට උදවු කරයි. අපිට උන්ව නතර කරන්න වෙනවා."

"මොකක්?" මම ඇසුවා. "ඒ මොකටද?"

"ඒක හෙෆාස්ටස්ගෙන් නිමිත්තක්. ඉක්මන් කරන්න!"

එයා මොනවා කියවනවා ද කියලා මට තේරුණේ නැතත්, බෙකන්ඩොර්ෆ් මේ තරම් අධිෂ්ඨානශීලීව ඉන්නවා ඊට කලින් මම දැකලා තිබුනේ නැහැ. එයා එළිමහන් බිම අද්දර දිගේ ඉදිරියට දුවද්දි, එයාගේ සන්නාහය ගස්වලට මුසු වුණා.

මම එයා පසුපස යන්න ලෑස්ති වෙනකොට ම මගේ බෙල්ලට මොකක්දෝ සීතල සහ තියුණු දෙයක් තද වෙනවා දැනුණා.

"අල්ලගත්තා," හරියටම මට එහා පැත්තේ සිට ඇනබෙත් කිවුවා.

එයා ඉන්න ඇත්තේ එයාගේ මායා යැන්කීස් කැප් එක දමාගෙනයි, මොකද එයාව මුළුමනින්ම අදෘශ්‍යමාන වුණා.

මම හෙලවෙන්න උත්සහ කරද්දි, එයා කිණිස්ස මගේ නිකට යටට තද කළා. කඩුවක් අතින් ගෙන සිලේනා බියුරිගාඩ් කැලෑවෙන් මතු වුණා. එයාගේ ඇෆ්‍රෝඩයිට් සන්නාහය එයා ඇඳ සිටි ඇඳුම්වල සහ මේක්-අප්වල පාටට ගැළපෙන්න රෝස සහ රතු පාට වුනා. එයාව පෙනුණේ ගරිල්ලා බාර්බි බෝනික්කෙක් වගෙයි.

"නියම වැඩේ," එයා ඇනබෙත්ට කිවුවා.

අදෘශ්‍යමාන අතක් මගේ කඩුව උදුරා ගත්තා. කැප් එක ගැලවූ ඇනබෙත් මගේ ඉස්සරහින් මතු වුණේ තෘප්තිමත් හිනාවක් සමගයි.

"කොල්ලන්ව පස්සෙන් ඇවිත් අල්ලගන්න එක ලේසි වැඩක්. එයාලා මද කිපිච්ච මිනටෝර් කෙනෙක්ටත් වඩා සද්ද කරනවා."

මගේ කම්මුල් රත් වෙනවා දැනුණා. මම ආපස්සට හිතන්න උත්සහ කළේ, මගේ කටින් මොකක් හරි නොහොබිනා දෙයක් කියවුණා ද කියලා මතක් කරගන්නයි. ඇනබෙතුයි සිලේනායි කොයි තරම් වෙලාවක් අපි කියපු දේවල් හොරෙන් අහගෙන හිටිය ද දන්නෙ නැහැ නේ.

Scanned by TapScanner

"ඔයා අපේ හිරකාරයෙක්," ඇනබෙත් දනුම් දුන්නා. "අපි බෙකන්ඩොර්ෆ්වත් අල්ලගෙන-"

"බෙකන්ඩොර්ෆ්!" එක තත්පරේකින් පංගුවකට, මට එයාව සහමුලින්ම අමතක වෙලයි තිබුණේ. ඒත් එයා තවමත් නොනැවතී ඉදිරියට යමින් සිටියා - කෙලින්ම මකර ඔළුව වෙතට. එයා දැනටමත් යාර දොළහක් විතර ඈතට ගොස් තිබුණා. ගැහැනු ළමයි දෙන්නා ගැනවත්, මම එයාගේ පස්සෙන් නොඑන බවවත් තවමත් එයාගේ සැලකිල්ලට හසු වෙලා නැහැ.

"මෙහෙ එන්න!" මම ඇනබෙත්ට කිවුවා.

එයා මාව ආපස්සට ඇදලා ගත්තා. "ඔයා කොහේ යනවා කියල ද හිතන්නේ, හිරකාරයෝ?"

"බලන්න!"

එළිමහන් බිමට එබිකම් කළ එයාට, අපි ඉන්නේ කොතැන ද කියලා පළවෙනි වතාවට තේරුණ ගියා වගෙයි. "ඕහ්, සියුස්..."

විවෘත බිමට පැන්න බෙකන්ඩොර්ෆ් එක කූඹියෙකුට පහර දුන්නා. සතාගේ උඩු කබලේ වැදුණු එයාගේ කඩුව *ක්ලෑංග්!* හඬක් නැගුවා. ඩැහි අඬු එකට වද්දමින් කූඹියා ආපසු හැරුණා. මම එයාට අනතුරු අඟවන්නත් කලින්, කූඹියා බෙකන්ඩොර්ෆ්ගේ කකුල හැපුවා. එයා බිමට ඇද වැටුණා, අනෙක් කූඹියා එයාගේ මුහුණට ස්‍රාවයක් විදිද්දි. බෙකන්ඩොර්ෆ් මරහඬ දුන්නා. කඩුව බිම දැමූ එයා වියරුවෙන් ඇස්වලට ගසාගත්තා.

මම ඉස්සරහට දුවන්න ගියත්, ඇනබෙත් මාව ආපසු ඇදලා ගත්තා. "එපා."

"චාර්ලි!" සිලේනා මොර දුන්නා.

"එපා!" ඇනබෙත් කට යටින් පිම්බා. "දැනටමත් පරක්කු වැඩියි!"

"ඔයා මොනවද මේ කියවන්නේ?" මම තදින් ඇසුවා. "අපි ගිහිල්ලා-"

ඒ වෙලාවේ බෙකන්ඩොර්ෆ් වෙතට තවත් කූඹි ගොඩක් ඇදී එන බව මට දකින්න ලැබුණා - දහයක්, විස්සක්. එයාගේ



සන්නාහයෙන් අල්ලාගත් උන් එයාව වේගයෙන් කන්ද වෙතට ඇදගෙන ගියා. එයාව ගුලක් තුළින් නොපෙනී ගියා.

"නෑ!" සිලේනා ඇනබෙත්ව තල්ලු කරා. "උන්ට චාර්ලිව අරන් යන්න ඔයා ඉඩ දුන්නා!"

"රණ්ඩු වෙවී ඉන්න වෙලාවක් නෑ," ඇනබෙත් කිවුවා. " ඉක්මන් කරන්න!"

මම හිතුවේ එයා අපිව බෙකන්ඩොර්ෆ්ව බේරාගැනීමේ ප්‍රහාරයකට කැඳවාගෙන යන්න හදනවා කියලයි. ඒත් ඒ වෙනුවට එයා කළේ මොහොතකට කූඹින්ට අමතක වී තිබුණු මකර ඔළුව ළඟට දුවගෙන යාමයි. එහි වයර්වලින් අල්ලාගත් එයා ඒක කැලේ දිහාවට ඇදගෙන එන්න පටන් ගත්තා.

"ඔයා මොනවද කරන්නේ?" මම ප්‍රශ්න කළා. " බෙකන්ඩොර්ෆ්-"

"මට උදවු කරන්න," ඇනබෙත් ගෙරෙව්වා. "ඉක්මනට, උන් ආපහු එන්න කලින්."

"ඔහ්, මගෙ දෙයියනේ!" සිලේනා කිවුවා. "ඔයාට චාර්ලිට වඩා මේ යකඩ ගොඩක් ලොකු වුණා ද?"

වේගයෙන් අනෙක් පැත්තට හැරුණු ඇනබෙත් එයාගේ උරහිස්වලින් අල්ලා සෙලෙව්වා. "අහන්න, සිලේනා! අරුන් තමයි මිර්මිකීලා. උන් හරියට කඩි කූඹියෝ වගෙයි, හැබැයි ඊට වඩා සිය ගුණයක් දරුණුයි. උන්ගේ හපාකෑම් විෂයි. උන් ඇසිඩ් විදිනවා. උන් අනිත් හැම කූඹියෙකුටම පණිවුඩ පතුරවලා, උන්ට තර්ජනයක් වෙන ඕනෑම දෙයක් වට කරනවා. අපි බෙකන්ඩොර්ෆ්ට උදවු කරන්න හිතාගෙන කලබලෙන් ඇතුළට දිවුවොත්, උන් අපිවත් අල්ලගනියි. එයාව එළියට ගන්න අපිට උදවු ඕනෑ වෙනවා - ගොඩාක් උදවු ඕනෑ වෙනවා. දැන්, මේ වයර්වලින් අල්ලගෙන අදින්න!"

ඇනබෙත් කරන්න හදන දේ ගැන දැන නොසිටියත්, මේ වගේ දෙයක් කරන්න එයාට හොඳ හේතුවක් ඇති කියලා තේරුම් ගන්න තරම් මම එයා සමග වික්‍රමාන්විතවලට ගිහින් තිබුණා.

අපි තුන්දෙනා ලෝහමය මකර ඔළුව කැලෑව තුළට ඇදගෙන ගියා. අපි එළිමහන් බිමෙන් යාර පනහක් විතර දුරට යන තුරුම ඇනබෙත් අපිට නවතින්න ඉඩ දුන්නේ නැහැ.

ඊට පස්සේ අපි දාඩිය පෙරාගෙන හති දමමින් බිමට ඇද වැටුණා.

සිලේනා අඬන්න පටන් ගත්තා. "එයා දැනටමත් මැරිලා ද දන්නෑ."

"නෑ," ඇනබෙත් කිවුවා. "උන් දැන්ම එයාව මරන්නේ නැහැ. අපිට පැය බාගයක් විතර තියෙනවා."

"ඔයා කොහොමද ඒක දන්නේ?" මම ඇහුවා.

"මම මිර්මිකීලා ගැන කියවලා තියෙනවා. උන් උන්ගේ ගොදුරු අඩපණ කරනවා. එතකොට උන්ට ඒවා මෙලෙක් කරලා-"

සිලේනා ඉකි ගැහුවා. "අපි එයාව බේරගන්න ඕනෑ!"

"සිලේනා," ඇනබෙත් කිවුවා. "අපි එයාව බේරගන්නයි යන්නේ, ඒත් ඔයා තේරුම් ගන්න ඕනෑ. ඒක කරන්න විදිහක් තියෙනවා."

"අතීත් කඳවුරුකාරයින්ට අඬගහන්න," මම කිවුවා. " නැත්නම් කයිරොන්ට. කරන්න ඕනෑ මොනවාද කියලා කයිරොන් දන්නවා ඇති."

ඇනබෙත් ඔළුව හෙල්ලුවා. "එයාලා මුළු කැලේ පුරාම විසිරිලා ඉන්නේ. ඒ හැම කෙනාවම මෙතැනට එකතු කරගන්න වෙලාව වෙද්දි, අපි පරක්කු වැඩි වෙයි. ඇරත්, කුඹි කන්දට පහර දෙන්න මුළු කඳවුරේ ම ශක්තිය මදිවෙයි."

"එහෙනම් මොකද කරන්නේ?"

ඇනබෙත් මකර ඔළුව පෙන්නුවා.

"හරි," මම කිවුවා. "ඔයා තඩි ලෝකඩ රූකඩේකින් කුඹින්ව බය කරන්න යන්නේ?"

"ඒක ස්වයංක්‍රීය යන්ත්‍රයක්," එයා කිවුවා.



ඒක අහලා මට සහනයක් දැනුනේ නම් නැහැ. ස්යංක්‍රීය යන්ත්‍ර කියලා කියන්නේ හෙෆාස්ටස් විසින් හදපු මායා ලෝකඩ රොබෝලාට. ඒවාගෙන් වැඩි හරියක් පිස්සුවෙන් මිනී මරන යන්ත්‍ර. ඒ වගේම ටිකක් හරි හොඳත් ඒවායි.

"ඉතින් මොකද?" මම ඇහුවා. "ඒක ඔළුවක් විතරයි. ඒක කැඩිලා."

"පර්සි, මේක නිකං ම රොබෝ යන්ත්‍රයක් නෙවෙයි," ඇනබෙත් කිවුවා. "මේ තමයි ලෝකඩ මකරා. ඔයාට ඒ ගැන කතන්දර අහන්න ලැබිලා නැද්ද?"

මම එයා දිහා හිස් බැල්මෙන් බලා සිටියා. ඇනබෙත් මට වඩා කාලයක් කඳවුරේ හිටපු කෙනෙක්. මට හිතෙන හැටියට මම අහලා නැති කතන්දර ටොන් ගාණක් එයා දැනගෙන හිටියා.

සිලේනාගේ ඇස් ලොකු වුණා. "ඔයා කියන්නේ පරණ ආරක්ෂකයා? ඒත් ඒක නිකංම කතන්දරයක් විතරයි නේ!"

"හෝව් හෝව්," මම කිවුවා. "මොන පරණ ආරක්ෂකයා ද?"

ඇනබෙත් ගැඹුරු හුස්මක් ගත්තා. "පර්සි, තාලියාගේ ගහට කලින් කාලේ - ඒ කියන්නේ රාක්ෂයින්ගෙන් කඳවුර ආරක්ෂා කරන මායා බැම්ම ඇතිවෙන්න කලින් - කඳවුර ආරක්ෂා කරගන්න උපදේශකයෝ එක එක ක්‍රම අත්හදා බැලුවලු. ඒවාගෙන් වඩාත් ප්‍රසිද්ධ එක තමයි ලෝකඩ මකරා. හෙෆාස්ටස් කැබින් එකේ අය ඒක හැදුවේ එයාලගේ තාත්තගේ ආශිර්වාදයෙන්. කියන විදිහට, ඒක ගොඩක් බිහිසුණු වගේම බලගතු එකක්. ඒක අවුරුදු දහයකටත් වැඩි කාලයක් කඳවුර ආරක්ෂා කරාලු. ඊට පස්සේ... අවුරුදු පහළොවකට විතර කලින්, ඒක කැලෑව ඇතුළට අතුරුදහන් වුණාලු."

"එතකොට ඔයා හිතන්නේ මේ ඒකගේ ඔළුව කියලා ද?"

"එහෙම වෙන්න ඕනෑ! මිර්මිකීලා වටින ලෝහ හොයාගෙන යද්දි මේක හාරලා ගන්නැති. උන්ට සම්පූර්ණ එකම අරන් යන්න බැරි නිසා, උන් ඔළුව විතරක් ගලවගෙන එන්නැති. මේකෙ කඳ කොටස වැඩි ඈතක වෙන්න බැහැ."

"ඒත් උන් මේක හපලා දෙකඩ කරලා නේ. ඒකෙන් දැන් වැඩක් නැහැ."

"එහෙම නොවෙන්නත් පුළුවන්." ඇනබෙත්ගේ ඇස් පටු වෙනවා දකිද්දි, එයාගේ මොළය අතිකාල වැඩ කරනවා කියලා මට තේරුණා. "අපිට ඒක ආපහු එකලස් කරන්න පුළුවනි. අපිට ඒක පණ ගන්වන්න පුළුවන් වුණොත්-"

"ඒක අපිට චාර්ලිව බේරගන්න උදවු කරයි!" සිලේනා කිව්වා.

"ඔහොම ඉන්න," මම කිව්වා. "මෙතැන 'වුණොත්' කතන්දර වැඩියි නේ. අපිට ඒක හොයාගන්න පුළුවන් 'වුණොත්', අපිට වෙලාවට ඒක පණගන්වන්න පුළුවන් 'වුණොත්', ඌ අපිට උදවු කරන්න කැමති 'වුණොත්'. මූ කැලේ අස්සට අතුරුදහන් වුණේ අවුරුදු පහළොවකට කලින් කියලා නේද ඔයා කිව්වේ?"

ඇනබෙත් ඔළුව වැනුවා. "සමහරු කියනවා ඌගේ මෝටරය ගෙව්ලා ගිය නිසා ඌ කැලෑව ඇතුළට ගිහින් නිෂ්ක්‍රීය වුණා කියලා. එහෙම නැත්නම් ඌගේ ප්‍රෝග්‍රෑම් එක අවුල් වෙලා කියලා. කවුරුවත් හරියටම දන්නෙ නැහැ."

"ඔයාට ඕනෑ ප්‍රෝග්‍රෑම් එක අවුල් වෙච්ච ලෝකඩ මකරෙක්ව එකලස් කරන්න ද?"

"අපිට ඒක කරලා බලන්න වෙනවා!" ඇනබෙත් කිව්වා. "බෙකන්ඩොර්ෆ් ගැන බලාපොරොත්තු තියන්න පුළුවන් එකම දේ ඒක විතරයි! ඇරත්, මේක හෙෆාස්ටස් එවපු නිමිත්තක් වෙන්නත් පුළුවන්. මකරාට හෙෆාස්ටස්ගේ දරුවන්ගෙන් කෙනෙක්ට උදවු කරන්න ඕනෑ ඇති. අපි ඒක උත්සහ කරනවා දකින්න බෙකන්ඩොර්ෆ් කැමති වෙයි."

මම නම් ඒ අදහසට කැමති වුනේ නැහැ. ඒත් අනෙක් අතට, ඊට වඩා හොඳ යෝජනාවක් මගේ ළඟ තිබුනෙත් නැහැ. අපේ කාලය ඉක්මවා යමින් තිබුණා, ඒ වගේම සිලේනා හිටියෙත් අපි ඉක්මනින්ම මොනවා හරි නොකළොත් සිහිය නැති වෙයි වගෙයි.

හෙෆාස්ටස්ගෙන් ආව නිමිත්තක් ගැන කතාවක් බෙකන්ඩොර්ෆ්ත් කිව්වා. සමහරවිට මේ ඒ කතාවේ හරි වැරැද්ද හොයාගන්න වෙලාව වෙන්න ඇති.

"හරි එහෙනම්," මම කිව්වා. "අපි මේ ඔළුව නැති මකරාව හොයාගමු."



***

අපි කල්පයක් විතර කාලයක් සොයමින් ගියා, එහෙමත් නැත්නම් සමහරවිට අපිට දැනෙන්න ඇත්තේ එහෙමයි, මොකද ඒ මුළු කාලය පුරාවටම, කුඹි කන්ද ඇතුළේ අප්‍රාණිකව, බයෙන් කෑම්යෝ රැළක් එයා වටේ දුවමින් ඉන්න හැටිත්, එයාගේ මස් මෙළෙක් වෙන තුරු ගනිමිනුයි හිටියේ. (see note) බෙකන්ඩොර්ෆ් ඉන්න හැටිත් මම හිතේ මවා

කුඹි ගිය මග දිගේ යන්න ඒ හැටි අමාරු වුනේ නැහැ. උන් කැලේ මැදින් මකර ඔළුව ඇදගෙන ආව පාර මඩේ ගැඹුරට හැරී තිබුණා. අපි ඒ පාර දිගේම අනෙක් පැත්තට මකර ඔළුව ආපසු ඇදගෙන ගියා.

අපි යාර පන්සීයක් විතර ගියා ම - ඒ අතරේ මම වෙලාව ගැන වද වෙමිනුයි හිටියේ - ඇනබෙත් කතා කළා, "ඩි ඉමෝර්ටේල්ස්."

අපි ආවාටයක ගැටිය අද්දරට ඇවිත් තිබුණා - ඒක හරියට කැලෑවේ බිම මොකක් හරි පුපුරා ගිහින් වගේ හැරුණු ගෙයක් විතර ලොකු වළක්. ලිස්සනසුලු වූ එහි බෑවුම් ගස් මුල්වලින් තිත් වැටී තිබුණා.

කුඹි පාරවල් පස් අතර විශාල ලෝහ ගොඩක් දිලිසෙමින් තිබුණු ආවාටය පතුලට ම ඇදී ගොස් තිබුණා. එහි එක කෙළවරක ලෝකඩ කොටයෙන් පිටතට වයර් පැනලා තිබුණා.

"මකරාගේ බෙල්ල," මම කිව්වා. "ඔයා හිතන්නේ මේ ආවාටය හාරන්න ඇත්තේ කුඹි කියලා ද?"

ඇනබෙත් ඔළුව හෙල්ලුවා. "මේක ඊට වඩා උල්කාපාතයක් වැටිලා වුණ එකක් වගේ..."

"හෙෆාස්ටස්," සිලේනා කිව්වා. "මේක එළිදරවු කරන්න ඇත්තේ දෙවියෝ තමයි. අපි මකරාව හොයාගන්නවා දකින්න හෙෆාස්ටස්ට ඕනෑ වෙලා. එයාට ඕනෑ වෙන්න ඇත්තේ චාර්ලි..." එයාගේ වචන හිරවුණා.

"මෙහෙ එන්න," මම කිව්වා. "අපි මේ නරක කොල්ලව ආපහු අමුණමු."

***

මකර ඔළුව ආවාටය පතුලට ගෙනියන එක නම් ලේසි වැඩක් වුණා. බැවුම දිගේ පෙරළී ගිය එය ලොකු, ලෝහමය බොන්ක් / හඬක් නගමින් මකර කඳේ හැප්පුණා.

අමාරු වැඩේ වුණේ එය නැවත සවිකරන එකයි.

ඒකට අපිට කිසිම මෙවලමක් හෝ කිසිම අද්දැකීමක් තිබුනේ නැහැ.

ඇනබෙත් වයර් එහෙ මෙහෙ කර බලා පෞරාණික ග්‍රීකවලින් ශාප කළා. "අපිට බෙකන්ඩොර්ෆ්ව ඕනෑ. එයාට නම් තප්පර ගාණකින් මේක කරන්න පුළුවන් වෙයි."

"ඉතින් ඔයාගේ අම්මා නේද නව නිමැවුම්කරුවන්ගේ දෙවඟන?" මම ඇසුවා.

ඇනබෙත් මට රැව්වා. "ඔව්, ඒත් මේක ඊට වඩා වෙනස්. මම දක්ෂ අදහස්වලට. යාන්ත්‍රික දේවල්වලට නෙවෙයි."

"මගේ ඔළුව ආපහු අමුණගන්න මට මේ ලෝකෙන් කෙනෙක්ව තෝරගන්න ලැබුනොත්," මම කිවුවා. "මම තෝරග න්නේ ඔයාව."

මම ඒක කටට ආවට කියලා දැම්මේ එයාගේ ආත්ම විශ්වාසය වැඩි කරන්නයි. ඒත් ඒක කොච්චර මෝඩ කතාවක් ද කියලා මට ඉක්මනින් ම තේරුම් ගියා.

"ආව්ව්..." සිලේනා නහය ඉහළට අදිමින් දෑස් පිස දැමුවා. "පර්සි, ඒක නම් හරිම ස්වීට්!"

ඇනබෙත්ගේ මූණ රතු වුණා. "කට වහගන්න, සිලේනා. මට ඔයාගේ කිණිස්ස දෙන්න."

ඒක ඉල්ලගෙන ඇනබෙත් මට අනින්න යනවා වත් ද හිතලා මම බයවුණා. ඒත් ඒ වෙනුවට එයා ඒක මකරාගේ බෙල්ල විවෘත කරන්න ඉස්කුරුප්පු නියනක් ලෙස පාවිච්චි කළා. "අපි බලමු," එයා කිවුවා.

ඊට පස්සේ එයා දිව්‍යමය ලෝකඩ වයර් එකට පුරුද්දන්න පටන් ගත්තා.



***

ඒකට සැහෙන වෙලාවක් ගියා. හිතුවටත් වැඩි වෙලාවක්.

මේ වෙද්දි කොඩිය ඇල්ලීමේ තරඟය ඉවර වෙලත් ඇති කියලා මම හිතුවා. අනෙක් කඳවුරුකරුවන්ට අපි නැති බව තේරුම් ගිහින්, අපිව හොයාගෙන එන්න කොච්චර වෙලාවක් යයි ද කියලා මම පුදුමයෙන් හිතුවා. ඇනබෙත්ගේ ගණනය කිරීම් හරි නම් (ඇත්තටම ඒවා හැම වෙලාවෙම හරි තමයි), කුඹී කන්න කලින් බෙකන්ඩොර්ෆ්ට තිබුණේ තව විනාඩි පහක් දහයක් විතරයි.

අන්තිමේ දි ඇනබෙත් උන් තැනින් නැගිටලා හුස්මක් හෙළුවා. එයාගේ දෑත් හීරිලා, මඩ වැකිලා තිබුණා. එයාගේ නියපොතු කැඩී ගිහින්. මකරාගෙන් වැගුණු ග්‍රීස් කෙළ පාරක් නිසා එයාගේ නළල හරහා දුඹුරු පාට වයිරමක් වැටී තිබුණා.

"ඔක්කොම හරි," එයා කිවුවා. "වැඩේ ඉවරයි, මං හිතන්නේ..."

"ඔයා හිතන්නේ?" සිලේනා ඇසුවා.

"ඒක ඉවර වෙලා තියෙන්න ඕනෑ," මම කිවුවා. "අපිට වෙලාව නැහැ. දැන් කොහොමද මේක, අහ්, ස්ටාර්ට් කරන්නේ? මේකේ කොහේ හරි ස්විච් එකක් එහෙම තියෙනවා ද?"

ඇනබෙත් ඌගේ රතු කැට ඇස්වලට අත දිගු කර පෙන්නුවා. "ඒවා කැරකෙන්නේ ඔරලෝසුවේ කටු යන අතට. මං හිතන්නේ අපි ඒවා කැරකුවොත් හරි."

"කවුරු හරි මගේ ඇස් බෝල දෙක කැරකුවොත්, මමත් ඇහැරෙනවා තමයි," මම එකඟ වුණා. "බැරි වෙලාවත් ඌ පිස්සුවෙන් අපි දිහාවට හැරුනොත්?"

"එහෙනම්.... අපි මළා තමයි," ඇනබෙත් කිවුවා.

"මරේ මරු," මම කිවුවා. "ආසාවේ බැහැ."

අපි එකතු වෙලා මකරාගේ රතු කැට ඇස් කැරකුවා. එසැණින් ම ඒවා දිප්තිමත් වෙන්න පටන් ගත්තා. ඇනබෙත් සහ මම කොයි තරම් වේගයෙන් පස්සට පැන්නා ද කියනවා නම්, අපි දෙන්නා එකා පිට එකා වැටුණා.

මකරා කට ඇරියේ, හනු වැඩ කරනවා ද බලන්න වගෙයි. ඌ ඔළුව හරවලා අපි දිහා බැලුවා. ඌගේ කන්වලින් දුම් දමද්දි ඌ නැගිටින්න උත්සහ කළා. ඒත් තමන්ට හෙලවෙන්න බැරි බව හොයාගත්තට පස්සේ මකරා අන්ද මන්ද වුණා වගෙයි. ඌ බෙල්ල ඇල කරලා පස් දිහා සැලකිල්ලෙන් බැලුවා. අන්තිමේ දී, ඌ වැළලී ඉන්න බව ඌටම තේරුම් ගියා. ඌගේ බෙල්ල එක වරක් තදින් ඇදුණා, තවත් වරක්... ඒත් එක්කම ආවාටය මැද වේගයෙන් පුපුරා ගියා.

තුහුරු ලෙස පොළොවෙන් පිටට ඇදුණු මකරා, බල්ලෙක් ඇඟ ගසනවා වගේ ඇගේ වූ මඩ ගසා දැමුවේ අපිව හිසේ සිට දෙපතුල්වලට ම මඩ නාවමින්.

මේ රොබෝ යන්ත්‍රයේ අපූර්වත්වය දැකලා, අපිට කතා කරගන්නවත් බැරි වුණා. මං කිවුවේ, ඇත්තටම ඒක කාර් වොෂ් එකකට යවලා ගන්න ඕනෑ තමයි, ඒ වගේම එහෙන් මෙහෙන් වයර් කෑලි ටිකකුත් එළියට පැනලා තිබුණා තමයි. ඒත් මකරාගේ සිරුර පුදුමාකාර ලෙස සාදා තිබුණා - ඒක හරියට කකුල් සහිත, අධි තාක්ෂණික යුධ ටැංකියක් වගෙයි. ඌගේ කඳ දෙපස වැසී තිබුණේ මැණික් ගල් වැද්දූ ලෝකඩ සහ රන් කොරපොතුවලින්. ගස් කොටන් තරම් විශාල වූ ඌගේ පාදවල වානේ නිය පහුරු තිබුණා. ඌට පියාපත් තිබුනේ නැහැ - බොහෝමයක් ග්‍රීක මකරුන්ට පියාපත් නැහැ - ඒ වුණත් ඌගේ වලිගය ඌගේ කඳ තරමට ම, ඒ කියන්නේ පාසල් බසයක් තරමට ම දිගයි. ඌ කිරිකිරි හඬ ගාන බෙල්ල ඉහළට හරවා, අහස දෙසට ජයග්‍රාහී ලෙස ගිනි කඳක් පිම්බා.

"හොඳයි..." මම කිවුවේ හීන් හඬින්. "ඒක තවමත් වැඩ."

අවාසනාවට, ඌට මාව ඇහුණා. අර රතු කැට ඇස් මගේ පැත්තට කැරකී, ඌගේ හොම්බ මගේ මූණට අඟල් දෙක තුනක් ඈතින් නැවතුණා.

මම නොසිතාම කඩුවට අත යැවූවා.

"මකරා, නවතිනවා!" සිලේනා මොර දුන්නා. එයාගේ කටහඬ තවම වැඩ කරනවා ඇහෙද්දි මට පුදුම හිතුණා. එයා කතා කළ ආඥාදායක හඬට ස්වයංක්‍රීය යන්ත්‍රයේ අවධානයත් එයා වෙතට හැරුණා.



සිලේනා බයෙන් වගේ තදින් කෙළ ගිල්ලා. "අපි ඔයාව ඇහැරෙව්වේ කඳවුර ආරක්ෂා කරන්න. ඔයාට මතක ද? ඒක තමයි ඔයාගේ රස්සාව!"

මකරා ඔළුව පැත්තකට ඇල කරගත්තේ කල්පනා කරන්න වගෙයි.

මකරාගේ ගිනි කඳක් මැද පුපුරා යන්න සිලේනාට පනහට-පනහේ අවස්ථාවක් තියෙන බව මට තේරුම් ගියා. ඊට කලින් සතාගේ බෙල්ල උඩට පැනලා, ඌගේ අවධානය වෙනතකට යොමු කරන්න මම කල්පනා කරද්දි ම, සිලේනා කතා කළා, "චාර්ල්ස් බෙකන්ඩොර්ෆ්, හෙෆාස්ටස්ගේ පුතෙක්, කරදරේක වැටිලා. මිර්මිකීලා එයාව අල්ලගෙන. එයාට ඔයාගේ උදවු ඕනෑ."

හෙෆාස්ටස් කියන නම ඇහෙනකොට ම මකරාගේ බෙල්ල කෙලින් වුණා. ඌගේ ලෝහමය ඇඟ කිළිපොලා ගියේ, තවත් පස් පිඩැලි වැස්සකින් අපිව නාවමින්.

මකරා වටේම බැලුවේ හතුරෙක්ව හොයාගන්න උත්සහ කරනවා වගෙයි.

"අපිට ඌට පෙන්නලා දෙන්න වෙනවා," ඇනබෙත් කිවුවා. "මෙහෙට එන්න, මකරෝ! හෙෆාස්ටස්ගේ පුතා මේ පැත්තේ! අපේ පස්සෙන් එන්න!"

එහෙම කියපු එයා කඩුව ඇදලා ගත්තා, ඊට පස්සේ අපි තුන්දෙනා ආවාටයෙන් පිටට නැග්ගා.

"හෙෆාස්ටස් වෙනුවෙන්!" ඇනබෙත් මොර දුන්නා. අපි කැලෑව හරහා දුවන්න පටන් ගත්තා. මම ආපසු හැරී බලද්දි, මකරා අපේ පස්සෙන්ම එන බව දකින්න ලැබුණා. ඌගේ රතු ඇස් දිලිසෙමින්, ඌගේ නාස් පුඩුවලින් දුම් දමමින් තිබුණා.

ඇති වීරියෙන් කුඹී කන්ද බලා දුවන්න එක හොඳ දිරි ගැන්වීමක් වුණා.

***

අපි එළිමහන් බිමට ළඟා වුණාම, මකරාට බෙකන්ඩොර්ෆ්ගේ ඉව දැනිලා වගෙයි පෙනුණේ. ඌ අපිව පසු කරගෙන ඉදිරියට දුවද්දි,

වජ්ප නොවී ඉන්න ඌගේ පාරෙන් අහකට පනින්න අපිට සිද්ධ වුණා. ඌ ගස් අතරින් කඩාගෙන බිඳගෙන දුවද්දි, ඌගේ කකුල් වැදි පොළොවේ වළවල් හැරුණා.

ඌ එක එල්ලේම දිවුවේ කුඹි කන්දටයි. මුලින්ම, සිදු වෙන්නේ මොනවාද කියලා මිර්මිකීලා දන සිටියේ නැහැ. උන් කීපදෙනෙක් මත පා තැබූ මකරා, උන්ව කුරුමිණි ඔිජස ගොඩවල්වලට හැරෙව්වා. ටිකකින්, උන්ගේ අන්තර් ජාලය වැඩ කරන්න පටන් ගත් වග පෙනුණා: *ලොකු මකරෙක්. නරකයි!*

මුළු එළිමහන් බිමේම සිටි කුඹියෝ එකවිටම හැරී මකරා වටේට රොද බැඳගත්තා. තව තවත් කුඹියෝ කන්දෙන් එළියට ඇදි ආවා - උන් සිය ගාණක්. මකරා ගිනි කඳක් පිඹලා, උන් පේළියක් ම බයෙන් පසු බැස්සෙව්වා. කුඹි ගිනි ඇවිලෙන සුලුයි කියලා කවුද දන්නේ? ඒත් තව තවත් එවුන් නොනැවතී ආවා.

"ඇතුළට, දූන්!" ඇනබෙත් අපිට කිවුවා. "උන්ගේ අවධානය මකරට යොමු වෙලා තියෙන අතරේ!"

සිලේනා පෙරමුණ ගත්තා; ඇෆ්‍රොඩයිට්ගේ දරුවෙක් සටනක පෙරමුණ ගන්නවා මම දැක්කේ එදාමයි.

අපි කුඹින්ව පසුකර දිවුවත්, උන් අපිව ගණන් ගත්තේ නැහැ. මොකක්දෝ හේතුවකට, උන්ට එල්ල වුණ ලොකුම තර්ජනය මකරා කියලා උන් හිතනවා වගෙයි පෙනුණේ. අනේ මන්දා.

අපි ළඟින්ම වූ ගුළට රිංගා ගනිද්දි, එය තුළ වූ ගඳට මගේ හුස්ම හිරවෙන්න ගියා. කිසිම දෙයක්, මං කියන්නේ කිසිම කිසි දෙයක්, යෝධ කුඹි ගුළක් තරම් ගඳ ගහන්නේ නැහැ. උන් කෑම කන්න කලින් ඒවා කුණු වෙන්න තියනවා ඇති කියලා මට තේරුණා. ඇත්තටම කවුරු හරි උන්ට ශීතකරණ කියලා ජාතියක් තියෙන බව උගන්වන්න ඕනෑ.

පරණ කුඹි කවචවලින් සහ කුඹි ස්‍රාවයන්ගෙන් හැදුණ කඩිතිවලින් වැසුණු පොළොවක් ඇති, අඳුරු උමං සහ පුස් බැඳුණු කාමර තුළින් අපේ ගමන යෙදි තිබුණා. කුඹියෝ අපිව පසු කරගෙන සටනට එකතු වෙන්න දුවද්දි, අපි පැත්තකට වෙලා උන්ට යන්න ඉඩ දුන්නා. අපිට කුඹි ගුළේ තව තවත් ගැඹුරට යන්න මගේ කඩුවෙන් තුනී ලෝකඩ දිස්නය එළිය සැපයුවා.



"බලන්න!" ඇනබෙත් කිවුවා.

පැති කාමරයක් තුළට බැල්ම හෙළද්දි, මගේ පපුවට ගැහෙන්නත් අමතක වුණා.

කාමරයේ සිවිලිමෙන් පහළට එල්ලෙමින් තිබුණේ අති විශාල, සාරුමය කෝෂ ගොඩක් - මං හිතන්නේ, පිළා කෝෂ වෙන්න ඇති - ඒත් මගේ අවධානය දිනාගත්තේ ඒවා නෙවෙයි. ඒ ගුහාවේ බිම කඳු ගොඩ ගසා තිබුණේ රන් කාසි, මැණික් සහ අනෙක් ධන නිධාන ගොඩක් - හිස්වැසුම්, කඩු, සංගීත භාණ්ඩ, ආභරණ. ඒවා මායා භාණ්ඩ වගේ දිස්න දෙමින් තිබුණා.

"මේ එක කාමරයක් විතරයි," ඇනබෙත් කිවුවා. "මේක ඇතුළේ මේ වගේ නිධන්වලින් සරසපු කුඹි පැටවුන්ගේ කාමර තව සිය ගාණක් ඇති."

"ඒවගෙන් වැඩක් නෑ," සිලේනා තරයේ කියා සිටියා. "අපිට චාර්ලිව හොයාගන්න තියෙනවා!"

තවත් මුල්ම වතාවට දැකපු දෙයක්: ඇෆ්‍රෝඩයිට්ගේ දරුවෙක් ආභරණ ගැන උනන්දු නොවී ඉන්නවා.

අපි නොනැවතී ඉදිරියට ගියා. තවත් යාර හයක් ගිහින්, අපි ඇතුළු වුන ගුහාව කොයි තරම් ගඳයි ද කියනවා නම්, මගේ නහය සම්පූර්ණයෙන් ම ක්‍රියා විරහිත වුණා. පරණ කෑමවල සුන්බුන් වැලිපර තරම් උසට ගොඩ ගසා තිබුණා - ඇටකටු, කුණු වූ මස් කුට්ටි, වගේම පරණ කඳවුරු කෑමවල කොටස් පවා එතැන තිබුණා. මං හිතන්නේ කුඹියෝ කඳවුරේ කොම්පෝස්ට් ගොඩ වටළලා, අපි ඉතුරු කළ කෑම හොරකම් කරමින් ඉඳලා.

ඒ ගොඩවලින් එකක් පාමුල, නැගිටින්න දඟලමින් සිටියේ බෙකන්ඩෝර්ෆ්. එයාට තිබුණේ හරිම භයානක පෙනුමක්. ඒකට එක හේතුවක් වුණේ දැන් එයාගේ වෙස් මාරු කරන සන්නාහය කුණු ගොඩේ පාටට හැරිලා තිබුණු නිසයි.

"චාර්ලි!" එයා ළඟට දිවූ සිලේනා එයාට නැගිටින්න උදවු කරන්න උත්සහ කළා.

"දෙවිවරුන්ට ස්තුති වේවා," එයා කිවුවා. "මගේ- මගේ කකුල් පණ නැතිවෙලා!"

"ඒක ඇරිලා යයි," ඇනබෙත් කිවුවා. "ඒත් අපි ඔයාව මෙතැනින් එළියට අරන් යන්න ඕනෑ. පර්සි, එයාව අනිත් පැත්තෙන් අල්ලගන්න."

සිලේනා සහ මම එයාව දෙපසින් ඔසවා ගත්තා. ඊට පස්සේ අපි හතරදෙනා උමං හරහා ආපහු යන්න පටන් ගත්තා.

ඈතින් සිදුවෙන සටනේ හඬ මට ඇසුණා - ලෝහ එකට වදින, ගිනි පිඹින සහ කුඹී සිය ගාණක් හපා කමින් ස්‍රාවයන් විදින හඬ.

"එළියේ මොනවද වෙන්නේ?" බෙකන්ඩොර්ෆ් ඇසුවා. එයාගේ ඇඟ ආතතියෙන් ඇදුණා. "මකරා! ඔයාලා ඒකට- ආයෙමත් පණ දුන්නෙ නැතේ?"

"ඒකමයි මටත් බය," මම කිවුවා. "කරන්න තිබුණ එකම දේ ඒක විතරයි."

"ඒත් ඔයාලට නිකං ම රොබෝ කෙනෙක්ට පණ දෙන්න බැහැ! ඔයාලා ඒකේ මෝටරේ ක්‍රමාංකනය කරන්න ඕනෑ, ලෙඩක් තියෙනව ද කියලා හොයලා බලන්න ඕනෑ... නැත්නම් ඒක මොනවා කරයි ද කියන්න බැහැ! අපි මෙහෙන් එළියට යන්න ඕනෑ!"

එයා එහෙම කිවුවට, අපිට කොහේටවත් යන්න ඕනෑ වුනේ නැහැ, මොකද මකරා අපි ළඟටම ආවා.

අපි එළියට යන උමඟ මතක් කරන්න උත්සහ කරමින් ඉන්නකොට, එක්වරම මුළු කන්දම පුපුරා ගියේ අපිව පස්වලින් නාවමින්. ඊට පස්සේ බලනකොට අපිට දකින්න ලැබුණේ විවෘත අහසයි. අපිට හරියටම ඉහළින් මකරා ඉදිරියටත් පසුපසටත් පහර දෙමින්, මුළු කුඹී කන්ද ම පොඩි කර දමුවේ, ඌගේ ඇඟ පුරා දුවන මිර්මිකීලව ගසා දමන්න දඟලමිනුයි.

"ඉක්මනට එන්න!" මම මොර දුන්නා.

අපි පස් ගොඩැලි හාරගෙන, බෙකන්ඩොර්ෆ්වත් ඇදගෙන කන්දෙන් එළියට බඩගෑවා.

අපේ යාළු මකරා කරදරේක වැටිලා හිටියා. මිර්මිකීලා ඌගේ ආරක්ෂක වැස්මේ සන්ධි හපා කමින්, ඇසිඩ් ස්‍රාවයෙන් ඌව නැවුවා.



මකරා පාගා පොඩි කරමින්, හපා කමින් ගිනි පිඹමින්, ඌට තව වැඩි වෙලාවක් අල්ලගෙන යන්න හැකියාවක් තිබුනේ නැහැ. ඌගේ ලෝකඩ හමෙන් දුම් දමමින් තිබුණා.

තත්ත්වය තවත් නරක අතට හැරුණේ, කුඹී කීපදෙනෙක් අපේ පැත්තට හැරුණාමයි. මං හිතන්නේ අපි උන්ගේ රෑ කෑම හොරකම් කරගෙන යනවාට උන් කැමති වෙන්න නැතුව ඇති.

මම එකෙක්ට කඩු පහරක් දීලා, ඌගේ හිස ගසා දැම්මා. ඇනබෙත් තවත් එකෙකුගේ ස්පර්ශක දෙක මැදට ඇන්නා. දිව්‍යමය ලෝකඩ තලය ඌගේ කටුව සිදුරු කරගෙන යද්දි, කුඹියාව සම්පූර්ණයෙන් ම කුඩු වී ගියා.

"මං- මං හිතන්නේ මට දූන් ඇවිදින්න පුළුවන්," බෙකන්ඩොර්ෆ් කිවුවත්, අපි එයාට යන්න දුන් හැටියේ ම එයා හොම්බ බිම ඇනගත්තා.

"චාර්ලි!" සිලේනා එයාට නැගිටින්න උදවු කරලා, එයාව වත්තම් කරගෙන යද්දි, ඇනබෙත් සහ මම කුඹී අතරින් මග එළිපෙහෙළි කර ගනිමින් ගියා.

කොහොම හරි අපිට සපා කෑමකට හෝ ඇසිඩ් ප්‍රහාරයකට ලක් නොවී එළිමහන් බිම අද්දරට යාගන්න හැකි වුණා. ඒ වුණත් මගේ ස්නීකර් ජෝඩුව නම් ඇසිඩ්වලට උණු වෙලා දුම් දමමින් තිබුණා.

පිටුපස එළිමහන් බිමේ, මකරා හැපී වැටෙමින් සිටියා. ඌගේ ආවරණයෙන් ලොකු ඇසිඩ් දුම් වලාවක් ඉහළ නැග්ගා.

"අපිට ඌට මැරෙන්න අරින්න බැහැ!" සිලේනා කිවුවා.

"ඒක ගොඩක් අනතුරුදායකයි," බෙකන්ඩොර්ෆ් කිවුවේ දුකෙන්. "ඒකෙ කම්බි පථ-"

"චාර්ලි," සිලේනා ආයාචනා කළා, "ඌ ඔයාගේ ජීවිතේ බේරුවා! අනේ, මං වෙනුවෙන්."

බෙකන්ඩොර්ෆ් දෙපැත්තට වැනුණා. කුඹී ස්‍රාවයෙන් තවමත් තද රතු පාටට හැරුණු මූණක් ඇතිව එයා හිටියේ කලන්තේ දාලා දූන් වැටෙයි වගෙයි. ඒත් එයා අමාරුවෙන් හිටගත්තා.

Scanned by TapScanner

"දුවන්න ලෑස්ති වෙලා ඉන්න," එයා අපිට කිව්වා. ඊට පස්සේ එළිමහන් බිම දිහා බැලූ එයා කෑගැසුවා, "මකරා! හදිසි ආරක්ෂක උපක්‍රමය, බීටා-ඇක්ටිවේට්!"

මකරා එයාගෙ කටහඬ ඇහුණු දිහාවට හැරුණා. ඌ කුඹින්ට එරෙහිව අරගල කිරීම නතර කළා. ඌගේ ඇස් දිලිසෙන්න ගත්තා. වාතය පුරා අකුණු කුණාටුවකට කලින් ඇති වෙන ඕසෝන් ගඳ පැතිරුණා.

*ෂ්ෂ්ෂ්ෂ්ෂෑප් !!!*

මකර හමෙන් පිට පැන්න නිල් පාට විද්‍යුත් දහරා, තරංග නංවමින් පහළට ඇදී ගොස් කුඹින්ට වැදුණා. සමහර කුඹියෝ පුපුරා ගියා. තවත් එවුන් දුම් දමමින් කළු අඟුරුවලට හැරුණා. තත්පර ගාණක් යද්දි, තව දුරටත් මකරාගේ ඇඟ උඩ කුඹි එකෙක්වත් සිටියේ නැහැ. තවමත් පණ තිබුණු කුඹි මුළුමනින්ම පසු බසිමින්, උන්ගේ විනාශ වුණ ගුළට දඩිබිඩියේ දුවද්දි, පිටුපසින් අතක ඇඟිලි වගේ ඇදී ගිය විදුලි ධාරා උන්ගේ පස්සට වැදුණේ උන්ව තවත් කුලප්පු කරමින්.

ජයග්‍රාහීව ගර්ජනා කළ මකරා, ඊට පස්සේ ඌගේ දිලිසෙන ඇස් අපි දිහාවට හැරෙව්වා.

"දැන්," බෙකන්ඩොර්ෆ් කිව්වා. "අපි දුවනවා."

***

මේ වතාවේ අපි මොර දුන්නේ "හෙෆාස්ටස් වෙනුවෙන්!" කියනවා වෙනුවට "උදාාාාවු!" කියලයි.

මකරා ගිනි පිඹිමින්, විදුලි අකුණු අපේ හිස්වලට උඩින් පාකරමින් අපිව එළවාගෙන ආවේ කාලෙකට පස්සේ විනෝද වෙන්න ලැබිලා වගෙයි.

"ඌව කොහොමද නතර කරන්නේ?" ඇනබෙත් ඇසුවා.

දැන් හොඳින් වැඩකරන කකුල්වලින් දුවමින් සිටි බෙකන්ඩොර්ෆ් (ඔයාගේ ඇඟ නැවත නිසි පිළිවෙලට ක්‍රියා කරවන්න, සද්දන්ත රාක්ෂයෙක් පස්සෙන් එළවගෙන එන එක තරම් හොඳ බෙහෙතක් තවත් නැහැ) ඔළුව සොලවා අමාරුවෙන් හුස්මක් ගත්තා.



"ඔයාලට තිබුණේ ඌව පණගන්වන්නේ නැතුව ඉන්න! ඌ අස්ථායී වෙලා ඉන්නේ! අවුරුදු ගාණක් ගියාම, රොබෝලා පිස්සු වැටෙනවා!"

"දැන ගත්ත එක හොඳයි," මම මොර ගසා කිව්වා. "ඒත් ඌව නතර කරන්නේ කොහොමද?"

බෙකන්ඩොර්ෆ් වියරුවෙන් වටේට බැල්මත් හෙළුවා. "අතන!"

අපිට ඉදිරියෙන් පොළොවෙන් ඉහළට එසවුණු, තුරු මුදුන් තරමට උස ගලක් තිබුණා. මේ වනාන්තරේ පුරා අරුම පුදුම විලාසවල ගල් තිබුණත්, මේ ගල නම් මම මීට කලින් දැකලා තිබුණේ නැහැ. එයට තිබුණේ යෝධ ස්කේට්බෝර්ඩ් රැම්පයක් වගේ එක පැත්තකින් බෑවුම් වුණු, අනෙක් පැත්තෙන් සෘජු පල්ලමක් ඇති හැඩයක්.

"ඔයාලා කට්ටිය, වටෙන් දුවලා ගිහින් බෑවුම පාමුලට යන්න," බෙකන්ඩොර්ෆ් කිව්වා. "මකරව වෙන පැත්තකට හරවන්න. ඌට යන්න නොදී තියාගන්න!"

"ඔයා මොනවද කරන්න යන්නේ?" සිලේනා ඇසුවා.

"ඔයාට පෙනෙයි. යන්න!"

බෙකන්ඩොර්ෆ් ගහක් පිටුපස නැමී මුවාවෙන අතරේ, මම ආපසු හැරී මකරාට කෑගැසුවා, "හේයි, කටුසු මොටා! ඔහේගේ හුස්ම ලාම්පු තෙල් ගඳයි!"

මකරා නාස් පුඩුවලින් කළු දුමක් පිම්බා. ඌ පොළොව දෙදරවමින්, මගේ දිහාවට දුවගෙන ආවා.

"ඉක්මන් කරන්න!" ඇනබෙත් මගේ අත අල්ලගත්තා. අපි බෑවුම පිටුපසට දුවද්දි, මකරා අපිව ලුහුබැන්දා.

"අපිට ඌව මෙතැන තියාගන්න වෙනවා," ඇනබෙත් කිව්වා. අපි තුන්දෙනා අපේ කඩු සූදානම් කරගත්තා.

අපි ළඟට හදිසියේ දුව ආව මකරා පැත්තකට ඇල වෙමින් නැවතුණා. ඌ ඔළුව පැත්තකට නමා බැලුවේ අපි සටන් කරන්න තරම් මෝඩ වෙනවා කියලා අදහාගන්න බැරුව වගෙයි. දැන් ඌ අපිව අල්ලගත්තට පස්සේ, ඌට අපිව මරන්න කොච්චර ක්‍රම ගොඩක්

තිබුණා ද කියනවා නම්, ඒවායින් කොයි එක පාවිච්චි කරන්න ද කියලා ඌට තීරණයක් ගන්න බැරි වෙන්න ඇති.

ඌගේ පළමු ගිනි ප්‍රහාරය එල්ල වෙද්දී අපි සීසීකඩ විසිරුණා. අපි මොහොතකට කලින් සිටගෙන සිටි තැන දුම් දමන අළු පිරුණු වළක් හැරී තිබුණා.

ඒ වෙලාවේ අපිට ඉහළින් සිටි බෙකන්ඩොර්ෆ්ව මට දකින්න ලැබුණා - බෑවුම මුදුනේ - ඒත් එක්කම එයා කරන්න උත්සහ කරමින් සිටි දේ මට තේරුම් ගියා. එයාට පැහැදිලි දර්ශනයක් ඕනෑ වුණා. ඒ නිසාම මට මකරාගේ අවධානය රඳවාගන්න සිදුව තිබුණා.

"යාාාහ්!" මම පහර දෙන්න පැන්නා. මම රිප්ටයිඩ් වේගයෙන් පහළට ගෙන ගොස් මකරාගේ පාදයක නිය පහුරක් කපා වෙන්කළා.

ඌ පහළට නැමී මගේ දිහා බලද්දී ඌගේ ඔළුව කිරිකිරි ගෑවා. ඌ තරහටත් වඩා අන්දමන්ද වෙලා වගේ පෙනුණේ හරියට, *'ඇයි බයා මගේ ඇඟිල්ලක් කපලා දැම්මේ'* කියලා අහනවා වගෙයි.

ඊට පස්සේ ඌ තියුණු දත් සිය ගාණක් විළිස්සමින් කට ඇරියා.

"පර්සි!" ඈනබෙත් අනතුරු ඇඟෙව්වා.

මම නොසැලී සිටියා. "තව තප්පරයයි..."

"පර්සි!"

මකරා පහර දෙන්න යද්දී ම, බෙකන්ඩොර්ෆ් ගල් මතින්, මකරාගේ බෙල්ල උඩට පැන්නා.

මකරා පස්සා ගාත්වලින් එසවෙමින් ගිනි දළු විද්දේ බෙකන්ඩොර්ෆ්ව හලන්න උත්සහ කරමිනුයි. ඒත් රාක්ෂයා හතර ගාතෙන් වටේට පැන පැන දුවද්දි බෙකන්ඩොර්ෆ් කව්බෝයි කෙනෙක් වගේ නොවැටී සිටියා. එයා මකරාගේ ඔළුව මුල පැනලයක් විවර කරලා, වයරයක් ඇද දැමූ හැටි මම බලා සිටියේ වශී වෙලයි.

එසැණින්ම, මකරා ගල් ගැහුණා. ඌගේ ඇස්වල දිප්තිය නැති වුණා. හදිසියේ ම, ඌ අහසට දත් විළිස්සා ගත් මකර ප්‍රතිමාවක් විතරක් වී තිබුණා.



බෙකන්ඩොර්ෆ් මකරාගේ බෙල්ල දිගේ රූටා ඇවිත්, ඌගේ වලිගය මුලට ඇද වැටුණේ හෙම්බත් වෙලා, තදින් හති දමමිනුයි.

"චාර්ලි!" එයා ළඟට දිවූ සිලේනා එයාගේ කම්මුලකට ලොකු හාද්දක් දුන්නා. "ඔයා ඒක කළා!"

ඈනබෙත් මගේ ළඟට ඇවිත් මගේ උරහිස මිරිකුවා. "හේයි, පාසි මොළේ, ඔයා හොඳින් ද?"

"හොඳයි... මං හිතන්නේ." මං හිතමින් සිටියේ මාව මකර කටක් ඇතුළේ උප දෙවි හත්මාලුවක් වෙන්න කොයි තරම් කිට්ටු වුණා ද කියලයි.

"ඔයා නම් නියමයි." ඈනබෙත්ගේ හිනාව අර මෝඩ මකරාගේ එකට වඩා ගොඩාක් ලස්සන වුණා.

"ඔයත් එහෙමයි," මං කිවුවේ ගැහෙන හඬින්. "ඉතින්... අපි මේ රොබෝට මොකද කරන්නේ?"

බෙකන්ඩොර්ෆ් නළල පිස දමාගත්තා. සිලේනා තවමත් එයාගේ කැපුම්, සීරුම් තුවාල ගැන නිකරුණේ කලබල කරමින් සිටියා. හැබැයි ඒ ලැබී තිබුණු සැලකිල්ලෙන් බෙකන්ඩොර්ෆ්ගේ හිත සෑහෙන වල්මත් වෙලා වගෙයි පෙනුණේ.

"අපි- අහ්- අනේ මන්දා," එයා කිවුවා. "සමහරවිට අපිට ඒක හදන්න පුළුවන් වෙයි, ආපහු කඳවුර ආරක්ෂා කරන්න ගන්න, හැබැයි ඒකට මාස ගාණක් යයි."

"කරලා බලන්න වටින වැඩක්," මම කිවුවා.

ටයිටන් රජා ක්‍රෝනොස්ට විරුද්ධව අපේ සටනේ දි ඒ ලෝකඩ මකරා අපේ පැත්තේ ඉන්නවා මම හිතේ මවා ගත්තා. ඌට මුහුණ දෙන්න වුනොත්, ක්‍රෝනොස්ගේ රාක්ෂයන්ට කඳවුරට පහර දීම ගැන දෙසැරයක් හිතලා බලන්න වෙයි. අනෙක් අතට, මකරා ආයෙමත් පිස්සු වැටිලා කඳවුරුකරුවන්ට පහර දෙන්න තීරණය කළොත් - එහෙම වුනොත් නම් ලෝක විනාශයක් වෙන්නේ.

"ඔයා දැක්ක ද අර කුඹි කන්දේ තිබුණ නිධානේ?" බෙකන්ඩොර්ෆ් ඇසුවා. "මායා ආයුධ? සන්නාහ? ඒ බඩුවලින් අපිට සෑහෙන ප්‍රයෝජනයක් ගන්න පුළුවන්."

"එතකොට එතැන තිබ්බව බ්‍රේස්ලට්," සිලේනා කිව්වා. "තව මාල."

මම වෙවුලා ගියේ ඒ උමං අස්සේ තිබුණු ගඳ මතක් වෙලයි. "මං හිතන්නේ ඒ වික්‍රමේ පස්සේ කරන්න තියාගත්තොත් හොඳයි. ඒ නිධන්වලට කිට්ටු කරන්නත් අපිට උප දෙවි හමුදාවක් ඕනෑ වෙයි."

"සමහරවිට," බෙකන්ඩොර්ෆ් කිව්වා. "ඒත් මොන තරම් වටිනා දේවල් ගොඩක් ද..."

සිලේනා ගල් ගැසුණු මකරාව අධ්‍යයනය කළා. "චාර්ලි, ඒක තමයි මම මෙච්චර කාලෙකට දැකපු නිර්භීතම දේ - ඔයා මේ මකරා පිටට පැනපු එක."

බෙකන්ඩොර්ෆ් කෙළ පිඬක් ගිල්ලා. "ම්ම්... ඔව්. ඒ කියන්නේ... ඔයා මාත් එක්ක ගිනිකෙළි බලන්න එනවා ද?"

සිලේනාගේ මූණ එළිය වුණා. "ඇත්තටම ඔව්, පිස්සු පූසෝ! මං හිතුවේ ඔයා කවදාවත් ඒක අහන්නැති වෙයි කියලා!"

හදිසියේම බෙකන්ඩොර්ෆ්ගේ තත්ත්වය සෑහෙන හොඳ අතට හැරුණා වගෙයි. "හොඳයි, එහෙනම් අපි ආපහු යමු! ඕනෑ ඔට්ටුවක්, දූන් කොඩිය අල්ලගෙන ඉවර ඇති."

★★★

මට සපත්තු නැතුව යන්න වුණේ, ඇසිඩ් මගේ සපත්තු මුළුමනින්ම කා දමා තිබුණු නිසයි. කුඹී ස්‍රාවය මගේ මේස්වලටත් උරාගෙන, යටි පතුල්වල හම ගිහින් රතු වී ඇති බව මම දැක්කේ සපත්තු ගලවා දැමුවාටත් පස්සෙයි. මම ඇනබෙත්ට වාරු වුණාම එයා මට කැලෑව හරහා තොන්ඩි ගහමින් යන්න උදවු වුණා.

බෙකන්ඩොර්ෆ් සහ සිලේනා අපිට ඉදිරියෙන් අත් පටලාගෙන යද්දි, අපි එයාලට යන්න ඉඩ දීලා පස්සට වුණා.

එයාලා දිහා බලාගෙන, මගේ අත ඇනබෙත් වටා දමාගෙන වාරු වී යද්දි, මට සෑහෙන අපහසුතාවයක් දැනුණා. ඔය තරම් නිර්භීත වීම ගැන මම හිත යටින් බෙකන්ඩොර්ෆ්ට දෙස් දෙවොල් තිබ්බා.



මම අදහස් කළේ, එයා මකරාට මූණ දීපු විදිහ ගැන නෙවෙයි. අවුරුදු තුනකට පස්සේ, එයාට නම් අන්තිමේ දි සිලේනාට එළියට යන්න කතා කරන්න තරම් ධෛර්යයක් ලැබිලා. ඒක සාධාරණ නැහැ නේ.

"ඔයා දන්නව ද," අපි අමාරුවෙන් ගාටද්දි ඇනබෙත් කිව්වා, "මම නම් දැකලා තියෙන නිර්භීතම දේ ඒක නෙවෙයි."

මම තදින් ඇහිපිය ගැසුවා. එයා මගේ හිත කියෙව්වා ද?

"ම්... ඒ කිව්වේ?"

අපි නොගැඹුරු ඇළක් හරහා යද්දි ඇනබෙත් මගේ මැණික් කටුව තදින් අල්ලගත්තා. " බෙකන්ඩොර්ෆ්ට මකරා පිටට පනින්න ඉඩ අරන් දෙන්න ඔයා මකරට විරුද්ධව සටන් කළා - අන්න ඒක නම් නිර්භීත වැඩක්."

"නැත්නම් අමු ගොන්කමක්."

"පර්සි, ඔයා නිර්භීත කොල්ලෙක්," එයා කිව්වා. "ඒ ප්‍රශංසාව බාරගන්න. මං දිවුරනවා. ඒක ඒ හැටි අමාරු ද?"

අපේ ඇස් එකිනෙක හමුවුණා. අපේ මුහුණු තිබුණේ, හරියට, එකිනෙකට සෙන්ටි මීටරයක් විතර දුරින් වගෙයි. මගේ පපුව කෝලම් නටන්න පටන් ගත්තේ, හරියට මගේ හදවත එළියට පනින්න දඟලනවා වගෙයි.

"එතකොට..." මම කිව්වා. "මං හිතන්නේ සිලෙනායි චාර්ලියි නම් ගිනිකෙළි සංදර්ශනේ බලන්න ජෝඩු දාලා යයි."

"මාත් හිතන්නේ එහෙමයි," ඇනබෙත් එකඟ වුණා.

"ඔව්," මම කිව්වා. "ම්, ඒ ගැන කියනවා නම්-"

මං ඒ වෙලාවේ මොනවා කියන්න ගියා ද මම දන්නේ නැහැ, ඒත් එතකොටම, ඇතීනා කැබිනයේ ඇනබෙත්ගේ සහෝදරයෝ තුන්දෙනෙක් කඩු මානාගෙන පඳුරු අතරින් එළියට පැන්නා. අපිව දැක්කම, එයාලා දත් තියෙව්වා.

"ඇනබෙත්!" එයාලගෙන් කෙනෙක් කිව්වා. "නියම වැඩේ අපි මේ දෙන්නව හිර කූඩුවට ගෙනියමු."

මම එයාලා දිහා බලා සිටියේ පුදුමයෙන්. "තරගේ තවම ඉවර නැද්ද?"

ඇතීනා කඳවුරුකරුවා මහ හඬින් හිනාවුණා. "තාම නැහැ... හැබැයි ඉක්මනටම ඉවර වෙයි. දැන් අපි ඔයාලා දෙන්නව අල්ලගත්තා නේ."

"අයියෝ, මොනවද බං," බෙකන්ඩොර්ෆ් විරෝධය පෑවා. "අපිට වෙන කරදරයක් වුණා. අරෙහේ මකරෙක් හිටියා, ඒ මදිවට මුළු කුඹි කන්ද ම අපිත් එක්ක යුද්ධෙට ආවා."

"අහ්-හහ්," තවත් ඇතීනා කඳවුරුකරුවෙක් කිවුවේ, පැහැදිලිව ම එය ගණන් නොගෙනයි. "ඇනබෙත්, එයාලගේ සිහිය වෙන පැත්තකට හරවලා නියම වැඩක් කළේ. ඒක නියමෙටම වැඩ කළා. අපි මෙතැන ඉඳන් එයාලව අරන් යන්න ද?"

ඇනබෙත් මගෙන් ඈත් වුණා. අපිට ආපහු සීමාව ළඟට නිදහසේ යන්න එයා ඉඩ අරන් දෙයි කියලා මට විශ්වාස වුණා, ඒත් එයා කළේ කිණිස්ස ඇදලා අරගෙන හිනාවක් එක්ක මට එල්ල කරපු එකයි.

"නැහ්," එයා කිවුවා. "සිලේනාටයි මටයි මේක කරන්න පුළුවන්. මෙහෙ එනවා, හිරකාරයෝ. ඉක්මන් කරනවා."

මම එයා දිහා බලා සිටියේ පුදුමයෙන් තිගැස්සිලයි. "ඔයා මේක සැලසුම් කරලා ද කළේ? අපිව තරගෙන් ඈත් කරලා තියන්න ඔයා මේ හැමදේම සැලසුම් කරා?"

"පර්සි, අනේ ඇත්තටම, මං කොහොමද එච්චර දෙයක් සැලසුම් කරන්නේ? අර මකරා, කුඹියෝ - ඔයා හිතන්නේ මේ හැමදෙයක් ම මේ විදිහටම සිද්ධ වෙන්න මට සැලසුම් කරන්න පුළුවන් කියලා ද?"

එහෙම කරන්න බැහැ වගේ නම් තමයි, ඒත් ඉතින් මේ ඇනබෙත් නේ. එයා මොනවා කරයි ද කියලා කියන්න පුළුවන් කාට ද.

ඒ වෙලාවේ එයා සිලේනා සමග බැල්මක් හුවමාරු කරගත්තා. එයාලා හිනා නොවී ඉන්න තදින් උත්සහ කරන බව මට තේරුණා.



"ඔයා- ඔයා මහ-" මම කියන්න පටන් ගත්තත්, එයාට බනින්න හොඳ නමක් මගේ කටට ආවෙ නැහැ.

හිර කූඩුවට යන මග දිගට මම, මගේ විරෝධය පෑවා. බෙකන්ඩොර්ෆ්ත් එහෙමයි. මෙච්චර දේවල් වුණාටත් පස්සේ අපිට හිරකාරයෝ විදිහට සලකන එක නම් සම්පූර්ණයෙන් ම අසාධාරණයි.

ඒත් ඇනබෙත් කළේ හිනාවේලා, අපිව හිර කූඩුවට දාපු එක විතරයි. පෙරටු බල ඇණියට එකතු වෙන්න යන අතරේ එයා ආපසු හැරිලා ඇහැක් ගැහුවා. "ගිනිකෙළි සංදර්ශනයෙදි හම්බෙමු."

මම පිළිතුරක් දෙන තුරුවත් නොරැඳුණු එයා කැලෑව තුළට දිවුවා.

මම බෙකන්ඩොර්ෆ් දිහා බැලුවා. "එයා මේ දැන්... මට එයත් එක්ක යන්න කතා කළා ද?"

එයා උරහිස් ඇකිළුවේ තනිකර ම අප්පිරියාවෙන්. "කෙල්ලො ගැන කවුරු දනී ද? මට පිස්සු හැදිච්ච මකරෙක්ව දුන්නා නම් ඊට වඩා සැපයි."

ඉතින් ඒ විදිහට අපි කෙල්ලෝ ටික තරඟය දිනන කල් ඉඳගෙන බලා හිටියා.

■■■■■

# පර්සි ජැක්සන් සහ සොරාගත් යුධ රථය

මට එළියෙන් සද්ද ඇහෙන්න ගත්තේ මම පස්වෙනි කාල පරිච්ඡේදයේ විද්‍යාව පන්තියේ ඉන්න වෙලාවෙයි.

***ස්කුඑච්ක්ක්! ඌච්ච්! ක්‍රීක්!*** "හයියාහ්!"

හරියට කාවහරි වියරු වැටුණ කුරුලු රෑනකගේ ප්‍රහාරයකට මැදි වෙලා වගෙයි. ඇත්තටම, මාව විශ්වාස කරන්න, මීට කලින් මටත් එහෙම අවස්ථාවකට මූණ දෙන්න වෙලා තිබුණා.

වෙන කාටවත් මේ කෝලහාලය ඇහිලා නැහැ වගෙයි. අපි හිටියේ විද්‍යාගාරයේයි. ඉතින් හැමදෙනාම හැලි දොඩවමින් සිටි නිසා, මගේ බීකරය හෝදන්න වගේ ගිහින් ජනේලයෙන් එපිට බලන්න මට ඒ හැටි අමාරු වුනේ නැහැ.

හිතුව විදිහටම, පටු මඟේ කඩුවක් අතින් ගත් ගැනු ළමයෙක් සිටියා. පැසි පන්දු ක්‍රීඩකයෙක් වගේ උස්, මස්ගොබවලින් පිරුණු කෙනෙක් වූ එයා ජීන්ස් එකකින්, සටනට පලඳින බූට්වලින් සහ ඩෙනිම් ජැකට්ටුවකින් සැරසී සිටියා. එයාට පොල් කෙඳි වගේ දුඹුරු පාට කොණ්ඩයක් තිබුණා. එයා සිටියේ ලොකු කළු කපුටෝ තරම් විශාල කළු කුරුලු රෑනක් පෙති ගසමින්. එයාගේ ඇඳුම්වල කීප පොළකම පිහාටු ඇමිණී තිබුණා. එයාගේ වම් ඇහැ අසල කැපුමකින් ලේ ගැලුවා. මම බලා සිටිද්දි ම, එක කුරුල්ලෙක් ඊතලයක් වගේ



පිහාටුවක් විද්දා. 'එය ඇදි ඇවිත් එයාගේ එයාගේ උරහිසේ වැදුණා. ශාපයක් කළ ගැනු ළමයා කුරුල්ලාට කඩුවෙන් කොටද්දි, ඌ ඉවතට පියඹා ගියා.

අවාසනාවට වගේ, මම ඒ ගැනු ළමයාව හඳුනා ගත්තා. ඒ ක්ලැරිස්, උප දෙවි කඳවුරේ හිටපු මගේ පරණ හතුරි. සාමාන්‍යයෙන් ක්ලැරිස් මුළු අවුරුද්ද පුරාම අර්ධ-ලෝහිත කඳවුරේ ජීවත් වුණ කෙනෙක්. ඉතින්, පාසල් දවසක් මැද, එයා නැඟෙනහිර ඉහළ කොටසේ මොනවා කරනවා ද කියලා මට කිසිම අදහසක් තිබුනේ නැහැ.

හැබැයි පෙනුණු හැටියට නම් පැහැදිලිවම එයා කරදරේක වැටිලා. එයාට තව වැඩි වෙලාවක් අල්ලගෙන ඉන්න පුළුවන් පාටක් පෙනුනේ නැහැ.

මම, මට කරන්න පුළුවන් එකම දේ කළා.

"මිසිස් වයිට්," මම කතා කළා, "මම විවේක කාමරේට ගියාට කමක් නැද්ද? මට වමනේ එන්න වගේ."

පන්ති කාමරයේ මායා වචනය 'කරුණාකරලා' කියලා නේද ගුරුවරු ඔයාට කියලා තියෙන්නේ? ඒක බොරුවක්. 'මායා වචනේ තමයි 'වමනේ යන්න එනවා' කියන එක. ඒකෙන් වෙන කිසිම දේකටත් වඩා වේගයෙන් ඔයාට පන්ති කාමරයෙන් එළියට යන්න ඉඩ ලැබෙනවා.

"යන්න!" මිසිස් වයිට් කිවුවා.

මම මගේ ආරක්ෂක ගොග්ල්ස්, අත් මේස් සහ විද්‍යාගාර ඒප්‍රනය ගලවා දමමින්, දොරෙන් එළියට දිවුවා.

මම මගේ ආයුධය එළියට ගත්තා - රිප්ටයිඩ් නම් බෝල්පොයින්ට් පෑන.

ශාලාවල දි කිසිවෙක් මාව නතර කළේ නැහැ. මම ව්‍යායාම ශාලාවෙන් එළියට පැන ගත්තා.

පටු මඟට එද්දිම, ක්ලැරිස් බේස්බෝලයකට ගහනවා වගේ යක්ෂ කුරුල්ලෙකුට කඩුවේ පැතලි පැත්තෙන් ගහනවා මට දකින්න ලැබුණා. තදින් හඬලමින්, කැරකි කැරකි විසි වුණ කුරුල්ලා, ගඩොල්

බිත්තියක හැප්පිලා, කුණු බාල්දියකට රුටා වැටුණා. එයින් පස්සේ එයා වටේ කැරකෙමින් තවත් දුසිමක් ඉහිරිව ගිටියා.

"ක්ලැරිස්!" මම මොර දුන්නා.

එයා අවිශ්වාසයෙන් මට රැවුවා. "පර්සි? ඔහේ මොනවද මෙහෙ-"

එයා වෙතට ඉගිලී ආ පිහාටු මුරයක් නිසා එයාගේ කතාව අතරමග ඇන හිටියා. ඒවා එයාගේ ඔළුවට උඩින් ගිහින් පිටුපසින් වූ බිත්තියේ ඇමිණුනා.

"මේක මගේ ඉස්කෝලේ," මම එයාට කිවුවා.

"ඒකත් මගේ වාසනාව," එයා අවලාද නැගුවා, ඒත් ඊට වඩා මැසිවිලි කියන්න බැරි තරමට එයා කාර්යබහුල වෙලයි හිටියේ.

මම මගේ පෑනේ කොපුව ගැලෙව්වා ම එය අඩි තුනක් දිග ලෝකඩ කඩුවකට හැරුණා. ඊට පස්සේ මමත් සටනට එකතු වී කුරුල්ලන්ව පෙති ගහන්නත්, උන්ගේ පිහාටු පාරවල් කඩු තලයෙන් ඉවතට හරවන්නත් පටන් ගත්තා.

ක්ලැරිස් සහ මම එකතු වෙලා කුරුලු රැන පිහාටු ගොඩක් පමණක් වෙන තුරු පෙති ගසා දැමුවා.

අපි දෙන්න ම හිටියේ තදින් හති දමමින්. මට සුළු සීරීම් කීපයක් වෙලා තිබුණත්, ලොකු තුවාලයක් නැහැ. මම අතට වැදී තිබුණු පිහාටුවක් ඇදලා ගත්තා. ඒක ගොඩක් ගැඹුරට වැදිලා නැහැ. ඒ නිසා එහි තුඩට විෂ කවලා නැති නම්, මට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

මම හදිසි අවස්ථාවකට පාවිච්චි කරන්න කබා සාක්කුවේ තියාගෙන හිටපු ඇම්බ්‍රෝසියා මල්ල එළියට අරන්, එයින් එක කෑල්ලක් දෙකට කඩලා, බාගයක් ක්ලැරිස්ට දුන්නා.

"මට ඔහේගේ උදවු ඕනෑ නෑ," එයා කෙඳිරුවත්, ඇම්බ්‍රෝසියා කෑල්ල ගත්තා.

එයින් කටවල් කීපයක් අපි ගිල දැමුවා - වැඩිය නෙවෙයි, මොකද ඔයා ඒවා වැඩිපුර කෑවොත්, දෙවියන්ගේ ආහාරය ඔයාව අළු කරලා දාන්න ඉඩ තියෙනවා. මං හිතන්නේ මහත දෙවිවරු වැඩිය



දකින්න නැත්තේ ඒ නිසා වෙන්න ඇති. කොහොම හරි, තත්පර ගාණක් තුළදී අපේ කැපුම් සහ සීරුම් අතුරුදහන් වුණා.

කඩුව කොපුවට දමාගත් ක්ලැරිස්, එයාගේ ඩෙනිම් ජැකට්ටුව ගැසුවා. "හොඳයි... පස්සෙ හම්බ වෙමු."

"පොඩ්ඩක් ඉන්න!" මම කිවුවා. "ඔයාට එහෙම නිකං ම පැනලා දුවන්න බැහැ."

"ඇත්තටම මට පුළුවන්."

"මොනවද සිද්ධ වෙන්නේ? ඔයා කඳවුරෙන් ඈතට ඇවිත් මොනවද කරන්නේ? අර කුරුල්ලෝ ඔයා පස්සේ ආවේ ඇයි?"

ක්ලැරිස් මාව තල්ලු කරා - අඩු තරමේ එහෙම කරන්න උත්සහ කරා. මට එයාගේ උප්පරවැට්ටි හොඳින් හුරු පුරුදු නිසාම මම පැත්තකට අඩිය තබා, එයාට මාව පසු කරගෙන පැකිළී වැටෙන්න ඉඩ ඇරියා.

"අයියෝ මොනවද," මම කිවුවා. "ඔයා තව පොඩ්ඩෙන් මගේ ඉස්කෝලෙ දි මැරෙන්න ගියා. ඉතින් ඒ නිසා මේක මටත් අදාළයි."

"එහෙම නෑ!"

"මට උදවු කරන්න දෙන්න."

එයා සැලෙන හුස්මක් ගත්තා. එයාට ඇත්තටම ඕනෑ වෙලා තියෙන්නේ මගේ මූණ සමතලා කරන්න කියලා මට හැඟුණා, ඒත් එක්කම එයාගේ ඇස්වල බලාපොරොත්තු විරහිත බවකුත් තිබුණේ හරියට, එයාව බරපතළ කරදරේක පැටලිලා වගෙයි.

"මගේ සහෝදරයෝ," එයා කිවුවා. "එයාලා මාව විහිළුවකට අරගෙන."

"ඔහ්," මම කිවුවේ පුදුම වෙලා නම් නෙවෙයි. අර්ධ-ලෝහිත කඳවුරේ ක්ලැරිස්ට සහෝදර සහෝදරියෝ ගොඩක් හිටියා. එයාලා එකාට එකා ඇන කොටා ගත්තා. මං හිතන්නේ යුද්ධයට අධිපති, ඒරීස්ගේ දුවලා පුතාලා වුණාම එයාලගෙන් ඒක බලාපොරොත්තු නොවී බැහැ. "කොයි සහෝදරයෝ ද? ශර්මන් ද? මාර්ක් ද?"

Scanned by TapScanner

"නෑ," එයා කිව්වේ, මීට කලින් කවදාවත් මම එයාගෙන් අහලා නැති විදිහේ බියමුසු හඬකින්. "මගේ අමරණීය සහෝදරයෝ. ෆෝබොස්, ඩෙයිමොස් දෙන්නා."

***

ක්ලැරිස් මට කතාව කියන අතරතුරේ අපි උද්‍යානයේ බංකුවක වාඩි වුණා. ආපහු ඉස්කෝලෙට යෑම ගැන මම ඒ හැටි කරදර වුනේ නැහැ. සාත්තු සේවිකාව මාව ගෙදර යවන්න ඇති කියලා මිසිස් වයිට් හිතනවා ඇති. ඒ වගේම හයවෙනි කාල පරිච්ඡේදයට තිබුණ ලී වැඩ පන්තියේ මිස්ටර් බෙල් කවදාවත් පැමිණීම ලකුණු කළේ නැහැ.

"එතකොට මට මේක හරියටම කියන්න," මම කිව්වා. "ඔයා ඔයාගේ තාත්තාගේ කාර් එක රවුමක් ගහන්න අරන් ගියා, දැන් ඒක නැතිවෙලා."

"ඒක කාර් එකක් නෙවෙයි," ක්ලැරිස් ගෙරෙව්වා. "ඒක යුධ රථයක්! ඒ වගේම ඒක අරන් යන්න කියලා මට කිව්වෙත් එයාමයි. ඒක නිකං... පරීක්ෂණයක් වගේ එකක්. ඉර බහින වෙලාවට මම ඒක ආපහු අරන් යන්න ඕනෑ. ඒත්-"

"ඔයාගේ සහෝදරයෝ ඔයාව කාර්-කොල්ලකෑවා."

"කරත්ත-කොල්ලකෑවා," එයා නිවැරදි කළා. "ජේනවා නේ, එයාලා තමයි එයාගේ සාමාන්‍ය රියැදුරෝ. ඉතින් ඒක වෙන කාටවත් එළවන්න ලැබෙනවට එයාලා කැමති නැහැ. ඒ නිසා එයාලා කරත්තේ මගෙන් හොරකම් කරලා, මාව පන්නලා දාන්න අර මෝඩ ඊතල-විදින කුරුල්ලෝ එව්වා."

"ඔයාගේ තාත්තගෙ හුරතල්ලු?"

එයා මූසල විදිහට ඔළුව වැනුවා. "එයාගේ දේවස්ථානේ මුර කරන්නේ උන්. කොහොම හරි, මම කරත්තේ හොයාගත්තේ නැත්නම්..."

එයා හිටියේ අඬන්න වගෙයි. එයාට දොස් කියන්නත් බැහැ. එයාගේ තාත්තා, ඒරීස්ට තරහා යනවා මම මීට කලින් දැකලා තිබුණා, හැබැයි ඒක හිත් ගන්නා දර්ශනයක් නම් නෙවෙයි. ක්ලැරිස් මෙතැන දි අසමත් වුනොත්, එයා ක්ලැරිස්ට දරුණු විදිහට සලකයි. ගොඩක් දරුණු විදිහට.



"මම ඔයාට උදවු කරන්නම්," මම කිව්වා.

එයා රවා බැලුවා. "ඔහේ මොකටද එහෙම කරන්නේ? මම ඔහේගෙ යාළුවෙක් නෙවෙයි නේ."

ඒකට නම් මට වාද කරන්න බැහැ. ක්ලැරිස් මට මිලියන වතාවක් විතර අලුතුත්තේරුකම් කරලා තිබුණා. ඒ වුණත්, එයා හෝ වෙන ඕනෑම කෙනෙක් ඒරීස්ගෙන් ගුටි කනවා කියලා හිතන්නවත් මම කැමති වුනේ නැහැ.

එයාට ඒක කොහොම පැහැදිලි කරලා දෙන්න ද කියලා මම හිත හිතා ඉන්නකොට, කොල්ලෙකුගේ කටහඬක් ඇහුණා, "අයියෝ, බලනවා. මට හිතෙන්නේ එයා අඬ අඬා ඉඳලා වගේ!"

ගැටවර වයසේ කොල්ලෙක් දුරකථන කණුවකට හේත්තු වෙලා සිටියා. තැන තැන ඉරා දැමූ ජීන්ස් එකකින්, කළු ටී-ෂර්ට් එකකින් සහ ලෙදර් ජැකට්ටුවකින් සැරසී සිටි එයා ඔළුවේ ලේන්සුවක් ගැට ගසාගෙන සිටියා. එයාගේ ඉණ පටියේ පිහියක් රඳවා තිබුණා. එයාගේ ඇස් ගිනි දලුවල පාට ගත්තා.

"ෆෝබොස්," ක්ලැරිස්ගේ අත් මිට මෙළවුණා. "කරත්තේ කොහෙද, මැට්ටෝ?"

"ඔහේ ඒක නැති කරගත්තා," එයා ඔච්චම් කළා. "මගෙන් අහන්නෙ මොකටද."

"තමුසේ මහ-"

ක්ලැරිස් කඩුව ඇදලා අරන් පහර දෙන්න පැන්නා, ඒත් එයා කඩුව වනද්දිම ෆෝබොස් එතැනින් අතුරුදහන් වුණා. එයාගේ කඩුව දුරකථන කණුවේ වැදුණා.

ෆෝබොස් මට එහා පැත්තෙන් මතු වුණා. එයා මහ හඬින් හිනාවෙමින් සිටියත්, මම රිප්ටයිඩ්ගේ තුඩ එයාගේ බෙල්ලට තද කළා ම ඒ හිනාව නැවතුණා.

"ඔයා කරත්තේ ආපහු ගෙනත් දුන්නොත් හොඳයි," මම එයාට කිව්වා. "මගේ යකා ඇවිස්සෙන්න කලින්."

අවඥාවෙන් විරිත්තූ එයා මුරණ්ඩු පෙනුමක් ගන්න - අඩු තරමේ කඩු තුඩක් බෙල්ලට තද වෙලා තියෙනකොට මවා ගන්න

පුළුවන් තරමේ මුරණ්ඩු පෙනුමක් ගන්න උත්සහ කළා. "කවුද ඔහේගේ මේ චූට්ටං බෝයි ෆ්‍රෙන්ඩ්, ක්ලැරිස්? ඔහේට දැන් ඔහේගේ සටන්වලට උදවු කරන්නත් කට්ටිය ඕනෑ ද?"

"එයා මගේ බෝයි ෆ්‍රෙන්ඩ් නෙවෙයි!" ක්ලැරිස් කඩුව ගස්සා අදිමින්, දුරකථන කණුවෙන් ගලවා ගන්න දඟලුවා. "එයා මගේ යාළුවෙක්වත් නෙවෙයි. එයා පර්සි ජැක්සන්."

ෆෝබොස්ගේ මුහුණුවරේ මොකක්දෝ වෙනසක් වුණා. ෆෝබොස්ගේ මුහුණුවරේ බවක් පවා පෙනුණා. "එයා පුදුම වූ බවක්, සමහරවිට කලබල වූ බවක් පවා පෙනුණා. "එයා පුදුම වූ බවක්, සමහරවිට කලබල වූ බවක් පවා පෙනුණා. "එයා පොසෙයිඩන්ගේ පුත්තරයා? තාත්තව කේන්ති ගස්සපු එකා? ඔහ්, මේක නම් මරේ මරු, ක්ලැරිස්. ඔහේ පරම හතුරෙක් එක්ක රවුම් ගහනවා?"

"මම එයා එක්ක රවුම් ගැහුවේ නෑ!"

ෆෝබොස්ගේ ඇස් තද රතු පාටින් දිලිසෙන්න ගත්තා.

ක්ලැරිස් බෙරිහන් දුන්නා. එයා හිස් අවකාශයට ගහන්න ගත්තේ හරියට එයාට අදෘශ්‍යමාන කෘමි ප්‍රහාරයක් එල්ල වෙනවා වගෙයි. "කරුණාකරලා, එපා!"

"ඔයා මොනවද එයාට කරන්නේ?" මම ප්‍රශ්න කළා.

ක්ලැරිස් පිස්සුවෙන් වගේ කඩුව වනමින්, පටු මඟට පසුබැස්සා.

"ඒක නතර කරනවා!" මම ෆෝබොස්ට කිවුවා. මම මගේ කඩු තුඩ එයාගේ බෙල්ලට තවත් ටිකක් තද කළා, ඒත් නිකං ම චුත වී ගිය එයා, ආපසු දුරකථන කණුව ළඟින් ප්‍රාදූර්භූත වුණා.

"වැඩිය උඩ පනින්නෙපා, ජැක්සන්," ෆෝබොස් කිවුවා. "එයා බය මොනවටද කියලා මම එයාට පෙන්නුවා විතරයි."

එයාගේ ඇස්වල වූ දීප්තිය නැති වුණා.

ක්ලැරිස් බිමට ඇද වැටී, තදින් හුස්ම ගත්තා. "ජරා සතා," එයා හති දමුවා. "මං... මං තමුසෙව අල්ල ගන්නම්."

ෆෝබොස් මගේ දිහාවට හැරුණා. "එතකොට ඔහේ කොහොමද, පර්සි ජැක්සන්? ඔහේ මොනවටද බය? මම හොයාගන්නම්කෝ. මම හැම වෙලාවෙම ඒක හොයාගන්නවා."



"කරන්නේ ආපහු දෙනවා," මම මගේ කටහඬ නොසැලී තියාගන්න උත්සහ කළා. "මම වතාවක් ඔහේගේ තාත්තවත් මට්ටු කරා. ඔහේට මාව බය කරන්න බැහැ."

ෆෝබොස් මහ හඬින් හිනාවුණා. "'බයට ඇරෙන්න වෙන කිසිවකට බය වෙන්න එපා.' එහෙම නේද කියන්නේ? හොඳයි, මම ඔහේට පුංචි රහසක් කියන්නම්, අර්ධ-ලෝහිතයෝ. මම තමයි 'බය'. ඔහේට කරන්නේ හොයාගන්න ඕනෑ නම්, ඇවිල්ලා අරගන්නවා. ඒක තියෙන්නේ වතුරෙන් එපිට. ඔහේට ඒක චූටි කැලෑ සත්තු ජීවත් වෙන තැනදි හොයාගන්න ලැබෙයි - ඔහේ වගේ එවුන්ව අයිති තැන දි."

අසුරක් ගැසූ එයා කහ පාට වාෂ්ප වලාවක් මැද අතුරුදහන් වුණා.

දැන්, මම ඔයාට කියන්නම ඕනෑ, මීට කලිනුත් මම කැමති නැති දෙවිවරු සහ රාක්ෂයෝ මහ ගොඩක් මට මූණ ගැහිලා තියෙනවා, ඒත් ෆෝබොස් ඒ ඔක්කොටම වඩා නරකයි.

මම දාමරිකයන්ට කැමති නැහැ. මම ඉස්කෝලෙදි කවදාවත් 'ජනප්‍රිය ම කණ්ඩායමේ' හිටපු කෙනෙක් නෙවෙයි. ඒ නිසා මට ජීවිතයෙන් වැඩි කාලයක් ගත කරන්න වෙලා තිබුණේ මාවත් මගේ යාළුවන්වත් බය කරන්න උත්සහ කරන චණ්ඩින්ට විරුද්ධව නැගී සිටිමිනුයි. ෆෝබොස් මට හිනාවුණ විදිහ සහ එක බැල්මකින් ක්ලැරිස්ව බිමට වට්ටපු විදිහ දැක්කාම... මට ඕනෑ වුණේ මේ හාදයාට පාඩමක් උගන්වන්නයි.

මම ක්ලැරිස්ට නැගිටින්න උදවු කළා. එයාගේ මූණ දාඩියෙන් තෙත් වැටී තිබුණා.

"දැන්වත් ඔයා උදවු ගන්න ලෑස්තියි ද?" මම ඇසුවා.

★★★

උමං දුම්රියකට නැගගත් අපි, එල්ල විය හැකි තවත් ප්‍රහාර ගැන විපරමින් ගියා, ඒත් වෙන කවුරුවත් අපිට කරදර කළේ නැහැ.

යන අතරමග දි ක්ලැරිස් මට ෆෝබොස් සහ ඩෙයිමොස් ගැන කිවුවා.

"එයාලා සුළු දෙවිවරු," එයා කිව්වා. "ෆෝබොස් කියන්නේ බය. ඩෙයිමොස් කියන්නේ භීෂණය."

"මොකක්ද ඒ දෙකේ වෙනස?"

එයාගේ නළල රැළි ගැසුණා. "ඩෙයිමොස් ලොකුත් වැඩියි, කැතත් වැඩියි, මං හිතන්නේ. එයා ලොකු සෙනඟක් එක පාර බය කරන්න දක්ෂයි. ෆෝබොස් ඊට වඩා, හරියට, පෞද්ගලිකයි වගේ. එයාට ඔහේගේ ඔළුව ඇතුළට රිංගන්න පුළුවන්."

"ඒකෙන් ද 'ෆෝබියා' (භීතිකාව) කියන වචනේ හැදිලා තියෙන්නේ?"

"ඔව්," එයා ගෙරෙව්වා. "එයා ඒ ගැන හරි ආඩම්බරෙන් ඉන්නේ. එයා නමින් නම් වෙලා තියෙන ඔක්කොම ෆෝබියා ගැන. මළ විකාර."

"ඉතින් ඇයි එයාලා ඔයා කරත්තේ එළවනවට කැමති නැත්තේ?"

"සාමාන්‍යයෙන් ඒක වයස අවුරුදු පහළොව ලැබුව ඒරීස්ගේ පුතාලට විතරක් කරන චාරිත්‍රයක්. මතක ඇති කාලෙකින් ඒක කරන්න ලැබුණ පළවෙනි දුව මමයි."

"කොච්චර හොඳද."

"ඒක කියන්ඩ ෆෝබොස්ටයි ඩෙයිමොස්ටයි. එයාලා මට වෛර කරනවා. මට කරත්තේ ආපහු දේවස්ථානෙට අරන් යන්ඩ තියෙනවා."

"කොහෙද දේවස්ථානේ තියෙන්නේ?"

"86 ජැටියේ. ඉන්ටර්පිඩ් එකේ."

"ඔහ්." දැන් ඒ ගැන හිතද්දි, ඒකෙ තේරුමක් තියෙනවා කියලා මට හිතුණා. මම කවදාවත් පරණ ගුවන් යානා අංගනයට ගිහින් තිබුනේ නැති වුණත්, ඒක මොකක් හරි හමුදා කෞතුකාගාරයක් කියලා මම දැනගෙන හිටියා. සමහරවිට ඒකෙ තුවක්කු ගොඩක් සහ බෝම්බ සමග තවත් අනතුරුදායක සෙල්ලම් බඩු ඇති. ඒ කියන්නේ ඒක යුධ දෙවියෙකුට කාලය ගත කරන්න කියාපු තැනක්.



"ඉර බහින්න කලින් අපිට පැය හතරක් විතර ඇති," මම අනුමාන කළා. "අපිට කරත්තේ හොයාගන්න ඒ වෙලාව ඇති වෙයි."

"ඒත් ෆෝබොස් 'වතුරට එපිටින්' කියලා අදහස් කරේ මොකක්ද? සියුස්ගේ නාමෙට, අපි ඉන්නේ දූපතක නේ. ඒ කියන්නේ ඕනෑම පැත්තක් වෙන්න පුළුවන්!"

"එයා කැලෑ සත්තු ගැන කතාවක් කිව්වා," මට මතක් වුණා. "චූටි කැලෑ සත්තු."

"සත්තු වත්තක් ද?"

මම ඔළුව වැනුවා. වතුරට එපිටින් තියෙන සත්තු වත්තක් කියන්නේ බෲක්ලින්වල තියෙන එක වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් සමහරවිට... යන්න වඩාත් අමාරු, 'චූටි' කැලෑ සත්තු ඉන්න තැනක්. කිසිත කෙනෙක් යුධ රථයක් හොයන්න යන්න හිතන්නෙවත් නැති තැනක්.

"ස්ටේටන් දූපත," මම කිව්වා. "එහෙ පුංචි සත්තු වත්තක් තියෙනවා."

"වෙන්න පුළුවන්," ක්ලැරිස් කිව්වා. "ඒක නම් ෆෝබසුයි ඩෙයිමොසුයි මොනවා හරි හංගන්න පාවිච්චි කරන්න ඉඩ තියෙන තැනක් වගේ තමයි. ඒත් අපි වැරදි නම්-"

"අපිට වැරදි වැරදි ඉන්න වෙලාවක් නැහැ."

ටයිම්ස් චතුරස්‍රයේදී දුම්රියෙන් පැනගත් අපි තොටුපළ පර්යන්තයට යන නොම්බර එක දුම්රිය අල්ල ගත්තා.

***

ස්ටේටන් දූපතට තුනයි තිහට පිටත් වෙන පාලම් පාරුවට අපි ගොඩවුණා.

එහි ඉහළම තට්ටුවේ රැස්කමින් සිටි සංචාරක රැළ, අපි ලිබර්ටි ප්‍රතිමාව පසු කර යද්දි ඡායාරූප ගන්න පටන් ගත්තා.

"එයා ඒක හදලා තියෙන්නේ එයාගේ අම්මව ආදර්ශයට අරගෙන," මම කිව්වේ ප්‍රතිමාව දිහා බලමින්.

Scanned by TapScanner

ක්ලැරිස් මගේ දිහා රවා බැලුවා. "කවුද?"

"බර්තොලිඩි," මම කිව්වා. "ලිබර්ටි ප්‍රතිමාව හදපු හාදයා. එයා ඇතීනාගේ පුතෙක්ලු. එයා මේක හදලා තියෙන්නේ එයාගේ අම්මා වගේ පේන්නලු. කොහොම හරි, ඇනබෙත් මට කිව්වේ එහෙමයි."

ක්ලැරිස් ඇස් කැරකුවා.

ඇනබෙත් කියන්නේ මගේ හොඳම යාළුවා වගේම, වාස්තු විද්‍යාව සහ ස්මාරක ගැන කතා කරද්දි ලොකුම ලොකු ඇණයක්. මං හිතන්නේ එයාගේ පණ්ඩිත කතන්දර සමහර වෙලාවට මටත් කියවෙනවා.

"වැඩකට නැති දෙයක්," ක්ලැරිස් කිව්වා. "සටනක දි ඒකෙන් ඔහේට උදව්වක් වෙන්නෙ නැත්නම්, ඒක වැඩකට නැති තොරතුරක්."

මට එයා එක්ක තර්ක කරන්න තිබුණා, ඒත් එතකොටම පාලම් පාරුව ගලක හැප්පුණා වගේ පැත්තකට ඇලවුණා. සංචාරකයෝ එකිනෙකාගේ හැප්පෙමින්, හැම තැනම විසිවුණා.

ක්ලැරිස් සහ මම බෝට්ටුවේ ඉස්සරහට දිව්වා. අපිට පහළින් වතුර බුබුළු දමන්න පටන් ගත්තා. ඊට පස්සේ මුහුදු සර්පයෙකුගේ ඔළුවක් මුහුදු බොක්කෙන් පිට පැන්නා.

ඒ රාක්ෂයා අඩු තරමේ බෝට්ටුව තරම්වත් විශාලයි. අළු සහ කොළ පාට වූ ඌගේ ඔළුව කිඹුලෙකුගේ වගෙයි. ඌට දැළි පිහි තරම් තියුණු දත් තිබුණා. ඌගේ ගඳ... හොඳයි, ඌගේ ගඳ හරියටම නිව්යෝක් වරාය පතුලේ සිට මේ දක් ගොඩ ආව එකෙක්ගේ වගේමයි. ඌගේ බෙල්ල මත වාඩි වී ඌව පදවමින් සිටියේ කළු පාට ග්‍රීක සන්නාහයකින් සැරසුණු තඩි කොල්ලෙක්. එයාගේ මූණ කැත තුවාල කැළැල්වලින් වැහිලා. එයා හෙල්ලයක් දරාගෙන හිටියා.

"ඩෙයිමොස්!" ක්ලැරිස් මොර ගැසුවා.

"හෙලෝ, සහෝදරී!" එයාගේ හිනාවත් සර්පයාගේ තරමටම බිහිසුණුයි. "සෙල්ලම් කරන්න එනව ද?"

රාක්ෂයා ගර්ජනා කළා. සංචාරකයෝ බෙරිහන් දෙමින් ඔළුව හැරුණු අතේ දිව්වා. ඇත්තටම එයාලට පෙනුණේ මොකක්ද කියලා මම දන්නෙ නැහැ. සාමාන්‍යයෙන් මීදුම රාක්ෂයින්ගේ සැබෑ ස්වරූපය



මනුෂ්‍යයින්ට පෙනීම වළක්වනවා. ඒත් දන් එයාලට පෙනුණේ මොකක් වුණත්, එයින් එයාලා බියෙන් ත්‍රස්ත වෙලා සිටියා.

"එයාලට පාඩුවේ ඉන්න දෙනවා!" මම මොර දුන්නා.

"ඇයි නැත්තම් මොනවා කරන්න ද, මුහුදු දෙයියන්ගේ පුතෝ?" ඩෙයිමොස් විරිත්තුවා. "ඔහේ මහ පිනෙක් කියලා මගේ සහෝදරයා කිව්වා! ඇරත්, මම භීෂණය ට ආසයි. මම ජීවත් වෙන්නේ භීෂණයෙන්!"

එයා මුහුදු සර්පයාට ඔළුවෙන් පාලම් පාරුවට පහර දෙන්න සත් කළා. ඒක ආපස්සට ගැස්සුණා. අනතුරු අඟවන සංඥා රව දෙන්න ගත්තා. එතැනින් පිට වෙන්න වලි කන මගීන් එකා පිට එකා වැටුණා. ඩෙයිමොස් ප්‍රීතියෙන් හිනාවුණා.

"හොඳටම ඇති," මම ගෙරෙව්වා. "ක්ලැරිස්, එල්ලෙන්න."

"මොකක්?"

"මගේ බෙල්ලෙ එල්ලෙන්න. අපි රවුමක් යන්න හදන්නේ."

එයා විරෝධයක් පෑවේ නැහැ. එයා මගේ කරේ එල්ලුණා ම මම ගණන් කළා, "එකායි, දෙකායි, තුනායි - පනිමු!"

අපි නැව් තට්ටුවේ සිට කෙලින්ම මුහුදු බොක්කට පැන්නා, ඒත් අපිට වතුර යට ඉන්න සිදු වුණේ එක මොහොතක් විතරයි. සමුද්‍රයේ බලය මගේ ඇතුළේ රළ ගසනවා මට දැනුණා. වතුරට මගේ වටා සුළි නංවන්න මම ඉල්ලා සිටියා. එයින් ඇති වූ බලයෙන් අපිව අඩි තිහක් විතර උස දිය ගොබයක් මතින් මුහුදු බොක්කෙන් ඉහළට එසවුණා. මම අපිව කෙලින්ම රාක්ෂයා වෙතට යන්න සැලැස්සුවා.

"ඔයා හිතනව ද ඔයාට ඩෙයිමොස්ව බිම දාන්න පුළුවන් වෙයි කියලා?" මම ක්ලැරිස්ගෙන් මොර ගසා ඇසුවා.

"මම ලෑස්තියි!" එයා කිව්වා. "මාව අඩි දහයක් විතර ළඟට අරන් යන්ඩකෝ."

අපි සර්පයා වෙතට වේගයෙන් ඇදුණා. ඌ දළ විළිස්සද්දි ම, මම දිය ගොබය පැත්තකට හැරෙව්වා. ඒත් එක්කම ක්ලැරිස් ඩෙයිමොස්ගේ ඇඟට පැන්නා. ඒ දෙන්නම මුහුදට පෙරළී වැටුණා.

Scanned by TapScanner

මුහුදු සර්පයා මගේ පස්සෙන් ආවා. ඉක්මනින් දිය ගොබය හැරවූ මම ඌට මුහුණලා හැරිලා, මගේ මුළු බලය ම යොදා වතුර කඳට තවත් ඉහළට එසවෙන්න නියෝග කළා.

"වූවූමමම!"

ලීටර් පනස්දහසක ලුණු වතුර රාක්ෂයා මතට කඩා වැටුණා. ඌගේ ඔළුව උඩට පැන්න මම, රිප්ටයිඩ්ගේ කොපුව ගලවා, මගේ මුළු වෙර යොදා සතාගේ බෙල්ලට කෙටුවා.

රාක්ෂයා ගර්ජනා කළා. ඌගේ තුවාලයෙන් කොළ පාට ලේ පිට පැන්නා. සර්පයා රළ අතරින් යට ගියා.

මම වතුර යටට කිමිදි, ඌ විවෘත මුහුදට පසු බහිනවා බලා සිටියා. මුහුදු සර්පයින්ගේ හොඳ ගතිය ඒකයි: තුවාලයක් වුණ වෙලාවට උන් බබාලා වගෙයි.

ක්ලැරිස් කටින් වතුර පිඹිමින්, කහිමින් මගේ ළඟින් මතුවුණා. මම එයා ළඟට පිහිනා ගිහින් එයාව අල්ලාගත්තා.

"ඔයා ඩෙයිමොස්ට වැඩක් දුන්න ද?" මම ඇසුවා.

ක්ලැරිස් ඔළුව හෙල්ලුවා. "ඒ බයගුල්ලා අපි පොර අල්ලද්දි අතුරුදහන් වුණා. ඒත් අපිට එයාව ආපහු දකින්ඩ ලැබෙයි කියලා මට විශ්වාසයි. ෆෝබසුත් එක්කම."

බීරන්තට්ටු වුණ සංචාරකයෝ තවමත් පාලම් පාරුව වටේ දුවමින් සිටියා. ඒත් එයාලා කාටවත් හිරිහැරයක් වෙලා වගේ නම් පෙනුනේ නැහැ. බෝට්ටුවටත් හානියක් වූ බවක් පෙනුනේ නැහැ.

අපි ඒ අහළ පහළ ගැවසෙන එක ඇඟට ගුණ නැහැ කියලා මම තීරණය කළා. ක්ලැරිස්ව එක අතකින් අල්ලා ගත් මම, අපිව ස්ටේටන් දූපතට අරන් යන්න කියලා මුහුදු රළවලින් ඉල්ලුවා.

බටහිර අහසේ, ඉර ජර්සි වෙරළට පහත් වෙමින් තිබණා. අපේ කාලය ඉක්මවා යමින් තිබුණා.

***

ස්ටේටන් දූපත වැඩි වෙලාවක් ගත කරන්න හොඳ තැනක් විදිහට මට පෙනුනේ නැහැ. ඒක මම හිතුවට වඩා ගොඩක් ලොකු තැනක් වුණා. ඒ වගේම එහි පයින් ඇවිදිම විනෝදජනක දෙයකුත් නෙවෙයි. එහි වීදි වටේ කැරකෙන අවුල් ජාලයක් වගෙයි, ඒ වගේම හැමදෙයක්ම ඉහළින් පිහිටා තියෙනවා වගෙයි පෙනුණේ.



මම නොතෙමී සිටියත් (මට උවමනා නැත්නම් මම කවදාවත් මුහුදේ දි තෙමෙන්නේ නැහැ) ක්ලැරිස්ගේ ඇඳුම්වලින් තවමත් වතුර වැස්සුණා. ඉතින් එයා යද්දි පදික වේදිකාව දිගට එයාගේ කිලිටි අඩි සලකුණු ඉතිරි වුණා. ඒ මදිවට බස් රථ රියැදුරාත් අපිව බසයට නංවාගන්න අකමැති වුණා.

"අපිට වෙලාවට යාගන්න කොහෙත්ම බැරිවෙයි," එයා සුසුමක් හෙළුවා.

"ඒ විදිහට හිතන එක නවත්තන්න." මම උදේ‍යා්ගිමත් හඬින් කතා කරන්න උත්සහ කළත්, ඒ වෙද්දි මගේ හිතෙත් දෙගිඩියාවක් පහළ වෙමින් තිබුණා. අපිට උදවුවක්වත් තිබුණා නම් කියලා මට හිතුණා. සුළු දෙවිවරු දෙන්නෙක්ට විරුද්ධව උප දෙවිවරු දෙන්නෙකුට කරන්න පුළුවන් දෙයක් නැහැ. අපිට ෆෝබොස්ව සහ ඩෙයිමොස්ව එකට මුණ ගැහුණා ම, මොනවා කරන්න ද කියලාවත් මට විශ්වාසයක් තිබුනේ නැහැ.

ෆෝබොස් කියූ දේ මට නැවත නැවතත් මතක් වුණා: ***එතකොට බහේ කොහොමද, පර්සි ජැක්සන්? බහේ මොනවටද බයා? මම හොයාගන්නම්කෝ.***

නගරාසන්න නිවාස ගොඩක්, දේවස්ථාන දෙකක් සහ මැක්ඩොනල්ඩ් අවන්හලක් පසු කරගෙන දූපතෙන් අඩ දුරක් ම ගාටමින් ගිය අපිට අන්තිමේ දි 'සත්වෝද්‍යානය' ලෙසින් දැක්වෙන සලකුණක් දකින්න ලැබුණා. කෙළවරකින් හැරුණු අපි, දෙපස ගස් වැවූ වංගු සහිත වීදියක් දිගේ ගිහින් ඇතුළුවීමේ ගේට්ටුවට ළඟා වුණා.

ප්‍රවේශපත් නිකුත් කරන කවුළුවේ සිටි ගැහැනු කෙනා සැක සහිතව අපි දිහා බැලුවා, ඒත් දෙවිවරුන්ට ස්තුති වෙන්න, ඇතුළට යෑමට ඇති තරම් සල්ලි මගේ ළඟ තිබුණා.

අපි උරඟයින්ගේ කුටිය පසුකර යද්දි ක්ලැරිස් එක පාරටම නැවතුණා.

"අර තියෙන්නේ ඒක."

සුරතල් සතුන් සිටි කොටස සහ මුහුදු බල්ලන්ගේ පොකුණට යන පාරවල් අතර මංසන්ධියේ එය තිබුණා: කළු අශ්වයෝ හතර දෙනෙක් දිගේලි කළ, රන් පාට සහ රතු පාට ලොකු කරත්තයක්. ඒ කරත්තය විස්මිත විස්තරවලින් සරසා තිබුණා. ඒ දසුන්වලින් ඒ කරත්තය විස්මිත විස්තරවලින් සරසා තිබුණා. ඒ දසුන්වලින් මිනිස්සුන්ව පිළිඹිබු නොවුණා වේදනාකාරී මරණවලට ලක් වූ මිනිස්සුන්ව පිළිඹිබු නොවුණා නම් එය ලස්සන වෙන්න තිබුණා. කරත්තයට බැඳ සිටි අශ්වයෝ නාස්වලින් ගිනි පිම්බා.

සත්වෝද්‍යානය නරඹන්න පැමිණ සිටි පවුල්වල උදවිය එය පසුකර ඇවිද ගියේ හරියට එතැන එහෙම කරත්තයක් නැහැ වගෙයි. මං හිතන්නේ එය වටා මීදුම ගොඩාක් තදින් පවතින්න ඇති, මොකද එහි පෙනෙන්නට තිබුණු එකම වෙස් මාරුව වුණේ අශ්වයින්ගේ පපුවට අමුණා තිබුණු, අතින් ලියූ දැන්වීමක් විතරයි: *සත්වෝද්‍යාන තිල රථය.*

• "ෆෝබොස්, ඩෙයිමොස් දෙන්නා කොහෙද?" ක්ලැරිස් කෙඳිරුවේ කඩුව ඇද ගනිමින්.

මට එයාලව දැකගන්න නැති වුණත්, මේක උගුලක් විය යුතුයි කියලා මට හිතුණා.

මම අශ්වයින්ට හිත යොමු කළා. උන්ව නිර්මාණය කර තිබුණේ මගේ තාත්තා නිසා, සාමාන්‍යයෙන් මට අශ්වයින්ට කතා කරන්න පුළුවන්කම තිබුණා.

*හේයි, මම කිවුවා. හොඳ ගිනි-පිඹින අශ්වයෝ. මෙහෙ එන්න!*

එක අශ්වයෙක් අවඥාවෙන් හේෂාරාවය කළා. ඇත්තටම, මට ඌගේ සිතුවිලි තේරුම් ගන්න පුළුවන් වුණා. ඌ මට කියපු නම් මට ආයෙමත් කියන්න පුළුවන් ඒවා නෙවෙයි.

"මම තෝන් ලණු ගන්ඩ බලන්නම්," ක්ලැරිස් කිවුවා. " අශ්වයෝ මාව දන්නවා. මාව මුවා කරන්ඩ."

"හරි." කඩුවකින් එයාව කොහොම මුවා කරන්න ද කියලා මට විශ්වාසයක් නැති වුණත්, ක්ලැරිස් කරත්තයට ළඟා වෙද්දි මම හොඳ සෝදිසියෙන් සිටියා. එයා අශ්වයින්ට ළං වුණේ, ඇඟිලි තුඩුවලින් ඇවිදිමින් වගෙයි.



අවුරුදු තුනක් විතර වයසැති චූටි ගෑනු ළමයෙක් සමග ගෑනු කෙනෙක් එතැන පසු කර යද්දි ක්ලැරිස් හිටිවනම නැවතුණා.

"පෝනියාව පිච්චෙනවා!" ගෑනු ළමයා කිවුවා.

"මෝඩ කතා කියන්නෙපා, ජෙසී," එයාගේ අම්මා කිවුවේ අවසිහියෙන් වගෙයි. "ඒක සත්වෝද්‍යාන තිල රථයක්."

චූටි ගෑනු ළමයා එයට විරෝධය පාන්න උත්සහ කළා, ඒත් එයාගේ අම්මා එයාගේ අතින් ඇදගෙන එතැනින් යන්න ගියා.

ක්ලැරිස් කරත්තයට තවත් කිට්ටු වුණා. එයාගේ අත් හරස් පොල්ලට ළං වෙද්දිම අශ්වයෝ කුලප්පු වෙලා, හේෂාරාවය කරමින් ගිනි පිඹින්න ගත්තා.

ෆෝබොස් සහ ඩෙයිමොස් කරත්තය තුළින් මතු වුණා. දැන් ඒ දෙන්නම තාර වගේ කළු පාට යුධ සන්නාහවලින් සැරසී සිටියා. ෆෝබොස් දත් නියවද්දි, එයාගේ රතු ඇස් දිලිසුණා. ඩෙයිමොස්ගේ කැළැල් වැටුණු මුහුණ ළඟට බලද්දි තවත් බිහිසුණු ලෙස පෙනුණා.

"ලුහුබැඳීම ආරම්භ වුණා!" ෆෝබොස් මොර දුන්නා. ක්ලැරිස් පය පැකිළී ආපස්සට වැටෙද්දි, අශ්වයින්ට කස පහර දුන් ෆෝබොස් කරත්තය එක එල්ලේම මගේ දිහාවට දැක්කුවා.

දැන්, වියරු වැටුණු ගිනි-පිඹින අශ්ව රංචුවකට විරුද්ධව මම මගේ කඩුව විතරක් අතැතිව සටන් කළා, වගේ මොකක් හරි වීර වැඩක් කළා කියලා ඔයාට කියන්න තිබුණා නම් මම කැමතියි. ඒත් ඇත්තම කියනවා නම්, මම පණ කඩාගෙන දිවුවා.

කුණු බාල්දියකට සහ ප්‍රදර්ශන කුටියක වැටට උඩින් පැනලා මම දිවුවත්, කරත්තයට වඩා වේගයෙන් දුවන්න මට කොහෙත්ම හැකියාවක් තිබුනේ නැහැ. එය වැට කඩාගෙන, මග ඇති හැමෙකක්ම පෙරළාගෙන මගේ කිට්ටුවට ම ආවා.

"පර්සි, ඔන්න බලාගෙන!" ක්ලැරිස් මොර ගැසුවේ, මට ඒක කවුරු හරි කියලා දෙන්න ඕනෑ වගෙයි.

උඩින් පැන්න මම නතර වුණේ මුහුදු බල්ලන්ගේ පොකුණ මැද වූ ගලින් සෑදූ දූපතක් මතයි. පොකුණෙන් වතුර කඳක් ඉහළට

එසවී අශ්වයන්ව තෙමා දමන්න මම නියම කළා. එයින් උන්ගේ ගිනි දලු තාවකාලිකව නිවී ගොස්, උන්ව තක්කු මුක්කු වුණා.

මුහුදු බල්ලෝ මම ආවට සතුටු වුනේ නැහැ. උන් තත් දොඩන්නත් බුරන්නත් ගත්තා. වියරු වැටුණු මුහුදු ක්ෂීරපායී සත්තු රැළකුත් මාව එළවන්න පටන් ගන්න කලින්, මම උන්ගේ දූපතෙන් ඉවත් වෙන එක හොඳයි කියලා මට තේරුණා.

ෆෝබොස් දෙස් දෙවොල් තබමින්, එයාගේ අශ්වයින් පාලනය කරගන්න දඟලන අතරේ මම දිවුවා. අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත් ක්ලැරිස්, ඩෙයිමොස් හෙල්ල ඔසවද්දි ම එයාගේ පිටට පැන්නා. ඒ දෙන්නා කරත්තයෙන් ඉවතට පෙරළෙද්දි, ඒක ඉදිරියට ඇදුණා.

ඩෙයිමොස් සහ ක්ලැරිස් කඩු සටනකට අවතීර්ණ වෙන හඬ මට ඇසුණා, ඒත් මට ඒ ගැන වද වෙවී ඉන්න වෙලාවක් නොතිබුණේ ෆෝබොස් ආයෙමත් මාව පන්නන්න පටන්ගෙන තිබුණු නිසයි. කරත්තය මගේ පසුපස එද්දි මම මින් මැඳුර වෙතට වේගයෙන් දිවුවා.

"හේයි, පර්සි!" ෆෝබොස් මට සරදම් කළා. "මට ඔහේට දෙන්ඩ දෙයක් තියෙනවා!"

ආපස්සට බැල්මක් හෙළූ මට දකින්න ලැබුණේ කරත්තය දිය වෙමින්, අශ්වයන්ව වානේවලට හැරී, මැටි රූප කඩා වැටෙනවා වගේ එකා පිට එකා නැමෙන හැටියි. කරත්තය දම්වැල් පටි රෝද සහ දිග තුවක්කු කාණුවක් ඇති කළු පාට ලෝහමය පෙට්ටියක් ලෙසට අලුතින් හැඩ ගැහුණා. යුද්ධ ටැංකියක්. ඉතිහාසය පන්තියේ දි මම කරලා තිබුණ පර්යේෂණ වාර්තාවකින් මම එය හඳුනා ගත්තා. ෆෝබොස් මට නියවමින් සිටියේ දෙවෙනි ලෝක යුධ සමයේ පැන්සර් යුධ ටැංකියක් මත සිටයි.

"දත් පෙන්නලා හිනාවෙනවා!" එයා කිවුවා.

තුවක්කුවෙන් වෙඩිල්ල නිකුත් වෙද්දිම මම පැත්තකට පෙරළුණා.

*දඩෝංංංංං!*

වෙළඳ කුටියක් පුපුරා ගියේ පුළුන් පිරවූ සතුන්, ප්ලාස්ටික් කෝප්ප සහ බැහැර දිය හැකි කැමරා හතර අතට විසුරුවමින්.



ෆෝබොස් තුවක්කුව නැවත මානද්දි, නැගිටගත් මම මින් මැඳුර තුළට දිවුවා.

මට ඕනෑ වුණේ වතුරෙන් වට වූ තැනකට යන්නයි. එයින් හැම වෙලාවේම මගේ බලය වැඩි කළා. ඒ ඇරත්, එතැන දොර හරහා ෆෝබොස්ට කරත්තය ගන්නත් ඉඩ මදි වෙන පාටක් තිබුණේ. ඇත්තටම, එයා දොර පුපුරවා දැම්මොත් නම්, කරන්න දෙයක් නැහැ තමයි...

මාළු ටැංකිවලින් නිකුත් වෙන අමුතු නිල් එළියෙන් පිරුණු කුටි හරහා මම දිවුවා. දැල්ලෝ, විකට මාළුවෝ සහ ආඳන් මම දුවන දිහා පුදුමයෙන් බලා සිටියා. *සමුද්‍ර දෙවියන්ගේ පුතා! සමුද්‍ර දෙවියන්ගේ පුතා!* උන්ගේ පුංචි හිත් මුමුණනවා මට ඇසුණා. දැල්ලෝ අතරේ ප්‍රසිද්ධ කෙනෙක් වෙන්න ලැබෙන එකම කොච්චර දෙයක් ද.

මින් මැඳුර පිටුපස නතර වී මම ඇහුම්කන් දුන්නා. මට කිසිවක් ඇසුනේ නැහැ. ඒත් ටිකකින්... *වෲම්, වෲම්!* වෙනස් වර්ගයක එන්ජින් හඬක් ඇසුණා.

ෆෝබොස් හාර්ලි-ඩේවිඩ්සන් මෝටර් සයිකලයක නැගී එන දිහා මම බලා සිටියේ අදහාගන්න බැරුවයි. මේ මෝටර් සයිකලය මම මීට කලිනුත් දැකලා තිබුණා: එහි ගිනි දලු මෝස්තරයක් පින්තාරු කළ කළු එන්ජිම, පිස්තෝල රඳවන කොපු, මිනිස් හමක පෙනුම ඇති ලෙදර් අසුන. මට මුලින්ම ඒරීස්ව මුණ ගැසුණු වතාවේ දි, එයා පැදගෙන ආවේ මේ මෝටර් සයිකලයයි. ඒ වුණත් එය යුධ රථයේ ම තවත් ස්වරූපයක් කියලා නම් මට කවදාවත් හිතිලා තිබුනේ නැහැ.

"හෙලෝ, මැට්ටා," ෆෝබොස් යෝධ කඩුවක් කොපුවෙන් ඇද ගනිමින් කිවුවා. "බය වෙන්ඩ වෙලාව ඇවිත්."

එයාට මුහුණ දෙන්න අධිෂ්ඨාන කරගෙන මම, මගේ කඩුව එසෙව්වා, ඒත් ඒ වෙලාවේ ෆෝබොස්ගේ ඇස් දිප්තිමත් ව දැල්වුණා. ඒ දිහා බලලා මම වැරැද්දක් කරගත්තා.

එක්වරම මම වෙනත් තැනකට ගොස් සිටියා. මම සිටියේ අර්ධ-ලෝහිත කඳවුරේයි, මේ ලෝකයේ මම ආසම තැනයි. ඒත් ඒක ගිනි ගනිමින් තිබුණා. කැලෑවේ ගිනි ඇවිලුණා. කැබින්වලින් දුම් පිටවුණා. භෝජන මණ්ඩපයේ ග්‍රීක කුලුනු කඩා වැටිලා, මහ ගෙදර දුම් දමන සුන්බුන් ගොඩක් වෙලා. මගේ යාළුවෝ දණින්

වැටී, පිංසෙණ්ඩු වෙමින් සිටියා. ඇනබෙත්, ග්‍රෝවර් සහ අනෙක් කඳවුරුකරුවෝ හැමෝම.

*අපිව බේරගන්න, පර්සි!* එයාලා විලාප නැගුවා. *තෝරාගැනීම කරන්න!*

මගේ මුළු ඇඟම අප්‍රාණික වුණා. මම හැමදාමත් බයෙන් සිටි මොහොත මෙයයි: මට අවුරුදු දහසය ලැබුවාම සැබෑ වීමට නියමිතව තිබූ අනාවැකිය. ඔලිම්පස් කන්ද බේරාගැනීමේ හෝ විනාශ කිරීමේ තෝරාගැනීම කරන්න වෙන්නේ මටයි.

දැන් ඒ මොහොත එළඹිලා, ඒත් මොනවා කරන්න ද කියලා මට කිසිම අදහසක් නැති වුණා. කඳවුර ගිනි ගනිමින් තිබුණා. මගේ යාළුවෝ උදවු ඉල්ලා යාඥා කරමින් මගේ දිහා බලා සිටියා. මගේ හදවත වේගයෙන් සැලුණා. මට හෙලවෙන්නවත් බැරිවුණා. මම වැරදි දේ කළොත් මොනවා වෙයි ද?

ඒ වෙලාවේ මට මින් මැදුරේ මාළුන්ගේ හඬවල් ඇහෙන්න ගත්තා: *සමුද්‍ර දෙවියන්ගේ පුතා! අවදි වෙන්න!*

හදිසියේ ම, සාගරයේ බලය නැවතත් මගේ වටා තියෙන බව මට දැනුණා. කරදිය ලීටර් සිය ගාණත්, මාළු වර්ග දහස් ගාණක් මගේ අවධානය ගන්න උත්සහ කරමින් සිටියා.

මම සිටියේ කඳවුරේ නෙවෙයි. ඒක මායා දසුනක් විතරයි. ෆෝබොස් මට, මගේ ලොකුම බය පෙන්වා දෙමිනුයි සිටියේ.

තදින් ඇහිපිය සැලූ මට,ෆෝබොස්ගේ කඩු තලය මගේ හිසට පහත් වෙනවා පෙනුණා. එයා මාව දෙපළු කරන්න යද්දි ම මම රිප්ටයිඩ ඔසවා පහර අවහිර කළා.

මම ප්‍රතිප්‍රහාර එල්ල කර, ෆෝබොස්ගේ අත් ගොබයකට ඇන්නා. රන් පාට අයිකෝර්, දෙවිවරුන්ගේ රුධිරයෙන් එයාගේ කමිසය පෙඟුණා.

ෆෝබොස් ගොරවමින් මට පහර එල්ල කරා. මම පහසුවෙන් ඒවා මග ඇරියා. ෆෝබොස්ගේ භීතියේ බලය නැති වුණාම, එයා නිකං ම නිකමෙක් විතරයි. අඩු තරමේ එයා හොඳ සටන්කරුවෙක්වත් නෙවෙයි.



එයාව ආපස්සට තෙරපූ මම, එයාගේ මුහුණ මතින් කඩුව යවා, කම්මුලකට කැපුම් තුවාලයක් දුන්නා. එයාගේ තරහා වැඩිවෙන තරමට, සටනට ඇති දක්ෂකමත් අඩු වුණා. මට එයාව මරන්න හැකියාවක් නොතිබුණේ එයා අමරණීය කෙනෙක් නිසයි. ඒත් ඒ වෙයි. බයට අධිපති දෙවියා හිටියේ හොඳටම බය වෙලා වගෙයි.

අන්තිමේ දි එයාව වතුර උල්පත දිහාවට විසි වෙන්න මම පයින් ගැසුවා. එයාගේ කඩුව කාන්තා විවේකාගාරය තුළට විසි වුණා. මම එයාගේ සන්නාහයේ පටියකින් අල්ලගෙන එයාව මගේ මූණ ළඟට ඇදලා ගත්තා.

"ඔහේ දැන් චුත වෙලා යනවා," මම එයාට කිවුවා. "ගිහිල්ලා ක්ලැරිස්ගේ පාරෙන් ඈත්වෙලා ඉන්නවා. හැබැයි මට ආයෙම ඔහේව මුලිච්චි වුනොත්, මම ඔහේට මීට වඩා ගොඩාක් රිදෙන තැනකට, ලොකු තුවාලයක් කරලා දෙනවා!"

එයා තදින් කෙළ ගිල්ලා. "තිත්තයාටත් වාරයක් එනවා, ජැක්සන්!"

ඊට පස්සේ එයා කහ පාට වාෂ්පයකට විසිරුණා.

මම මාළුවෝ වෙතට හැරුණා. "ස්තූතියි, යාළුවනේ."

ඊට පස්සේ මම ඒරීස්ගේ මෝටර් සයිකලය දිහා බැලුවා. මීට කලින් කවදාවත් මට මහා බලගතු හාර්ලි-ඩේවිඩ්සන් යුධ රථයක් පදවන්න ලැබී තිබුනේ නැහැ, ඒත් ඒක ඒ හැටි අමාරු වෙන්නෙ කොහොමද?

එහි අසුන මතට පැන්න මම එන්ජිම ක්‍රියාත්මක කර මින් මැඳුරෙන් එළියට පදවාගෙන ගියේ ක්ලැරිස්ට උදවු කරන්නයි.

***

එයාව හොයාගන්න මට කොහෙත්ම අමාරු වුනේ නැහැ. මට කරන්න තිබුණේ මඟ දිගට විනාශ වී ඇති දේවල් අනුව යන එක විතරයි.

වැටවල් කඩා වැටී, සත්තු නිදල්ලේ දුවමින් සිටියා. බැජරයෝ සහ උණහපුළුවෝ පොප්කෝන් යන්ත්‍රය හාරවුස්සමින් සිටියා. තඩි

දිවියෙක් උද්‍යාන බංකුවක වැතිරී හිටියේ ඌ වටා විසිරුණු පරෙවි පිහාටු ගොඩකුත් සමගයි.

මම සුරතල් සතුන් සිටි කොටස අසල මෝටර් සයිකලය ගාල් කරා. එතැන එළුවන්ගේ කොටසේ ඩෙයිමොස් සහ ක්ලැරිස් සිටියා. ක්ලැරිස් දණින් වැටිලා. මම එයා වෙතට දිවුවත්, ඩෙයිමොස් රූපය වෙනස් කරගෙන සිටි විදිහ දැකලා මම එක්වරම නතර වුණා.

එයා දැන් ඒරීස් වෙලා - කළු ලෙදර් සහ අවි කණ්ණාඩිවලින් සැරසුණු උස යුධ දෙවියා මිට මෙළවූ අත ක්ලැරිස්ට ඉහළින් ඔසවද්දි, එයාගේ මුළු ඇඟම තරහින් දුම් දැමුවා.

"උඹ ආයෙමත් මාව අසමත් කරා!" යුද්ධයට අධිපති ගර්ජනා කළා. "මොනවද වෙන්නෙ කියලා මම උඹට කිවුවා නේද!"

එයා ක්ලැරිස්ට ගහන්න හැදුවා, ඒත් ක්ලැරිස් යටිගිරියෙන් කෑගසමින් ඉවතට බඩගෑවා. "එපා! කරුණාකරලා!"

"මෝඩ කෙල්ල!"

"ක්ලැරිස්!" මම මොර දුන්නා. "එයා මායාවක් විතරයි. එයාට විරුද්ධව නැගිටින්න!"

ඩෙයිමොස්ගේ රූපය සැලුණා. "මම ඒරීස්!" එයා කියා සිටියා. "එතකොට උඹ වැඩකට නැති කෙල්ලෙක්. උඹ මාව අසමත් කරයි කියලා මම දැනගෙන හිටියා. දැන් උඹට මගේ කේන්තිය විඳගන්ඩ ලැබෙයි."

මැදට පැනලා ඩෙයිමොන් සමග සටන් කරන්න මට ඕනෑ වුණත්, ඒකෙන් උදවුවක් නොවෙන බව මම කොහොමදෝ දැන සිටියා. එය ක්ලැරිස් ම කළ යුතුව තිබුණා. එයාගේ නරක ම බය මෙයයි. එය එයා විසින් ම මැඩපවත්වා ගත යුතු වුණා.

"ක්ලැරිස්!" මම කතා කළා. එයාගේ බැල්ම මගේ දිහාවට යොමු වෙද්දි, එය රඳවා ගන්න මම උත්සහ කළා. "එයාට විරුද්ධව නැගිටින්න!" මම කිවුවා. "එයා කරන්නෙ කටමැත දොඩවන එක විතරයි. නැගිටින්න!"

"මට... මට බැහැ."

"ඔව්, ඔයාට පුළුවන්. ඔයා රණ ශූරියක්. නැගිටින්න."



එයා පැකිළුණා. ඊට පස්සෙ එයා නැගිටින්න පටන් ගත්තා.

. "උඹ මොනවද කරන්නේ?" ඒරීස් මොර ගැසුවා. "බිම වැතිරිලා අනුකම්පාව යදිනවා, කෙල්ලේ!"

ක්ලැරිස් සැලෙන හුස්මක් ගත්තා. "බැහැ." එයා බොහොම හෙමින් කිවුවා.

"මොකක්?"

එයා කඩුව එසෙව්වා. "ඔහේට බය වෙලා ඉඳලා මට දැන් ඇතිවෙලා."

ඩෙයිමොස් පහරක් එල්ල කළත්, ක්ලැරිස් එය ඉවතට හැරෙව්වා. එයාව ගැස්සුණත්, බිම වැටුනේ නැහැ.

"ඔහේ ඒරීස් නෙවෙයි," ක්ලැරිස් කිවුවා. "අඩු ගාණේ ඔහේ හොඳ සටන්කාරයෙක්වත් නෙවෙයි."

බලාපොරොත්තු සුන් වීම නිසා ඇති වූ කේන්තියෙන් ඩෙයිමොස් ගෙරෙව්වා. එයා ඊළඟ පහර දෙද්දි, ක්ලැරිස් සූදානම්ව සිටියා. එයාව නිරායුධ කළ ක්ලැරිස් එයාගේ උරහිසට ඇන්නා - ගොඩක් ගැඹුරට නෙවෙයි, ඒත් සුළු දෙවියෙකුට වුණත් රිදෙන තරමට.

වේදනාවෙන් උඩු බිරුව එයා දිලිසෙන්න පටන් ගත්තා.

"ඒ දිහා බලන්නෙපා!" මම ක්ලැරිස්ට කිවුවා.

අපි ඇස් ආවරණය කර ගනිද්දි ම රන්වන් එළියකට - නියම දේවමය ස්වරූපයට - හැරුණු ඩෙයිමොස් අතුරුදහන් වුණා.

අපේ ඇඳුම්වලින් අදිමින් කන්න දෙයක් ඉල්ලන එළුවෝ සමග අපි තනි වී සිටියා.

මෝටර් සයිකලය නැවතත් අසුන් බැඳි කරත්තයකට හැරුණා.

ක්ලැරිස් පරිස්සමෙන් මගේ දිහා බැලුවා. එයා මුහුණේ වූ පිදුරු කෑලි සහ දාඩිය පිස දැමුවා. "ඔහේ ඒක දැක්කෙ නැහැ. ඔහේ ඒ කිසි දෙයක් දැක්කේ නැහැ."

මම දත් නියෙව්වා. "ඔයා නියමයි නේ."

Scanned by TapScanner

දූන් ගස්වලට එපිටින් රතු පාටට හැරෙමින් තිබුණු අහස දිහා එයා බැලුවා.

"කරත්තෙට නගින්ඩ," ක්ලැරිස් කිවුවා. "අපිට තවත් ගොඩක් දුර යන්ඩ තියෙනවා."

***

මිනිත්තු කීපයකට පසුව ස්ටේටන් දූපතේ තොටුපළට ළඟා වූ අපිට හරිම පැහැදිලි දෙයක් මතක් වුණා: අපි හිටියේ දූපතක.

පාලම් පාරුව කාර්, කරත්ත, අඩු තරමේ මෝටර් සයිකලයක්වත් එගොඩ කරන්න ගත්තේ නැහැ.

"නියමයි," ක්ලැරිස් කෙඳිරුවා. "දැන් අපි මොකද කරන්නේ? මේ කෙහෙම්මල වෙරසානෝ පාලමෙන් අරන් යනව ද?"

ඒකට වෙලාවක් නැහැ කියලා අපි දෙන්නම දැනගෙන හිටියා. එහි බෘක්ලින්වලට සහ නිව් ජර්සිවලට පාලම් තිබුණා, ඒත් ඒ පාරවල් දෙකෙන් මොකක් තෝරාගත්තත් කරත්තය ආපසු මෑන්හැටන්වලට රැගෙන යන්න පැය ගාණක් යාවි. ඒකත් මෙය සාමාන්‍ය කාරයක් කියලා මිනිස්සුන්ව රවට්ටන්න අපිට පුළුවන් වුනොත් විතරයි.

ඒ වෙලාවේ මට අදහසක් ආවා. "අපි කෙලින් පාරක යමු."

ක්ලැරිස්ගේ ඇහිබැම් ඇකිළුණා. "ඒ කිවුවේ?"

මම ඇස් වසාගෙන හිත ඒකාග්‍ර කරන්න පටන් ගත්තා. " කෙලින්ම ඉස්සරහට පදවන්න. යන්න!"

කරකියාගන්න දෙයක් නැතිව සිටි ක්ලැරිස් පැකිළුනේ නැහැ. "හයියාහ්!" මොර දුන් එයා අසුන්ට කසයෙන් තැළුවා. උන් කෙලින්ම වතුරට දුවන්න ගත්තා.

මම මුහුද සනීභවනය වෙන හැටි, මෙහි සිට මෑන්හැටන් දක්වා ම රළ ස්ථාවර මතුපිටක් බවට පත්වෙන හැටි හිතේ මවාගත්තා. යුධ රථය රළ අතරට වැදුණා. අශ්වයින්ගේ දුවෙන සුසුම් අපි වටා දුම් දැමුවා. ඒ අතරේ අපි නිව්යෝක් වරාය හරහා රළ මතින් කරත්තය පදවාගෙන යමින් සිටියා.

***



බැස යන ඉර දම් පාටට වියැකෙන්න ගනිද්දි ම වගේ අපි 86 ජැටියට ළඟා වුණා. යූ.එස්.එස්. ඉන්ටර්පිඩ් එක, ඒරිස්ගේ දේවස්ථානය, අළු පාට ලෝහයෙන් සැදුණු යෝධ තාප්පයක් ලෙස අපි ඉදිරියේ තිබුණා. එහි ගුවන් යානා අංගනය මත ප්‍රහාරක ගුවන් යානා සහ හෙලිකොප්ටර් තබා තිබුණා.

කරත්තය රැම්පය මත ගාල් කරාට පස්සේ මම බිමට පැන්නා.

වියළි පොළොවට පය ගහන්න ලැබීම ඒ වෙලාවේ නම් ලොකු සතුටක් වුණා. කරත්තය රළ මත රඳවා ගැනීම සඳහා බලය ඒකාග්‍ර කිරීම මේ තරම් කාලෙකට මම කරලා තිබුණු අමාරුම දේවල්වලින් එකක් වුණා. මම හිටියේ මහන්සියෙන් හෙම්බත් වෙලයි.

"ඒරිස් එන්න කලින් මම මෙහෙන් පිටවුනොත් හොඳයි," මම කිවුවා.

ක්ලැරිස් ඔළුව වැනුවා. "එයා ඔහේව දකපු ගමන් මරලා දාන්ඩ ඉඩ තියෙනවා."

"සුබ පැතුම්," මම කිවුවා. "මං හිතන්නේ ඔයා ඔයාගේ රිය පැදවීමේ විභාගයෙන් ගොඩ ගියා."

එයා තෝන් ලණුව අතේ ඔතාගත්තා. "ඔහේ දැකපු දේවල්, පර්සි. මම බය වෙලා හිටපු දේ, මං කිවුවේ-"

"මං කාටවත් ඒ ගැන කියන්නෑ."

එයා මගේ දිහා අපහසුවෙන් බැලුවා. "ෆෝබොස් ඔහේවත් බය කරා ද?"

"ඔව්. මම කදවුර ගිනි ගන්නවා දැක්කා. මගේ යාළුවෝ මගෙන් උදවු ඉල්ලලා පිංසෙණ්ඩු වුණා, ඒත් මොනවා කරන්න ද කියලා මම දැනගෙන හිටියේ නැහැ. එක තත්පරේකට, මට හෙලවෙන්නවත් බැරිවුණා. මාව කොර වුණා. ඔයාට දැනෙන්න ඇත්තේ කොහොමද කියලා මම දන්නවා."

එයාගේ ඇස් පහත වැටුණා. "මම, අහ්... මං හිතන්නේ මම කියන්ඩ ඕනෑ..." වචන එයාගේ උගුරේ ඇලිලා වගෙයි- පෙනුණේ. ක්ලැරිස්, එයාගේ ජීවිතේට එකම වතාවක්වත් කාටහරි ස්තුති කරලා ඇති ද කියලා මට විශ්වාසයක් තිබුනේ නැහැ.

"ඒක කියන්න ඕනෑ නෑ," මම එයාට කිව්වා.

මම එතැනින් යන්න හැරුණත්, එයා ආයෙමත් කතා කළා, "පර්සි?"

"ඇයි?"

"ඔහේට, අහ්, ඔහේගේ යාළුවන්ව පෙනුණ වෙලාවේ..."

"ඔයත් ඒ අතරේ හිටියා," මම දිවුරුවා. "හැබැයි කාටවත් ඒක කියන්නෙපා, හරිද? එහෙම නැති වුනොත් මට ඔයාව මරන්න වෙනවා."

එයාගේ මූණේ පුංචි හිනාවක් ඇඳුණා.

"පස්සේ වෙලාවක් හම්බ වෙමු."

"පස්සේ හම්බ වෙමු."

මම උමං දුම්රියපොළ පැත්තට යන්න ගත්තා. දිගම දිග දවසකට පස්සේ මම හිටියේ ගෙදර යන්න සූදානමින්.

■■■■■

# පර්සි ජැක්සන් සහ හේඩීස්ගේ අසිපත

නත්තල පාතාල ලෝකයේ දි සැමරීම කොහෙත්ම මගේ අදහසක් නම් නෙවෙයි.

මෙහෙම දෙයක් වෙනවා කියලා දන්නවා නම් මම ලෙඩ නිවාඩුවක්වත් දානවා. එහෙනම් මට ටයිටන් කෙනෙක් සමග සටනකුත්, මගේ යාළුවන්ව සහ මාව සදාකාලික නිරයට ඇද වැටෙන්න ගිය උගුලකුත් මග අරින්න තිබුණා.

ඒත් නැහැ. මට මගේ මෝඩ ඉංග්‍රීසි විභාගයට මුහුණ දෙන්න තිබුණා.

ඉතින් ගුඩ් උසස් පාසලේ හේමන්ත වාරාවසාන දවසේ මගේ වසරේ අනෙක් ළමයි ටිකත් එක්ක ශ්‍රවණාගාරයේ වාඩිවෙලා මම උත්සහ කරමින් සිටියේ මම-කියවලා-නැති-ඒත්-මම-කියෙවුවා-වගේ-අඟවන 'ටේල් ඔෆ් ටූ සිටීස්' පොත ගැන රචනාවක් සම්පූර්ණ කරන්නයි.

ඒ වෙලාවේ වේදිකාවට කඩා පැන්න මිසිස් ඕ'ලෙරී පිස්සුවෙන් වගේ බුරන්න ගත්තා.

මිසිස් ඕ'ලෙරී කියන්නේ මගේ යම බලු හුරතලා. හමර් ට්‍රක් රථයක් විතර ලොකු එයා කළු පාට ලෝමවලින් වැසුණු, දැළි පිහි වගේ තියුණු දත්, මුවහත තැබුව තරම් තියුණු නිය පහුරු සහ දිලිසෙන රතු

ඇස් ඇති රාක්ෂයෙක්. එයා හරිම හුරතල්. ඒ වුණත් සාමාන්‍යයෙන් එයා ඉන්නේ අපේ උප දෙවි පුහුණු කඳවුර, අර්ධ-ලෝහිත කඳවුරේයි.

ඉතින් එයා අපේ නත්තල් ගස්, සැන්ටා එල්ෆයෝ සහ අනෙකුත් නත්තල් සැරසිලි පෙරළා පොඩි කරමින් වේදිකාව උඩ ඉන්නවා දකිද්දි මට ටිකක් විතර පුදුම හිතුණා.

හැමෝම ඔළුව ඔසවා බැලුවා. අනෙක් ළමයි බයෙන් කුලප්පු වෙලා දොර දිහාවට දුවන්න ගනියි කියලා මට සහතික වුණත්, එයාලා කළේ මහ හඬින් හිනාවීම විතරයි.

"ආච්චි, ෂෝයි නේ!" ගැහු ළමයි දෙතුන් දෙනෙක් කියනවා ඇහුණා.

අපේ ඉංග්‍රීසි ගුරුතුමා, ආචාර්ය බෝරින්ග් (විහිළුවක් නෙවෙයි; ඒක තමයි එයාගේ ඇත්ත නම), ඇස් කණ්ණාඩි දෙක හරි ගස්සාගෙන රවා බැලුවා.

"හරි," එයා කිවුවා. "කාගෙද මේ පූඩ්ල් බල්ලා?"

මම සුසුමක් හෙළා හිත නිදහස් කරගත්තා.

දෙවිවරුන්ට ස්තුති වෙන්න මීදුම - ඒ කියන්නේ, වටපිටාවේ ඇති දේවල්වල සැබෑ ස්වරූපය මනුෂ්‍යයන්ගේ ඇස්වලින් සඟවන මායා පටලය මාව බේරාගෙන තිබුණා. එයින් යථාර්ථය වෙනතකට හරවන හැටි මීට කලිනුත් මට ඕනෑ තරම් දකින්න ලැබී තිබුණා, ඒත් මිසිස් ඕ'ලෙරීව පූඩ්ල් බල්ලෙක් විදිහට? ඒක නම් මාරයි.

"ම්, මගේ, සර්," මම කතා කළා. "සමා වෙන්න! එයා මගේ පස්සෙන් ඇවිල්ලා වගේ."

මට පිටුපසින් සිටි කවුදෝ 'පුංචි බලු රාළේ' උරුවම් බාන්න ගත්තා. ළමයින්ගේ හිනාව පුපුරා ගියා.

"ඔය ඇති!" ආචාර්ය බෝරින්ග් සැර කළා. "පර්සි ජැක්සන්, මේ වාර විභාගේ. මට මෙතැන පූඩ්ල් බල්ලෝ තියාගන්න බැහැ-"

"වූෆ්ෆ්!" මිසිස් ඕ'ලෙරීගේ බිරුමට ශ්‍රවණාගාරය සැලුණා. එයා වලිගය වනද්දි තවත් නත්තල් සැරසිලි කීපයක් පෙරළුණා. ඊට පස්සේ එයා ඉදිරි ගාත්වලින් වකුටු වෙලා මගේ දිහා බලා සිටියේ මට එයා පස්සේ එන්න කියනවා වගෙයි.



"මම එයාව එළියට අරන් යන්නම්, සර්," මම කිවුවා. "කොහොම වුණත් මම උත්තර ලියලත් ඉවරයි."

උත්තර පත්‍රිකා කට්ටලය වසා දැමූ මම වේදිකාවට දිවුවා. උඩ පනිමින් පිටවීමේ දොර වෙත දුවන මිසිස් ඕ'ලෙරී පසුපස මම දුවද්දි, තවමත් හිනා වෙමින් සිටි අනෙක් ළමයි කෑගැහුවා, "පස්සෙ හම්බ වෙමු, පූඩ්ල් කොල්ලා!"

★★★

මිසිස් ඕ'ලෙරී නැගෙනහිර 81වෙනි වීදිය දිගේ ගඟ දිහාවට දිවුවා.

"හෙමින් යං!" මම මොර දුන්නා. "ඔයා කොහෙද යන්නේ?"

සමහර පදිකයින් මගේ දිහා අමුතු විදිහට බලනවා මම දැක්කා, ඒත් මේ නිව්යෝර්ක් නගරය නේ. ඉතින් එයාලට දකින්න ලැබිලා තියෙන අමුතු ම දේ පූඩ්ල් බල්ලෙක් පස්සේ දුවන කොල්ලෙක්ගේ දසුන වෙන්න බැහැ.

මිසිස් ඕ'ලෙරී මට සෑහෙන ඉස්සරහින් දිවුවා. ඉඳහිට සැරයක් නැවතී ආපස්ස බලන එයා බිරුවේ 'ඉක්මනට එනවා, කම්මැලියෝ!' කියන්න වගෙයි. එයා උතුරු දෙසට ගොඩනැගිලි කාණ්ඩ තුනක් පසු කරමින්, කෙලින්ම 'කාර්ල් ස්කර්ස්' උයනට දිවුවා. අන්තිමේ දි මට එයාට කිට්ටු කරන්න ලැබෙද්දි ම, යකඩ වැටක් උඩින් පැන්න එයා හිමෙන් වැසුණු පඳුරුවලින් සැදි බැම්මක් තුළට නොපෙනී ගියා.

"අයියෝ, මෙන්න මෙහෙ එන්නකෝ," මම මැසිවිලි නැගුවා. මට ඉස්කෝලේදි මගේ කබාය ගන්න අවස්ථාවක් ලැබුනේ නැහැ. මම හිටියේ දනටමත් සීතලට ගල් වෙලයි, ඒ වුණත් වැට උඩට බඩ ගෑව මම මිදුණු පඳුරු ලන්දට පැන්නා.

එහි අනෙක් පැත්තේ තිබුණේ එළිපෙහෙළි කළ පිටියක් -කොළ හැලී නිරුවත් වූ ගස්වලින් වට වූ, අයිස්වලින් වැසුණු තණ ගස් ඇති අක්කර බාගයක විතර භූමියක්.

මිසිස් ඕ'ලෙරී වටපිටාව ඉව කරමින්, පිස්සුවෙන් වගේ වලිගය වනමින් සිටියා. මට නම් එතැන කිසිම අසාමාන්‍ය දෙයක් පෙනුනේ නැහැ. මට ඉදිරියෙන්, වානේ-පැහැති නැගෙනහිර ගඟ අලස ලෙස ගලා ගියා. ක්වීන්ස්වල වහලවල් මතින් සුදු පාට දුම්

ඉහළ නැගුණා. මට පිටුපසින් සීතලෙන් සීත වුණු නැගෙනහිර ඉහළ කොටස නිහඬව බලා සිටියා.

හේතුවක් නොතේරුණත්, මගේ බෙල්ල පිටුපස පොපියන්න ගත්තා. මම, මගේ බෝල්පොයින්ට් පෑන පිටට අරන්, එහි කොපුව ගැලෙව්වා. එසැණින් ම මගේ ලෝකඩ කඩුව, රිජ්ටයිඩ් බවට හැරුණු එය හේමන්ත එළියෙන් යාන්තමින් දිලිසුණා.

මිසිස් ඕ'ලෙරී ඔළුව ඔසවා බැලුවා. එයාගේ නාස්පුඩු නළියන්න ගත්තා.

"මොකද, කෙල්ලේ?" මම රහසින් ඇසුවා.

පඳුරු සෙලවී, රන් පාට මුවෙක් එළියට පැන්නා.

මම රන් පාට කියලා අදහස් කළේ කහ පාට එහෙම නෙවෙයි. මේ සතාට ලෝහමය ලොම් තට්ටුවක් සහ නියම කැරට් දහ හතරෙන් හැදූ පෙනුම ඇති අං තට්ටුවක් තිබුණා. රන්වන් එළියකින් දිලිසුණු ඌ දිහා බලන්නත් බැරි තරම් දීප්තිමත්. මට හිතෙන්නේ, මම ඒ තාක් කාලෙකට දකපු ලස්සන ම සතා ඒකායි.

මිසිස් ඕ'ලෙරී තොල කට ලෙව කෑවේ හරියට 'මුව බර්ගර්ස්!' කියලා හිතනවා වගෙයි.

ඒත් එක්කම නැවතත් සෙලවෙන්න ගත් පඳුරු තුළින් හිස් ආවරණයක් සහිත පර්කාවකින් සැරසුණු රුවක් එළිමහන් බිමට පැන්නේ දුන්නකුත් මානාගෙනයි.

මම, මගේ කඩුව එසෙව්වා. ඒ ගැහැනු ළමයා මට දුන්න මැනුවා - ඊට පස්සේ ගල් ගැහුණා.

"පර්සි?" එයා, එයාගේ පර්කාවේ රිදී පාට හිස් ආවරණය පිටුපසට තල්ලු කළා. එයාගේ කළු කොණ්ඩය මට මතක තිබුණාට වඩා දිගු වී තිබුණත්, ඒ දීප්තිමත් නිල් පාට ඇස් දෙකත්, එයාව ආර්ටෙමිස්ගේ පළමු ලෙෆ්ටිනන්ට් බව අඟවන රිදී ඔටුන්නත් මම හොඳින් දන සිටියා.

"තාලියා!" මම කිවුවා. "ඔයා මොනවද මෙහෙ කරන්නේ?"

"රත්තරන් මුවෙක්ව එළවනවා," එයා කිවුවේ හරියට ඒක හරිම පැහැදිලි කාරණයක් වගෙයි. "ඌ තමයි ආර්ටෙමිස්ගේ පූජනීය



සතා. මං හිතුවේ ඌ මොකක් හරි නිමිත්තක් වෙන්න ඇති කියලා. එතකොට, ම්..." එයා සැකයෙන් වගේ මිසිස් ඕ'ලෙරී දිහාවට ඔළුව වැනුවා. "මේකා මෙතැන මොනවද කරන්නෙ කියලා ඔයා මට කියනවා ද?"

"එයා තමයි මගේ හුරතලා - මිසිස් ඕ'ලෙරී, එපා!"

මිසිස් ඕ'ලෙරී මුවාට ඉව කරමින් සිටියේ ඌගේ පෞද්ගලික නිදහස සතේකටවත් මායිම් නොකරයි. මුවා පස්සා ගාත්වලින් යම බැල්ලගේ හොම්බට ගැසුවා. ඉක්මනින් ම, ඒ දෙන්නා එළිමහන් බිමේ අමුතු ජාතියේ අල්ලන සෙල්ලමක් කරන්න ගත්තා.

"පර්සි..." තාලියාගේ ඇහිබැම් එකට හා වුණා. "මේක අහම්බෙන් වුණ දෙයක් වෙන්න බැහැ. ඔයාටයි මටයි දෙන්නටම එකම වෙලාවට, එකම තැනකට එන්න වුණ එක?"

එයා කිවුවා හරි. උප දෙවිවරුන්ට අහඹු සිදුවීම් වෙන්නේ නැහැ. තාලියා හොඳ යාළුවෙක් වුණත්, මම අවුරුද්දකින් විතර එයාව දකලා තිබුනේ නැහැ. ඒත් දැන්, හදිසියේ ම, මෙන්න අපි මුණ ගැහිලා.

"කවුරු හරි දෙවි කෙනෙක් අපිත් එක්ක පැටලෙනවා," මම අනුමාන කළා.

"ඒ වගේ."

"ඒ වුණාට, ඔයාව දකින්න ලැබුණට සතුටුයි."

එයා අමුතු විදිහට හිනාවුණා. "ඔව්. අපිට මුළු ඇඟම තනි කැල්ලක් විදිහට තියාගෙන, මේකෙන් එළියට යන්න ලැබුනොත්, මම ඔයාට චීස් බර්ගර් එකක් අරන් දෙනවා. ඇනබෙත්ට කොහොමද?"

මට උත්තර දෙන්න ඉඩ ලැබෙන්න කලින්, වලාකුළක් ඉර වසාගත්තා. රන් මුවා දිලිසී අතුරුදහන් වුණේ, කොළ රොඩු ගොඩකට බුරමින් සිටි මිසිස් ඕ'ලෙරීව තනි කරමින්.

මම මගේ කඩුව සූදානම් කරගත්තා. තාලියා දුන්න මැනුවා. ඉබේටම අපි දෙන්නා පිටට පිට තබාගත්තා.

එළිමහන් බිමට ඉහළින් අඳුරු වලාකුළ පසු වී යද්දිම, පිරිමි ළමයෙක් එයින් එළියට පැකිළී වැටුණේ හරියට එයාව කවුරු හරි විසි කළා වගෙයි. එයා අපේ දෙපා මුල තණකොළ උඩට වැටුණා.

Scanned by TapScanner

"ඌයි," එයා කෙඳිරුවා. එයා ඇඳ සිටි ගගන යාත්‍රිකයින්ගේ ජැකට්ටුව පිස දමුවා. අවුරුදු දොළහක් විතර වයසැති කළු කොණ්ඩාකාරයෙක් වූ එයා ජීන්ස් එකකින් සහ කළු ටී-ෂර්ට් එකකින් සැරසී සිටියා. එයාගේ දකුණු අතේ ඇඟිල්ලක හිස්කබලක හැඩයේ රිදී මුද්දක් තිබුණා. එයාගේ පැත්තකින් කඩුවක් එල්ලුණා.

"නිකෝ?" මම කිවුවා.

තාලියාගේ ඇස් ලොකු වුණා. "බියන්කාගේ චූටි මල්ලි?"

නිකෝ තරහෙන් රවා බැලුවා. බියන්කාගේ චූටි මල්ලි කියලා එයාව හඳුන්වනවාට එයා කැමති නැතුව ඇති කියලා මට හිතුණා. ආර්ටෙමිස්ගේ දඩයක්කාරියක් වූ එයාගේ අක්කා, අවුරුදු දෙකකට කලින් මියගියා. ඒ මාතෘකාව නිකෝට තවමත් වේදනා දෙන්නක් වුණා.

"ඇයි ඔයාලා මාව මෙහෙට ගෙනාවේ?" එයා අසන්තෝසයෙන් ඇසුවා. "විනාඩියකට කලින් මම හිටියේ නිව් ඔර්ලන්ස්වල සොහොනක. ඊළඟ විනාඩියේ දී- මේ නිව්යෝක් ද? හේඩීස්ගේ නාමෙන්, මම මොනවද නිව්යෝක්වල කරන්නේ?"

"අපි නෙවෙයි ඔයාව නිව්යෝක්වලට ගෙනාවේ," මම දිවුරුවා. "අපිව-" මගේ කොඳු නාරටිය දිගේ ගැස්මක් පැතිරුණා. "අපිව මෙහෙට අරන් ඇවිල්ලා. අපි තුන්දෙනාවම."

"ඔයා මොනවා ගැන ද කියවන්නේ?" නිකෝ ප්‍රශ්න කළා.

"ලොකු තුන්කට්ටුවේ ළමයි තුන්දෙනාව," මම කිවුවා. " සියුස්ගෙයි, පොසෙයිඩන්ගෙයි, හේඩීස්ගෙයි."

තාලියා තද හුස්මක් ගත්තා. "අනාවැකිය. ඔයා හිතන්නේ ක්‍රෝනොස්..." එයා ඒ අදහස සම්පූර්ණ කළේ නැහැ.

අපි හැමෝම මහා අනාවැකිය ගැන දන සිටියා: ටයිටන්වරු සහ දෙවිවරු අතර යුද්ධයක් ඇතිවීමට නියමිතව තිබුණා. එහිදී ප්‍රධාන දෙවිවරු තුන්දෙනාගේ දරුවන්ගෙන් ඊළඟට අවුරුදු දහසය ලබන කෙනා ලෝකය බේරාගැනීමේ හෝ විනාශ කිරීමේ තීරණය ගන්නා බව එයින් කියවුණා. ඒ කියන්නේ අපි තුන්දෙනාගෙන් කෙනෙක්. පහුගිය අවුරුදු කීපය පුරාවටම, ටයිටන් රජා ක්‍රෝනොස් අපිව වෙන වෙනම මෙහෙයවන්න උත්සහ කර තිබුණා. දැන්... එයා අපි තුන්



දෙනාවම එකතු කරගෙන මොනවා හරි කරන්න සැලසුම් කරලාවත් ද?

පොළොව දෙදුරුවා.

නිකෝ එයාගේ කඩුව ඇදලා ගත්තා - ස්ටයිජියන් යකඩින් සෑදූ කළු තලයක්.

ආපස්සට පැන්න මිසිස් ඕ'ලෙරී අනතුරු අඟවමින් බුරන්න ගත්තා. එයා අනතුරු අඟවන්න උත්සහ කරන්නේ මටයි කියලා මම තේරුම් ගනිද්දි පරක්කු වැඩියි.

තාලියාට, නිකෝට සහ මට යටින් පොළොව විවර වෙද්දි, අපිව අන්ධකාරය තුළට ඇද වැටුණා.

***

සදාකාලයට ම පහළට වැටෙමින් ඉන්න, එහෙමත් නැත්නම් සමහරවිට පතුලේ වැදිලා උප දෙවි-පෑන් කේක් එකක් වෙන්න වෙයි කියලයි මම බලාපොරොත්තු වුණේ. ඒත් ඊළඟට මට තේරුම් ගිය දේ වුණේ, තාලියා, නිකෝ සහ මම උයනක සිටගෙන සිටින බවයි.

අපි තුන්දෙනා තවමත් සිටියේ භීතියෙන් බෙරිහන් දෙමින් බව තේරුම් ගියාම මට මහා අමන ගතියක් දැනුණා.

"මොකක්ද- කොහෙද අපි ඉන්නේ?" තාලියා ඇසුවා.

උයන අඳුරු තැනක් වුණා. රිදී මල් පේළිවලින් නිකුත් වූ තුනී දිස්නය, පැල තවාන්වල කර තිබුණු යෝධ මැණික් ගල් මතට වැටී පරාවර්තනය වුණා - ෆුට්බෝල තරම් ලොකු දියමන්ති, නිල් කැට සහ රතු කැට. අපිට ඉහළින් ආරුක්කු හැඩයට නැමී තිබුණු ගස්වල අතු තැඹිලි පාට මල් සහ ප්‍රනීත-සුවඳ ඇති පලතුරින් පිරී තිබුණා. වාතය සිසිල් සහ තෙත් වුණා - ඒත් එහි නිව්යෝර්ක් සීත ඍතුවක් වගේ නෙවෙයි. ගුහාවක් ඇතුළේ වගෙයි.

"මීට කලින් මම මෙහෙට ඇවිල්ලා තියෙනවා," මම කිවුවා.

නිකෝ දෙළුම් ගසකින් ගෙඩියක් කඩා ගත්තා. "මගේ කුඩම්මා පර්සෙෆෝන්ගේ උයන." එයා මූණ ඇඹුල් කරගෙන ගෙඩිය බිම දැමුවා. "කිසි දෙයක් කන්නෙපා."

Scanned by TapScanner

ඒක මට දෙසැරයක් කියලා දෙන්න ඕනෑ වුණේ නැහැ. පාතාල ලෝකයේ කෑම එක වරක් රස බැලුවොත්, අපිට ආයේ කවදාවත්ම මෙහෙන් පිට වෙන්න බැරි වෙයි.

"ඔන්න," තාලියා අනතුරු ඇඟෙව්වා.

හැරී බැලුව මට දකින්න ලැබුණේ එයා සුදු ඇඳුමකින් සැරසුණු උස ගැහැණු කෙනෙකුට දුන්න මානාගෙන ඉන්න විදිහයි.

මුලින්ම මම හිතුවේ ඒ ගැහැණු කෙනා අවතාරයක් කියලයි. එයාගේ ඇඳුම එයා වගේ දුමක් වගේ රැළි නැඟුවා. එයාගේ දිග කළු කොණ්ඩය ගුරුත්වාකර්ෂණයෙන් මිදිලා වගේ පාවෙමින්, කැරළි ගැසුණා. එයාගේ මුහුණ සුන්දර වුණත් මිනියක් සගේ සුදුමැලි පාට ගත්තා.

එයාගේ ඇඳුම ඇත්තෙන්ම සුදු පාට නොවෙන බව ටිකකින් මට තේරුම් ගියා. එය සෑදී තිබුණේ හැම ආකාරයකම වගේ වෙනස්වෙන පාටවලින් - රතු, නිල් සහ කහ පාට මල් රෙද්ද මත පිපෙමින් තිබුණා - ඒත් එය අසාමාන්‍ය ලෙස මැලවී තිබුණා. එයාගේ ඇසුත් ඒ විදිහටම වෛවර්ණවත්, එහෙත් වියැකී ගිය පෙනුමක් ගත්තේ, හරියට පාතාල ලෝකය එයාගේ ජීව බලය උරාගෙන වගෙයි. මතුපිට ලෝකයේදි එයා ගොඩක් ලස්සන, වගේම කාන්තිමත්ව ඉදීවි කියලා මට හැඟුණා.

"මම තමයි පර්සෙෆෝන්," එයා කිවුවේ තුනී සහ වියළි කටහඬකින්. "පිළිගන්නවා, උපදෙව්වරුනි."

නිකෝ දෙළුම් ගෙඩිය බූට් සපත්තුවෙන් පාගා පොඩි කර දැමුවා. "පිළිගන්නවා? අන්තිම වතාවේ වෙච්ච දේවල්වලටත් පස්සේ, මාව පිළිගන්න තරම් ඔයාට ලැජ්ජා නැතිකමක් තියෙනව ද?"

මම අපහසුවෙන් එහෙ මෙහෙ වුණේ, දෙවි කෙනෙකුට ඒ විදිහට කතා කළොත් ඔයාව දූවිලි බෝලෙකට කුඩුවෙලා යන්න ඉඩ තියෙන නිසයි. "අම්, නිකෝ-"

"ඒකට කමක් නෑ," පර්සෙෆෝන් නීරස ලෙසින් කිවුවා. " අපිට පුංචි පවුල් ප්‍රශ්නයක් ඇති වුණා විතරයි."

"පවුල් ප්‍රශ්නයක්?" නිකෝ කෑ ගැසුවා. "ඔයා මාව ඩැන්ඩෙලියන් පැළේකට හැරෙව්වා !"



පර්සෙෆෝන් එයාගේ සුළු පුතාව නොසලකා හැරියා. "මම කිය කිය හිටිය විදිහට, උප දෙව්වරුනි, මම ඔයාලව මගේ උයනට සාදරෙන් පිළිගන්නවා."

තාලියා දුන්න පාත් කළා. "රත්තරන් මුවාව එවුවේ ඔයා?"

"ඒ වගේම නිකෝව එකතු කරගෙන ආව වලාකුළත්," දෙවඟන පිළිගත්තා. "තව යම බල්ලාවත්."

"ඔයා මිසිස් ඕ'ලෙරිව පාලනේ කරා?" මම ඇසුවා.

පර්සෙෆෝන් උරහිස් ඇකිළුවා. "එයත් පාතාල ලෝකයේ සතෙක්, පර්සි ජැක්සන්. මම කළේ ඔයාව පිටිටනියට එක්ක එන එක ජොලි වැඩක් වෙයි කියන යෝජනාව එයාගේ හිතට දැම්ම එක විතරයි. ඔයාලා තුන්දෙනාව එකට ගෙනෙන එක අත්‍යවශ්‍ය දෙයක් වුණා."

"ඇයි?" මම ඇසුවා.

පර්සෙෆෝන් මගේ දිහා සැලකිල්ලෙන් බලා ඉද්දි මට දැනුණේ මගේ බඩ ඇතුළේ සීතල චූටි මල් ගොඩක් පිපෙනවා වගෙයි.

"හේඩීස් උතුමාට ප්‍රශ්නයක් වෙලා," එයා කිවුවා. "ඔයාට හොඳ මොනවද කියලා දන්නවා නම්, ඔයා එයාට උදවු කරයි."

***

අපි උයනට මුහුණලා පිහිටි අඳුරු ආලින්දයක වාඩිවුණා. පර්සෙෆෝන්ගේ පරිවාර සේවිකාවන් කෑම සහ බීම රැගෙන ආවත්, අපි ඒවාට අතක්වත් තැබුවේ නැහැ. ඒ පරිවාර සේවිකාවෝ මැරුණු අය නොවුණා නම්, හැඩකාරියෝ වෙන්න තිබුණා. කහ පාට ඇඳුම්වලින් සැරසී සිටි එයාලා ඩේසි සහ හෙම්ලොක් පලඳනා හිසේ දමාගෙන සිටියා. ඇතුළට ගිළුණු ඇස් ඇති එයාලා වවුලන්ගේ වගේ චර-චර හඬකින් කතා කරා.

රිදී සිංහාසනයක වාඩි වූ පර්සෙෆෝන් අපි දිහා සැලකිල්ලෙන් බලා සිටියා. "මේ වසන්ත කාලේ වුණා නම්, මට මතුපිට ලෝකෙ දි නියම විදිහට ඔයාලට ආචාර කරන්න තිබුණා. ඒත් අනේ, මේ සීත ඍතුවේ දි මට කරන්න පුළුවන් උපරිම මෙච්චරයි."

Scanned by TapScanner

එයාගේ හඬේ තිබුණේ කහටක්. මං හිතන්නේ, හේඩීස් සමග අවුරුද්දෙන් බාගයක් ගෙවන්න වීම ගැන ගතවුණ අවුරුදු දහස් ගාණට පස්සේ තවමත් එයා හිටියේ අමනාපයෙන්. එයාව පාණ්ඩු පාටට හැරිලා, තැනට නොගැළපෙන ලෙස සිටියේ වසන්ත කාලයේ පරණ ඡායාරූපයක් වගෙයි.

මගේ සිතුවිලි කියෙවුවා වගේ එයා මගේ පැත්තට හැරුණා. "හේඩීස් තමයි මගේ සැමියා සහ ස්වාමියා, තරුණ කොල්ලෝ. මම එයා වෙනුවෙන් ඕනෑම දෙයක් කරනවා. ඒත් මේ වෙලාවේදි මට ඔයාලගේ උදවු ඕනෑ, ඉක්මනින්ම. ඒක හේඩීස් උතුමාණන්ගේ කඩුව සම්බන්ධ දෙයක්."

නිකෝ රවා බැලුවා. "මගේ තාත්තට කඩුවක් නැහැ නේ. එයා යුද්ධවලට පාවිච්චි කරන්නෙ යෂ්ටියයි, හීතියේ හිස්වැසුමයි විතරයි."

"එයාට කඩුවක් තිබුනේ නැහැ," පර්සෙෆෝන් නිවැරදි කළා.

තාලියා කෙලින් වී වාඩි වුණා. "එයා අලුත් 'බලයේ සංකේතයක්' හදනවා? සියුස්ගේ අවසර නැතුව?"

වසන්තයට අධිපති දෙවඟන අතක් දිගු කළා. මේසයට ඉහළින් රූපයක් සැලෙමින් පණ ගැසුවාඃ කළු ගිනි දළු ඇවිලෙන කම්මලක, ඇටසැකිලි කම්මල්කරුවෝ ලෝහමය හිස්කබල් හැඩයේ මිටිවලින් පහර දෙමින්, දිගු යකඩයක් තලයකට තළමින් සිටියා.

"ටයිටන්ලාගේ යුද්ධය අපි මතට පාත් වෙන්න හොඳටෝම ළඟයි," පර්සෙෆෝන් කිවුවා. "මගේ හේඩීස් උතුමා සූදානම් වෙලා ඉන්න ඕනෑ."

"ඒත් හේඩීස්ට අලුත් ආයුධයක් හදන්න සියුස්යි පොසෙයිඩනුයි කවදාවත් ඉඩ දෙන්නෙ නැති වෙයි!" තාලියා විරෝධය පෑවා. "ඒකෙන් එයාලගේ බලය-බෙදීමේ ගිවිසුමේ සමබරකම නැති වෙයි."

පර්සෙෆෝන් ඔළුව හෙල්ලුවා. "ඔයා අදහස් කළේ, ඒකෙන් හේඩීස් එයාලට සමාන වෙයි කියල ද? මාව විශ්වාස කරන්න, සියුස්ගේ දියණිය, මරණයට අධිපතිට, එයාලගේ සහෝදරයන්ට විරුද්ධව යන්න කිසිම අරමුණක් නැහැ. කොහොම වුණත්, එයාලා කවදාවත් මේක තේරුම් ගන්නෙ නැති වෙයි කියලා එයා දැනගෙනයි හිටියේ, අන්න ඒ නිසයි එයා මේ තලය රහසිගතව හැඩ තැලුවේ."



මේසයට ඉහළින් වූ රූපය සැලුණා. පිල්ලි කම්මල්කරුවෙක් ගිනියම් වී දිලිසෙන කඩු තලය ඉහළට එසෙව්වා. එය පතුලට මොකක්දෝ අමුතු දෙයක් සවි කර තිබුණා - මැණිකක් නම් නෙවෙයි. ඒක හරියට...

"අර තියෙන්නේ යතුරක් ද?" මම ඇසුවා.

නිකෝ හුස්ම හිරවුණු හඬක් නැගුවා. "හේඩීස්ගේ යතුරු?"

"පොඩ්ඩක් ඉන්න," තාලියා කිවුවා. "මොනවද හේඩීස්ගේ යතුරු කියන්නේ?"

නිකෝගේ මුහුණ එයාගේ කුඩම්මාගේ මුහුණටත් වඩා සුදුමැලි වුණා. "මරණය අගුළු දාන්න, අගුළු අරින්න පුළුවන් රත්තරන් යතුරු කට්ටලයක් හේඩීස් ළඟ තියෙනවා. අඩු තරමේ... එහෙම තමයි ජනප්‍රවාදේ කියන්නේ."

"ඒක ඇත්තක්," පර්සෙෆෝන් කිවුවා.

"කොහොමද මරණයට අගුළු දාන්නෙයි, අගුළු අරින්නෙයි?" මම ඇසුවා.

"ආත්මයක් පාතාල ලෝකයේ හිර කරන්න යතුරුවලට බලය තියෙනවා," පර්සෙෆෝන් කිවුවා. "එහෙමත් නැත්නම් නිදහස් කරන්න."

නිකෝ තදින් කෙළ ගිල්ලා. "ඒ යතුරුවලින් එකක් කඩුවකට හයි කරලා නම්-"

"කඩුව පාවිච්චි කරන කෙනාට මළවුන් රැස් කරන්න පුළුවන් වෙනවා," පර්සෙෆෝන් කිවුවා, "එහෙමත් නැත්නම් කඩුව යාන්තමින් ගෑවීමෙන් විතරක් වුණත් ඕනෑම ජීවියෙක්ව මරා දාලා, එයාගේ ආත්මය පාතාල ලෝකයට එවන්න පුළුවන්."

අපි හැමෝම නිහඬ වුණා. කෙළවරක අඳුරු දිය උල්පත ගොරගොර ගෑවා. අපිව සදාකාලයටම පාතාල ලෝකයේ රඳවා ගත හැකි පලතුරු සහ කැවිලි බන්දේසිවල තබා පිළිගන්වමින් සේවිකාවෝ අපි වටේට පාවුණා.

"ඒක නම් දුෂ්ට කඩුවක්," අන්තිමේ දි මම කිවුවා.

"ඒකෙන් හේඩීස්ව කවදාවත් නවත්තන්න බැරි කෙනෙක් වෙනවා," තාලියා එකඟ වුණා.

"ඉතින් ඔයාලට පේනවා නේ," පර්සෙෆෝන් කිවුවා. "ඒක ආපහු හොයාගන්න ඔයාලා උදවු කරන්න ම ඕනෑ ඇයි කියලා."

මම එයා දිහා ඇස් ලොකු කරගෙන බලා සිටියා. "ඔයා කිවුවේ ඒක ආපහු හොයාගන්න කියල ද?"

පර්සෙෆෝන්ගේ ඇස් සුන්දර සහ මාරාන්තික ලෙස බරපතළ වුණා, හරියට විසකුරු මල් වගෙයි. "තලේ වැඩ මුළුමනින්ම වගේ ඉවර වෙලා තියෙද්දි ඒක හොරකම් කරලා. ඒ කොහොමද කියලා මම දන්නෙ නැහැ, ඒත් මං සැක කරන්නේ ඒක කරේ උප දෙවියෙක්, ක්‍රෝනොස්ගේ වැඩකාරයෙක්. මේ තලය ටයිටන් රජාගේ අතට ගියොත්-"

තාලියා වේගයෙන් නැගිට්ටා. "ඔයා ඒ කඩුව හොරකම් කරන්න ඉඩ ඇරියා? මොන මෝඩකමක් ද ඒක? මේ වෙද්දි ක්‍රෝනොස් අතට ඒක ගිහිල්ලත් ඇති!"

තාලියාගේ ඊතල දිග නටු ඇති රෝස මල්වලට හැරුණා. එයාගේ දුන්න සුදු සහ රන් පාට මල් වැටුණු හනිසක්ල් වැලක් බවට පත් වුණා.

"පරිස්සමෙන්, දඩයක්කාරියේ," පර්සෙෆෝන් අනතුරු ඇඟෙව්වා. "ඔයාගේ තාත්තා සියුස් වෙන්න පුළුවන්, ඔයා ආර්ටෙමිස්ගේ ලෙෆ්ටිනන්ට් කෙනෙක් වෙන්නත් පුළුවන්, හැබැයි මගේම මාලිගාවේ දි මට අගෞරවයෙන් කතා කරන්න ඔයාට බැහැ."

තාලියා දත් මිටි කෑවා. "මගේ...දුන්න...ආපහු...දෙන්න."

පර්සෙෆෝන් අතක් වැනුවා. දුන්න සහ ඊතල නැවතත් සාමාන්‍ය අතට හැරුණා. "දැන්, වාඩිවෙලා ඇහුම්කන් දෙන්න. කඩුව තවම පාතාල ලෝකෙන් පිටවෙලා තියෙන්න විදිහක් නැහැ. හේඩීස් උතුමා ඉතිරි යතුරු පාවිච්චි කරලා රාජධානිය වහලා දැම්මා. එයා කඩුව හොයාගන්න කල් කිසිම දේකට ඇතුළට එන්නවත්, එළියට යන්නවත් බැහැ. ඒ වගේම හොරා ඉන්න තැන හඳුනා ගන්න එයා එයාගේ මුළු බලයම පාවිච්චි කරනවා."



තාලියා අකමැත්තෙන් ආපහු වාඩි වුණා. "එහෙනම් ඔයාට අපිව උවමනා මොකටද?"

"තලය ගැන විපරම් කරනවා කියන ආරංචිය පිටට යන්න බැහැ," දෙවඟන කිවුවා. "අපි රාජධානිය අගුළු දාලා තිබුණත්, ඒ ඇයි කියලා අපි නිවේදනයක් නිකුත් කරලා නැහැ. හේඩීස්ගේ සේවකයින්ව මේ ගවේෂණයට යොදවන්නත් බැහැ. කඩුවේ වැඩ ඉවර වෙනකල් එහෙම එකක් තියෙනවා කියලා එයාලට දැනගන්න දෙන්න බැහැ. එහෙම එකක් තියෙනවා කියලා එයාලට දැනගන්න දෙන්න බැහැ. ඒක නැතිවෙලා කියලා නම් එයාලට දැනගන්න දෙන්න කොහෙත්ම බැහැ."

"හේඩීස් කරදරේක වැටිලා කියලා එයාලා හිතුවොත්, එයාලා එයාව අත ඇරලා දාලා යන්න ඉඩ තියෙනවා," නිකෝ අනුමාන කළා. "ගිහින් ටයිටන්ලට එකතු වෙයි."

පර්සෙෆෝන් උත්තර දුන්නෙ නැහැ, ඒ වුණත් දෙවඟනකට නැති ගත් පෙනුමක් ගන්න පුළුවන් නම්, එයා එහෙම කළා. "හොරා උප දෙවියෙක් වෙන්නම ඕනෑ. කිසිම අමරණීය කෙනෙක්ට තවත් අමරණීයයෙකුගේ ආයුධයක් ඍජුව හොරකම් කරන්න බැහැ. ක්‍රෝනොස්ට පවා ඒ පෞරාණික නීතිය ළඟ නැමෙන්න වෙනවා. එයාගේ වීරයෙක් මේ පහළ කොහේ හරි ඉන්නවා. ඒ උප දෙවියාව අල්ලාගන්න... අපිට ඔයාලා තුන්දෙනාව පාවිච්චි කරන්න පුළුවන්."

"ඇයි අපිවම?" මම ඇසුවා.

"ඔයා තමයි ප්‍රධාන දෙවිවරු තුන්දෙනාගේ දරුවෝ," පර්සෙෆෝන් කිවුවා. "ඔයාලගේ ඒකාබද්ධ බලයට විරුද්ධව යන්න කාට ද පුළුවන්? ඇරත්, ඔයාලා හේඩීස්ගේ කඩුව ආපහු ගෙනත් දුන්නා ම, ඔයාලගෙන් ඔලිම්පස්වලට පණිවුඩයක් යනවා. සියුස්ගෙයි පොසෙයිඩන්ගෙයි දරුවෝ ම, අලුත් ආයුධය හේඩීස්ට ගෙනැත් දුන්නොත්, එයාලට හේඩීස්ට විරුද්ධ වෙන්න බැරි වෙනවා. ඔයාලා හේඩීස්ව විශ්වාස කරන බව ඒකෙන් ප්‍රදර්ශනය වෙයි."

"ඒත් මම එයාව විශ්වාස කරන්නෙ නැහැ," තාලියා කිවුවා.

"මමත් නැහැ," මම කිවුවා. "සුපිරි ආයුධයක් ගෙනැත් දෙනවා කෙසේ වෙතත්, අපි හේඩීස්ට කිසිම දෙයක් කරලා දෙන්නෙ මොකටද? නේද, නිකෝ?"

නිකෝ මේසය දිහා බලා සිටියා. එයාගේ ඇඟිලි කළු ස්ටයිජියන් කඩු තලයට තට්ටු කරමින් තිබුණා.

"නේද, නිකෝ?" මම නිකෝව උනන්දු කළා.

මගේ දිහා එක එල්ලේ බලන්න එයාට තත්පරයක් ගියා. "මට මේක කරන්න වෙනවා, පර්සි. එයා මගේ තාත්තා."

"ඔහ්, එහෙම බැහැ," තාලියා විරෝධය පෑවා. "මේක හොඳ අදහසක් කියලා විශ්වාස කරන්න ඔයාට බැහැ!"

"ඊට වඩා කඩුව ක්‍රෝනොස් අතට යන එක හොඳයි කියල ද ඔයා හිතන්නේ?"

එයා පෙන්වූ කාරණයත් හරි.

"වෙලාව නාස්ති වෙනවා," පර්සෙෆෝන් කිව්වා. "හොරාට පාතාල ලෝකයේ හවුල්කාරයෝ ඉන්නවා වෙන්න පුළුවන්, දූත් එයා පිටවෙන්න පාරක් හොයාගන්න බලයි."

මම රවා බැලුවා. "රාජධානිය අගුළු දැම්මා කියලා ඔයා කිව්වා කියලයි මම හිතුවේ."

"කිසිම හිරගෙයක් සංවෘත නැහැ, අඩු තරමේ පාතාල ලෝකෙවත්. හේඩීස් පිට වෙන්න තියෙන පාරවල් වහලා දානවටත් වඩා වේගයෙන් ආත්ම අලුත් ඒවා හොයාගන්නවා. ඔයාලා කඩුව අපේ රාජධානියෙන් පිට වෙන්න කලින් ඒක නැවත ලබාගන්න ඕනෑ, නැත්නම් ඒක සදහටම නැති වෙනවා."

"අපිට එහෙම කරන්න ඕනෑ වුණත්," තාලියා කිව්වා, "අපි මේ හොරාව හොයාගන්නේ කොහොමද?"

පෝච්චියක සිටවූ පැළයක් මේසය උඩ මතුවුණාඃ කොළ පාට දලු දෙක තුනක් සහිත ලෙඩ කහ පාට කානේෂන් මල් පැළයක්. ඒ මල පැත්තකට ඇල වී තිබුණේ හරියට ඉර හොයාගන්න උත්සහ කරනවා වගෙයි.

"මේක ඔයාලට මග පෙන්වයි," දෙවඟන කිව්වා.

"මැජික් කානේෂන් මලක්?" මම ඇහුවා.



"මේ මල හැම වෙලාවෙම හැරිලා තියෙන්නේ හොරා පැත්තට. ඔය පැළේ ගොදුර පැතලා යන්න ළං වෙන තරමට, මලේ පෙති හැලෙයි."

එහෙම කියනකොට ම, එක කහ පාට පෙත්තක් අළු පාටට හැරිලා බිමට වැටුණා.

"මලේ පෙති ඔක්කොම හැලුනොත්," පර්සෙෆෝන් කිව්වා. "මල මැරෙනවා. ඒකෙ තේරුම හොරා පිටවීමකට ළඟා වුණා කියන එක සහ ඔයාලා අසාර්ථක වුණා කියන එක."

මම තාලියා දිහාවට බැල්මක් හෙළුවා. එයා නම් මේ මලකින්-හොරෙක්ගේ-පාර-හොයන්න අදහස ගැන උද්‍යෝගිමත් බවක් පෙන්වූයේ නැහැ. ඊට පස්සෙ මම නිකෝ දිහා බැලුවා. අවාසනාවට, එයාගේ මුහුණෙන් පළවුණ හැඟීම මම හඳුනා ගත්තා. තමන්ගේ තාත්තාට ආඩම්බර හිතෙන විදිහේ දෙයක් කරන්න පිරිමි ළමයෙකුට ඇතිවෙන උවමනාව මොන වගේ ද කියලා මම දැනගෙන හිටියා. අඩු තරමේ, එයාගේ තාත්තා ආදරේ කරන්න අමාරු කෙනෙක් වුණත්. මේ සිද්ධියේ දි නම්, ආදරේ කරන්න හොඳටෝම අමාරු කෙනෙක්.

අපි ඇතුව හෝ නැතුව, නිකෝ මේක කරන්න යනවා කියලා මට තේරුණා. ඉතින් ,එයාට තනියම යන්න ඉඩ දෙන්න මට පුළුවන් වුනේ නැහැ.

"එක කොන්දේසියක් පිට," මම පර්සෙෆෝන්ට කිව්වා. "මේ කඩුව දෙවිවරුන්ට විරුද්ධව පාවිච්චි කරන්නෙ නැහැ කියලා හේඩීස්ට ස්ටයික්ස් ගඟ මත දිවුරන්න වෙනවා."

දෙවඟන උරහිස් ඇකිළුවා. "මම හේඩීස් උතුමා නෙවෙයි, ඒ වුණත් එයා මේක කරයි කියලා මට විශ්වාසයි - ඔයාලගේ උදවුවට ගාස්තුවක් හැටියට."

කානේෂන් මලේ තවත් පෙත්තක් ගිලිහුණා.

මම තාලියා වෙතට හැරුණා. "ඔයා හොරාට තළනකල් මම මල අල්ලගෙන ඉන්න ද?"

එයා සුසුමක් හෙළුවා. "හරි. අපි ගිහිල්ලා මේ තක්කඩියව අල්ලගමු."

***

නත්තල් අසිරිය පාතාල ලෝකෙට ඇවිල්ලා තිබුනේ නැහැ. අපි මාලිගාවේ පාර දිගේ ඇස්ෆොඩෙල් යායට යද්දි, එහි තිබුණේ මම කලින් වතාවේ එනවිට තිබුණු පෙනුමමයි - බරපතළ දොම්නස්බර බවක්. කහ පාට තණකොළ සහ කුරු කළු පොප්ලර් ගස් තෙරක් නැතිව ඇතින් ඇතට විහිදී තිබුණා. කඳු මුඳුන් හරහා අවතාර අරමුණක් නැතිව ඉබාගාතේ ඇදී යමින්, එකිනෙකාට කතා කර, ජීවත්ව සිටි කාලයේ තමන් කවුද කියලා මතක් කරගන්න උත්සහ කරමින් සිටියා. අපිට ඉහළින් ගුහා පියස්ස අඳුරේ දිස්න දෙමින් තිබුණා.

කානේෂන් මල අරගෙන ගිය මට මහා මොට්ට ගතියක් දැනුණා. නිකෝගේ කඩුවට මළවුන් පිරුණු ඕනෑම තැනකින් පාර පාදාගන්න හැකියාව තිබුණු නිසා එයා ඉදිරියෙන් ගියා. තාලියා වැඩි හරියක් කළේ කොල්ලො දෙන්නෙක් එක්ක ගවේෂණයකට යන්න වුණ එක ගැන මැසිවිලි කියමින් ගිය එකයි.

"පර්සෙෆෝන් ටිකක් තරහා ගිහින් වගේ නේද හිටියේ?" මම ඇසුවා.

නිකෝ ස්ටයිජියන් යකඩ තලයෙන් අවතාර රැළක් පළවා හරිමින් ඉදිරියට ගියා. "මම ළඟපාතක ඉන්න හැම වෙලාවක ම එයා හැසිරෙන්නෙ එහෙම තමයි. එයාට මාව පෙන්නන්න බැහැ."

"එහෙනම් එයා ඔයාව මේ ගවේෂණයට එකතු කරගත්තේ ඇයි?"

"ජේන හැටියට මගේ තාත්තගේ අදහසක් වගේ." එයා කතා කළේ ඒ බව ඇත්තටම විශ්වාස කරන්න උවමනාවෙන් වගෙයි. ඒ වුණත් මට නම් ඒ ගැන ඒ හැටි විශ්වාස වුනේ නැහැ.

හේඩීස්ම අපිට මේ ගවේෂණය ලබා නොදීම අමුතු දෙයක් වගෙයි මට පෙනුණේ. මේ කඩුව ඔය කියන තරමට ම එයාට වැදගත් නම්, ඒ දේවල් පැහැදිලි කරන්න එයා පර්සෙෆෝන්ට පැවරුවේ ඇයි? සාමාන්‍යයෙන් නම් හේඩීස් කැමති උප දෙවිවරුන්ට තර්ජනය කරන වැඩේ එයාම කරන්නයි.

නිකෝ නොනැවතී ඉදිරියට ඇදුණා. යායේ කොයි තරම් සෙනඟ පිරී හිටියත් - ඔයා අලුත් අවුරුදු සැඳෑවේ නිව්යෝක් නගරයේ



ටයිම්ස් චතුරස්‍රය දැකලා තියෙනවා නම්, මේ සෙනඟ ගැන ඔයාට සැහෙන හොඳ අදහසක් ලැබෙයි - ඒ හැමෝම නිකෝ ඉදිරියේ දි දෙපසට වුණා.

"පිල්ලි සෙනඟ හසුරුවන්න එයා සැහෙන දක්ෂයි නේ," තාලියා පිළිගත්තා. "මං හිතන්නේ ඊළඟ වතාවේ මම ෂොපින් මෝල් එකට යද්දි එයාවත් එක්ක ගියොත් හොඳයි වගේ."

එයා දුන්න තදින් අල්ලගෙන සිටියේ ඒක ආයෙමත් හතිසක්ල් වැලකට හැරෙයි කියලා බයෙන් වගෙයි. ගිය අවුරුද්දේ සිටියාට වඩා වයසින් වැඩුණු බවක් එයාගෙන් පෙනුනේ නැහැ.

හදිසියේම මට තේරුම් ගියේ, එයා දැන් දඩයක්කාරියක් නිසා ආයේ කවදාවත් එයාව වයසට යන්නේ නැහැ කියලයි. ඒ කියන්නේ මම එයාට වඩා වැඩිමල්. ඒක නම් හරිම අමුතුයි.

"ඉතින්," මම කිවුවා, "අමරණීයත්වේ ඔයාට හොඳින් සලකනව ද?"

එයා ඇස් දෙක කැරකුවා. "ඒක පූර්ණ අමරණීයත්වයක් නෙවෙයි, පර්සි. ඔයා ඒක දන්නවා නේ. තවමත් අපිව සටනක දි මැරෙන්න පුළුවන්. ඒක නිකං... කවදාවත් වයසට යන්නෙවත්, ලෙඩ වෙන්නේවත් නැති නිසා, අපි සදාකාලිකව ජීවත් වෙනවා විතරයි. ඒකත් රාක්ෂයෝ අතින් අපිව පෙති ගැහෙන්නෙ නැති වෙයි කියලා හිතුවොත් විතරයි."

"ඒ කියන්නේ හැමවෙලාවෙම අනතුරක් තියෙනවා."

"හැමවෙලාවෙම."

එයා වටේටම ඇස් දුවවමින් බලද්දි මට හිතුණේ එයා මළවුන්ගේ මුහුණු සෝදිසි කරනවා කියලයි.

"ඔයා හොයන්නේ බියන්කාව නම්," මම නිකෝට නෑසෙන්න හෙමිහිට කිවුවා, "එයා ඇත්තේ ස්වර්ගයේ. එයා මැරුණේ වීරයෙක් විදිහට නේ."

"මං ඒක දන්නවා," තාලියා සැර වුණා. ඊට පස්සේ එයා එයාවම පාලනය කරගත්තා. "ඒක නෙවෙයි, පර්සි. මම මේ නිකං... ඒකෙන් වැඩක් නෑ."

සීතල හිරියක් වගේ හැඟීමක් මගේ ඇඟ පුරා පැතිරී ගියා. මීට අවුරුදු කීපයකට කලින් තාලියාගේ අම්මා මෝටර් රථ අනතුරකින් මියගොස් තිබුණු බව මට සිහිවුණා. එයාලා කවදාවත් ඒ හැටි සමීපව ඉඳලා නැති වුණත්, තාලියාට එයාගේ අම්මට සමු දෙන්නත් කවදාවත් ඉඩක් ලැබී තිබුනේ නැහැ. එයාගේ අම්මාගේ අවතාරයත් මේ පහළ කොතැනක හෝ සැරිසරනවා නම් - තාලියා කලබලෙන් වගේ හිටපු එකෙත් පුදුමයක් නැහැ.

"මට සමා වෙන්න," මම කිවුවා. "මම ඒ ගැන හිතුවේ නැහැ."

අපේ ඇස් එකිනෙක හමුවුණා, මම කියූ දේ එයා තේරුම් ගත්තා කියලා මට හැඟුණා. එයාගේ මුහුණේ හැඟීම් මෘදු වුණා. " ඒකට කමක් නෑ. අපි මේක ඉවරයක් කරලා ඉමු."

අපි ඉදිරියට යද්දි තවත් කාතේෂන් පෙත්තක් ගිලිහී වැටුණා.

වධක භූමිය පැත්තට මල හැරෙද්දි මම සතුටු වුනේ නම් නැහැ. අපේ ගමන ස්වර්ගය පැත්තට නැඹුරු වෙලා, අපිට ලස්සන මිනිස්සු සහ සාද අතරට යන්න ලැබෙයි කියලා මම බලාපොරොත්තු වෙමින් හිටියේ. ඒත් නැහැ. ඒ මල කැමති පාතාල ලෝකයේ කටුක ම, නපුරු ම පැත්තට වගෙයි.

ලෝදිය ඇළක් උඩින් පැනපු අපි බිහිසුණු වධක දර්ශන පසු කරමින් ඉදිරියට ඇදුණා. ඔයාගේ කෑම රුචිය සම්පූර්ණයෙන් ම නැති කරලා දාන්න ඕනෑ නැති නිසා, ඒ දර්ශන මම විස්තර කරන්නේ නැහැ. ඒ වුණත් මගේ කන් ඇතුළේ පුළුන් හිර වෙලා තිබුණා නම් හොඳයි කියලා මට හිතුණේ ඒ බෙරිහන් දෙන හඬවල් සහ අසූව දශකයේ සංගීත හඬ නෑසෙන්නයි.

අපේ වම් පසින් තිබුණු කන්ද දිහාවට කාතේෂන් මල නැඹුරු වුණා.

"උඩහට," මම කිවුවා.

තාලියා සහ නිකෝ නැවතුණා. වධක භූමිය හරහා ආ ගමන නිසා එයාලව දූළි දුඹුළුවලින් වැහිලා තිබුණා. මගේ පෙනුමත් ඊට වඩා හොඳ වෙන්න නැතුව ඇති.

කවුරු හරි රෙදි සෝදන යන්ත්‍රයක් ඇදගෙන යනවා වගේ ලොකු ඇඹරුම් හඬක් කන්දේ අනෙක් පැත්තෙන් ඇසුණා. ඊට පස්සේ



'බූම්! බූම්! බූම්!' හඬකින් කන්දම දෙදුරුවා. ඒත් එක්කම පිරිමියෙක් පරුෂ වචනයෙන් බැණ වදිනවා ඇසුණා.

තාලියා නිකෝ දිහා බැලුවා. "ඒ මම හිතන කෙනා ද?"

"මටත් බය ඒකමයි," නිකෝ කිවුවා. "මරණයට වංචා කිරීමේ අංක එකේ විශේෂඥයා."

මම එයා කියපු කතාවේ තේරුම අහන්න කලින්, එයා අපිව කඳු මුදුනට කැඳවාගෙන ගියා.

***

කන්දේ අනෙක් පැත්තේ හිටපු හාදයා ප්‍රිය මනාප කෙනෙක්වත්, සතුටින් සිටි කෙනෙක්වත් නෙවෙයි. තැඹිලි පාට සමක්, කළගෙඩි බඩක්, කෝටු අත් කකුල් සහ ඉණ වටේට ඇඳි ලොකු අමුඩයක් වගේ දෙයක් ඇති කෙනෙක් වූ එයා අර අගුටුමිටි සෙල්ලම් බෝනික්කෙක් වගෙයි. එයාගේ මී කුඩුවක් වගේ කොණ්ඩය පන්දමක් වගේ ඉහළට එසවී තිබුණා. එයා වගේ දෙගුණයක් විතර ලොකු ගල් ගෙඩියට පයින් ගහමින්, ශාප කරමින් එයා වටේට උඩ පැන පැන හිටියා.

"මම කරන්නෙ නැහැ!" එයා බෙරිහන් දුන්නා. "නෑ, නෑ, නැහැමයි!" ඊට පස්සේ එයාගේ කටින් භාෂා කීපයක ම පරුෂ වචන වැලක් පිටවුණා. ඒ වෙලාවේ මගේ ළඟ එක නරක වචනයකට සත විසි පහේ කාසිය ගාණේ දාන කැටයක් තිබුණා නම්, මට ඩොලර් පන්සීයකට කිට්ටු ගාණක් එකතු කරන්න තිබුණා.

එයා ගල් ගෙඩියෙන් ඉවතට ඇවිද යන්න පටන් ගත්තා, ඒත් මීටර් තුනකට විතර පස්සේ එයාව ආපස්සට ඇදී ගියේ, හරියට අදෘශ්‍යමාන බලයකින් එයාව පස්සට අදිනවා වගෙයි. ආපස්සට විසි වෙමින් ගල ළඟටම ආව එයා ඔළුව ගලේ ගහගන්න පටන් ගත්තා.

"හරි හරි!" එයා බෙරිහන් දුන්නා. "හරි, උඹට හෙණම ගහපි!"

ඔළුව අතුල්ලා ගත් එයා තවත් පරුෂ වචන ටිකක් කිවුවා. "හැබැයි මේක තමයි අන්තිම වතාව. උඹට මාව ඇහුණ ද?"

නිකෝ අපි දිහා බැලුවා. "ඉක්මන් කරන්න. එයා ඒක කරන්න වළිකන අතරේ."

අපි අමාරුවෙන් පල්ලම් බැස්සා.

"සිසිෆස්!" නිකෝ කතා කළා.

ගල පෙරළන හාදයා පුදුම වෙලා උඩ බැලුවා. ඊට පස්සෙ එයා එයාගේ ගල් ගෙඩිය පිටිපස්සට බඩ ගාගෙන ගියා. "ඔහ්, නෑ! උඹට ඔය වෙස් මාරුවෙන් මාව ආයෙමත් මෝඩයා කරන්න බැහැ! උඹලා ෆියුරිලා කියලා මම දන්නවා!"

"අපි ෆියුරිලා නෙවෙයි," නිකෝ කිවුවා. "අපිට ඕනෑ කතා කරන්න විතරයි."

"යනවා යන්ඩ!" එයා යටිගිරියෙන් කෑගැසුවා. "මල් අරන් ආවට වැඩක් නැහැ. දැන් සමාව ගන්න පරක්කු වැඩියි!"

"බලන්න," තාලියා කිවුවා. "අපිට ඕනෑ-"

"ලා-ලා-ලාාා!" එයා හඬ තැලුවා. "මම අහන්නෙ නෑ!"

අපිට ගල් ගෙඩිය වටේට දුවමින් එයා එක්ක ඔට්ටු සෙල්ලම් කරන්න වුණා, අන්තිමේ දි අපි අතරින් වේගවත් ම කෙනා වූ තාලියා කොහොම හරි වයසක මනුස්සයාගේ කොණ්ඩයෙන් අල්ලා ගත්තා.

"ඕක නවත්තනවා!" එයා විලාප දුන්නා. "මට ගල් ගෙඩිය තල්ලු කරන්න තියෙනවා. ගල් ගෙඩිය!"

"මම ඔහේගේ ගල් ගෙඩිය තල්ලු කරන්නම්!" තාලියා යෝජනා කළා. "එතකල් බෙරිහන් දෙන එක නවත්තලා මගේ යාළුවෝ එක්ක කතා කරනවා."

සිසිෆස් පොර බැදිම නතර කළා. "ඔයා- ඔයා මගේ ගල තල්ලු කරනව ද?"

"ඔහේ දිහා බලන් ඉන්නවට වඩා ඒක හොඳයි," තාලියා මට බැල්මක් හෙළුවා. "කරන දෙයක් ඉක්මනට." ඊට පස්සේ එයා සිසිෆස්ව අපි දිහාවට තල්ලු කරා.

ගල් ගෙඩියට කර ගැසූ තාලියා හෙමින් හෙමින් ඒක කන්ද උඩට තල්ලු කරන්න පටන් ගත්තා.

සිසිෆස් විශ්වාස නොකරන බැල්මෙන් මට රවාගෙන සිටියා. ඊට පස්සේ එයා මගේ නහය කෙනිත්තුවා.



"ඌයි!" මම කෑගැසුවා.

"ඒ කියන්නේ ඔයා ඇත්තටම ෆියුරි කෙනෙක් නෙවෙයි," එයා කිවුවේ විස්මයෙන්. "ඔය මල මොකටද?"

"අපි කෙනෙක්ව හොයනවා," මම කිවුවා. "මේ මල අපිට එයාව හොයන්න උදවු කරනවා."

"පර්සෙෆෝන්!" එයා දූවිලි ගොඩට කෙළ ගැසුවා. "ඕකත් එයාගේ පාර පෙන්නන උප්පරවැට්ටිවලින් එකක්, නේද?" එයා හිටපු-නාකි-මනුස්සයෙකුගේ අජූව ගඳ දැනුණා. "වතාවක් මම එයාව ගොනාට ඇන්දුවා, ඔයා දන්නව ද. මම උන් ඔක්කොම ගොනාට ඇන්දුවා."

මම නිකෝ දිහා බැලුවා. "පරිවර්තනය?"

"සිසිෆස් මරණයට වංචා කළා," නිකෝ පැහැදිලි කරා. "මුලින්ම එයා තනාටොස්, ඒ කියන්නේ ආත්ම නෙලා ගන්නාව දම්වැල් දාලා හිර කළා. ඊට පස්සෙ කාටවත් මැරෙන්න බැරිවුණා. පස්සේ තනාටොස් නිදහස් වෙලා, එයාව මරන්න එද්දි, සිසිෆස් එයාගේ නෝනාට කිවුවා එයාට සමාදානයේ සැතපෙන්න බැරි වෙන්න, අවමඟුල් චාරිත්‍ර හරියට කරන්න එපා කියලා. සිසී මෙහෙ- මම ඔයාට සිසී කියලා කතා කරන්න ද?"

"එපා!"

"සිසී පර්සෙෆෝන්ව රවට්ටලා, එයාගේ නෝනට හොල්මන් කරන්න ආපහු ලෝකයට ගියා. ඊට පස්සේ එයා ආපහු ආවේ නැහැ."

නාකි මනුස්සයා කෙකර ගෑවා. "මම තවත් අවුරුදු තිහක් ජීවත් වුණාටත් පස්සෙයි, උන් අන්තිමේ දි මාව හොයාගත්තේ!"

තාලියා දැන් කන්දෙන් බාගයක් විතර උඩට ගිහින් තිබුණා. එයා දත් මිටි කාගෙන, පිටෙන් ගල් ගෙඩිය තල්ලු කරමින් සිටියා. එයාගේ මුහුණෙන් පළවුණේ 'ඉක්මන් කරන්න!' කියනවා වගේ හැඟීමක්.

Scanned by TapScanner

"එතකොට මේක තමයි ඔයාගේ දඬුවම," මම සිසිෆස්ගෙන් ඇහුවා. "සදහටම කන්දක් උඩට ගල් ගෙඩියක් පෙරළන එක. ඒ වගේ දඬුවමක් විඳින්න තරම් ඒක වටිනව ද?"

"මේක තාවකාලික බාධකයක් විතරයි!" සිසිෆස් කෑගැහුවා. "මම ඉක්මනටම මෙහෙන් පැනලා යනවා. මම ඒක කරපු දවසට මේ හැමෝටම දුක් වෙන්න වෙයි!"

"ඔයා කොහොමද පාතාල ලෝකෙන් පිට වෙන්නේ?" නිකෝ ඇහුවා. "ඔයා දන්නවා නේ, ඒක අගුළු දාලා තියෙන්නේ."

සිසිෆස් දුෂ්ට ලෙස දත් නියෙව්වා. "අනිත් එකාත් මගෙන් ඇහුවේ ඕකමයි."

මගේ බඩ තදවුණා. "තවත් කවුරු හරි ඔයාගෙන් උපදෙස් ඉල්ලුවා ද?"

"තරහා ගියපු ඉලන්දාරියෙක්," සිසිෆස් සිහිපත් කළා. "ඒ හැටි ආචාරශීලී නැහැ. මගේ බෙල්ලට කඩුවක් තිබ්බා. මගේ ගල් ගෙඩිය පෙරළන්න කොහෙත්ම ඉදිරිපත් වුනේ නැහැ."

"ඔයා මොනවද එයාට කිවුවේ?" නිකෝ ඇහුවා. "කවුද එයා?"

සිසිෆස් එයාගේ උරහිස් සම්බාහනය කරගත්තා. දුන් කඳු මුදුනටම වගේ ළඟා වී සිටි තාලියා දිහාවට එයා බැල්මක් හෙළුවා.

තාලියාගේ මූණ තද රතු පාටට හැරිලා, දාඩියෙන් නෑවිලා තිබුණා.

"ඔහ්... ඒක කියන්න අමාරුයි," සිසිෆස් කිවුවා. "මීට කලින් එයාව දැකලා නැහැ. එයා කළු රෙද්දකින් ඔතපු දිගටි පොදියක් අරගෙන යයි ගියේ. සමහරවිට, හිම සපත්තු දෙකක් ද? නැත්තම් සවලක් ද? ඔයාලට මෙතැනට වෙලා ඉන්න පුළුවන් නම්, මට ගිහින් එයාව හොයාගෙන..."

"ඔයා මොනවද එයාට කිවුවේ?" මම තදින් ප්‍රශ්න කළා.

"මට මතක නැහැ."



නිකෝ එයාගේ කඩුව ඇදලා ගත්තා. ස්ටයිජියන් යකඩ තලය කොයි තරම් සීතල වුණා ද කියනවා නම්, වධක භූමියේ උණුසුම්, වියළි වාතයේ දී එයින් හුමාලය පිටවුණා. "හොඳට මතක් කරනවා."

නාකි මනුස්සයා බයේ ඇකිළුණා. "ඔය වගේ කඩුවක් අරන් යන්නේ මොන විදිහේ කෙනෙක් ද?"

"හේඩීස්ගේ පුතෙක්," නිකෝ කිවුවා. "දැන් මට උත්තර දෙනවා!"

සිසිෆස්ගේ මුහුණේ පාට හිඳුණා. "මම එයාට කිවුවා මෙලිනොයිට කතා කරන්න කියලා! එයා ළඟ හැම වෙලාවෙම පිට වෙන්න ක්‍රමයක් තියෙනවා!"

නිකෝ එයාගේ කඩුව පහත දැමුවා. මෙලිනොයි කියන නම එයාගේ හිතට වද දුන් බව මට පෙනුණා. "හරි එහෙනම්. මේ කියන උප දෙවියා මොන වගේ ද?"

"ම්... එයාට නහයක් තිබුණා," සිසිෆස් කිවුවා. "තව කටකුත් තිබුණා. එක ඇහැකුයි-"

"එක ඇහැක්?" මම කතාවට බාධා කළා. "එයා එක ඇහැක් රෙදි කෑල්ලකින් වහගෙන ද හිටියේ?"

"ඔහ්... වෙන්න ඇති," සිසිෆස් කිවුවා. "එයාගේ ඔළුවේ කෙස් තිබුණා. තව-" මගේ උරහිසට උඩින් බැලුව එයා හීල්ලුවා. "අන්න එයා ඉන්නවා!"

අපි ඒ ලණුව කෑවා.

අපි හැරෙන පරක්කුවට, සිසිෆස් එතැනින් පැනලා දිවුවා.

"මම නිදහස්! මම නිදහස්! මම- අහ්ක්!" එයා කන්දේ සිට මීටර් තුනක් දුවද්දී, එයාගේ අදෘශ්‍යමාන රැහැන කෙළවරට ඇවිත්, ගැස්සී ආපස්සට ඇද වැටුණා.

නිකෝ සහ මම එයාගේ අත් දෙකෙන් අල්ලගෙන එයාව කන්ද උඩට ඇදගෙන ආවා.

"උඹලට හෙණම ගහපි!" එයා පෞරාණික ග්‍රීක, ලතින්, ඉංග්‍රීසි, ප්‍රංශ සහ මම හඳුනා නොගත් භාෂා ගණනාවකින් කුණු

Scanned by TapScanner

හරුප වැල්ක් කියාගෙන ගියා. "මම කවදාවත් උඹලට උදවු කරන්නෙ නෑ! අපායට ම පල!"

"දැනටමත් එහෙ තමයි ඉන්නේ," නිකෝ කෙඳිරුවා.

"ඔන්න එනවෙයි!" තාලියා කෑගැසුවා.

උඩ බලද්දි මටත් තරක වචන දෙක තුනක් කියවෙන්න ගියා. ගල් ගෙඩිය කෙලින්ම අපි දිහාවට පෙරළී එමින් තිබුණා. නිකෝ එක පැත්තකට පැන්නා. මම අනෙක් පැත්තට පැන්නා.

"එපා!" ගල් ගෙඩිය ඇඟට එද්දි සිසිෆස් මොර දුන්නා. කොහොමදෝ, ඒක එයාගේ ඇඟ උඩින් යන්න කලින් එයා ඒක අල්ල ගත්තා. මට හිතෙන්නේ ඒකට එයාට සැහෙන පුහුණුවක් තිබුණා.

"මේක ආපහු ගන්න!" එයා විලාප දුන්නා. "කරුණාකරලා. මට ඒක අල්ලගෙන ඉන්න බැහැ."

"ආයෙ නම් බැහැ," තාලියා හුස්ම ඇල්ලුවා. "ඔයාම කරගන්න එකයි ඇත්තේ."

එයා තවත් අහන් ඉන්න ආසා හිතෙන වචන ගොඩකින් අපිට සංග්‍රහ කළා.

තව දුරටත් එයාගෙන් අපිට උදවුවක් නොලැබෙන බව පැහැදිලිව පෙනුණු නිසා, එයාට එයාගේ දඬුවම විඳින්න ඇරලා අපි එතැනින් ගියා.

"මෙලිනොයිගේ ගුහාව තියෙන්නෙ මේ පැත්තේ," නිකෝ කිවුවා.

"ඇත්තටම මේ හොරාට තියෙන්නෙ එක ඇහැයි නම්," මම කිවුවා, "ඒ නෙමෙසිස්ගේ පුතා, ඊතන් නකමුරා වෙන්න පුළුවන්. එයා තමයි ක්‍රෝනොස්ව නිදහස් කළේ."

"මට මතකයි," නිකෝ කිවුවා. "ඒත් අපිට ගනුදෙනු කරන්න වෙන්නේ මෙලිනොයි එක්ක නම්, ඒක මීට වඩා ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඉක්මන් කරලා යමු."

අපි එතැනින් ඉවතට යද්දි, සිසිෆස් මොර දෙනවා ඇසුණා, "හරි, හැබැයි මේක තමයි අන්තිම වතාව. මං කියන දේ ඇහුණ ද? අන්තිම වතාව!"



තාලියා වෙවුලුවා.

"ඔයා හොඳින් ද?" මම එයාගෙන් ඇසුවා.

"මං හිතන්නේ..." එයා පැකිළුණා. "පර්සි, ගොඩක් ම බය හිතෙන දේ තමයි, මම කන්ද මුදුනට ම කිට්ටු වුණා ම, මං හිතුවේ මම ඒක කරා කියලා. මට හිතුණේ, මේක එච්චර අමාරු දෙයක් නෙවෙයි. මට ගල් ගෙඩිය මුදුනට ගෙනියලා තියන්න පුළුවන්, කියලා. ඒක පහළට පෙරළිලා ආවම, මට ආපහු වතාවක් උත්සහ කරලා බලන්න ම හිතුණා. දෙවෙනි සැරේ ඒක කරන්න පුළුවන්මයි කියලා මට හිතුණා."

එයා කල්පනාබර බැල්මෙන් මගේ දිහා බැලුවා.

"එන්න යමු," මම එයාට කිවුවා. "අපි පුළුවන් ඉක්මනට මෙහෙන් පිටවෙලා යන තරමට හොඳයි."

***

කල්පයක් විතර වගේ දැනුණු කාලයක් අපි ඇවිදගෙන ගියා. කානේෂන් මලේ තවත් පෙති තුනක් පර වී වැටුණා. ඒ කියන්නේ දැන් මල නිල වශයෙන් බාගෙට මැරිලා.

උල් දත් වගේ පෙනුමක් ඇති අළු පාට, රළු කඳු යායක් දෙසට මල යොමු වී තිබුණු නිසා, අපි ඒ දිහාවට ගිහි කඳු පාෂාණවලින් සැදුණ තැන්නක් මතින් අමාරුවෙන් ඇවිද ගියා.

"විවේක ගන්න කියාපු දවසක්," තාලියා කෙඳිරුවා. "දඩයක්කාරියෝ මෙලහකටත් කැලෑ පිටියක නැවතිලා, විනෝද වෙනවා ඇති."

මගේ පවුලේ අය මොනවා කරනවා ඇති ද මම පුදුම වුණා. මගේ අම්මා සහ බාප්පා, පෝල් මම ඉස්කෝලේ ඇරිලා ගෙදර නාවාම කලබල වෙන්න ඇති, ඒත් එහෙම දෙයක් සිද්ධ වුණ පළවෙනි වතාව මේක නෙවෙයි. මම මොකක් හරි ගවේෂණයකට ගිහින් කියලා එයාලා ඉක්මනින් ම තේරුම් ගනියි. මගේ අම්මා සාලයේ ඉහළ පහළ සක්මන් කරමින්, මගේ තෑගි ඇරලා බලන්නවත් මට ආපහු එන්න පුළුවන් වෙයි ද කියලා කණස්සල්ලෙන් කල්පනා කරනවා ඇති.

"එතකොට, කවුද මේ මෙලිනොයි?" මම ඇසුවේ, මගේ හිත ගෙදර දුවන එක නවත්වා ගන්න උත්සහ කරමින්.

"දිග කතාවක්," නිකෝ කිවුවා. "දිග, ගොඩක් බය හිතෙන කතාවක්."

එයා අදහස් කළ දේ මම අහන්න යද්දි ම, තාලියා බිම වකුටු වුණා. "ආයුධ!"

මම රිප්ටයිඩ් ඇදලා ගත්තා. පෝච්චි කළ කානේෂන් පැළයක් අතේ තියාගෙන ඉදිද්දි මට හරිම බිහිසුණු පෙනුමක් ලැබෙනවා ඇති කියලා සහතික වුණ නිසා මම ඒක බිමින් තැබුවා.

නිකෝ එයාගේ කඩුව අතට ගත්තා.

අපි පිටට පිට තබාගත්තා. තාලියා දුන්නට ඊතලයක් ඇමිණුවා.

"මොකක්ද ඒ?" මම මුමුණා ඇසුවා.

එයා ඇහුම්කන් දෙනවා වගෙයි පෙනුණේ. ටිකකින් එයාගේ ඇස් ලොකු වුණා.

යක්ෂණියෝ දුසිමක් අපිව වට කරගෙන මතු වුණා.

උන්ට තිබුණේ බාගෙට මනුෂ්‍ය-බාගෙට වවුල් පෙනුමක්. උන්ගේ මුක්කන්, ලොම් පිරුණු මූණුවල උල් දත් සහ එළියට ඉලිප්පුණු ඇස් තිබුණා. හැඩපලු ගෙතුණු ලොම්වලින් සහ සන්නාහ කෑලිවලින් උන්ගේ සිරුරු වැසී තිබුණා. උන්ට ඇඟිලි වෙනුවට නිය පහුරු ඇති, කවරැළි ගැහුණු අත්, පිටෙන් මතු වූ වවුල් තටු සහ කොට, බකල කකුල් තිබුණා. උන්ගේ ඇස්වල වූ මිනීමරු බැල්ම නොතිබෙන්න, උන් මහා විහිළු පෙනුමක් ගන්න තිබුණා.

"කීරස්ලා," නිකෝ කිවුවා.

"මොක්කු?" මම ඇසුවා.

"යුධ පිටියේ අමනුෂ්‍යයෝ. උන් පෝෂණය වෙන්නෙ සාහසික මරණවලින්."

"ඔහ්, කොච්චර ෂෝක් ද." තාලියා කිවුවා.



"පස්සට යනවා!" නිකෝ යක්ෂණියන්ට නියෝග කළා. "හේඩීස්ගේ පුතා නුඹලාට අණ කරනවා!"

කීරස්ලා සූ හඬින් පිම්බා. උන්ගේ කටවල්වලින් පෙණ වැගිරුණා. උන් සැක මුසුව අපේ ආයුධ දිහාවට බැලුම් හෙළුවා, ඒත් නිකෝගේ නියෝගය උන් වගකට ගත් බවක් නම් පෙනුනේ නැහැ.

"ඉක්මනින් ම හේඩීස් පරාද වේවි," උන්ගෙන් එකෙක් දත් විළිස්සා ගෙරෙව්වා. "අපේ අලුත් ස්වාමියා අපිට නිදහස් පාලන බලය දේවි!"

නිකෝ තදින් ඇහිපිය ගැසුවා. "අලුත් ස්වාමියා?"

පෙරටුවේ සිටි යක්ෂණිය එයාගේ ඇඟට පැන්නා. නිකෝ පුදුමයෙන් ගල් ගැහිලා හිටපු විදිහට, ඒකිට එයාව තීරු තීරුවලට පතුරු ගහන්න ඉඩ තිබුණත්, තාලියා ඒකිගේ කැත වවුල් මුහුණට විද්ද ඊතලයෙන්, යක්ෂණියව කුඩු වී ගියා.

ඉතුරු එවුන් පහර දෙන්න පැන්නා. දුන්න අත් ඇරිය තාලියා, එයාගේ කිණිසි ඇදලා ගත්තා. නිකෝගේ කඩුව මගේ ඔළුවට උඩින් පියඹා ගිහින් යක්ෂයෙක්ව දෙපලු කරද්දි, මම පහළට නැමුණා. මගේ වටේට කඩා පැන්න එවුන් තුනක් හෝ හතරක් මම පෙති ගසා දැමුවත්, තව තවත් එවුන් නොනැවතී ආවා.

"ඉයාපෙෂස් උඹලව චප්ප කරලා දමයි!" එකෙක් කෑගැසුවා.

"කවුරු?" මම ඇසුවා. ඊට පස්සේ මම ඒකා හරහා මගේ කඩුව යැවුවා. මතක තියාගන්න: ඔයා රාක්ෂයෙක්ව කුඩු කරලා දැම්මොත්, ඌට ඔයාගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ.

නිකෝ සිටියෙත් කීරස්ලා හරහා අඩ රවුමට කඩුව වනමින්. එයාගේ කළු කඩුව වැක්‍යුම් ක්ලීනරයක් වගේ උන්ගේ සාරය උරා ගත්තා. එයා උන්ව විනාශ කරන තරමට, එයා වටා වාතය තව තවත් සීතල වුණා.

එක යක්ෂයෙක්ව අනෙක් පැත්තට හැරවූ තාලියා, කිණිස්සක් ඌ තුළට බස්සවලා, එයාගේ අනෙක් කිණිස්සෙන් තවත් එකෙකුට ඇල තැබුවේ ඌගේ පැත්තට හැරෙන්නෙවත් නැතිවයි.

"වේදනාවෙන් මැරියං, මනුෂ්‍යයෝ!" මට මගේ ආරක්ෂාවට කඩුව ඔසවන්නවත් ඉඩක් ලැබෙන්න කලින්, තවත් යක්ෂණියක් මගේ උරහිස පහුරු ගෑවා.

මම යුධ සන්නාහයකින් සැරසී සිටියා නම්, කිසිම ප්‍රශ්නයක් නැහැ, ඒත් මම තවමත් හිටියේ පාසල් නිල ඇඳුම පිටිනුයි. සතාගේ නිය පහුරු මගේ කමිසය ඉරාගෙන ගොස් මගේ හම තුළට කිඳා බැස්සා. මගේ මුළු වම් පැත්ත ම වේදනාවෙන් පුපුරා ගියා වගෙයි මට දැනුණේ.

නිකෝ යක්ෂණියකට පයින් ගහලා, කඩුවෙන් ඇන්නා. මට කළ හැකි එකම දේ වුණේ බිමට ඇද වැටිලා, බෝලයක් වගේ වකුටු වෙලා දරුණු පිළිස්සුම් වේදනාව වාවාගන්න උත්සහ කිරීම විතරයි.

සටන් කරන හඬ අවසන් වුණා. තාලියා සහ නිකෝ මගේ ළඟට දුවගෙන ආවා.

"හෙලවෙන්නැතුව ඉන්න, පර්සි," තාලියා කිවුවා. "ඔයාට මුකුත් වෙන්නෙ නැහැ."

ඒ වුණත් එයාගේ හඬේ වූ වෙවුලුම තුවාලයේ බරපතළකම මට කිවුවා. නිකෝ එය අල්ලද්දි මම වේදනාවෙන් මොර දුන්නා.

"නෙක්ටාර්," එයා කිවුවා. "මම ඒකට නෙක්ටාර් වක්කරන්නම්."

දේවමය පානය අඩංගු බෝතලයක පොරොප්පය ගැලවූ එයා මගේ උරහිසට ඒවා වත්කළා.

ඒක අනතුරුදායක වැඩක් - උප දෙවිවරුන්ට දරාගන්න පුළුවන්කම තියෙන්නේ එයින් එක උගුරක් තරම විතරයි - ඒත් එසැණින් ම වේදනාව අඩු වී ගියා. නිකෝ සහ තාලියා එක්ව තුවාලයට වැහුම් දැමුවා, ඒ අතරේ මට සිහිය නැති වුණේ තුන් හතර පාරක් විතරයි.

කොයි තරම් වේලාවක් ගත වුණා ද කියලා මට නිශ්චය කරන්න බැරිවුණා, ඒත් මට ඊළඟට මතක මාව ගලකට හේත්තු කර වාඩි කරවා තිබුණු බවයි. මගේ උරහිස වෙළුම් පටිවලින් වෙළා තිබුණා. තාලියා මට චොකලට් රසැති ඇම්බ්‍රෝසියා චූටි කෑලි කවමින් සිටියා.



"කීරස්ලා?" මම කෙඳිරුවා.

"දැනට ගිහිල්ලා," එයා කිවුවා. "එක තත්පරේකට මං ඔයා ගැන බයෙන් හිටියේ, පර්සි. ඒත් මට හිතෙන්නේ ඔයාට ඒක කරන්න පුළුවන්."

නිකෝ අපි අසලින් ඇන තියා ගත්තා. එයා කානේෂන් පෝච්චිය අතේ තියාගෙන හිටියා. එහි අන්තිම පෙති පහ තවමත් මලේ එල්ලී තිබුණා.

"කීරස්ලා ආපහු එයි," එයා අනතුරු ඇඟෙව්වා. එයා මගේ උරහිස දිහා සැලකිල්ලෙන් බැලුවා. "ඔය තුවාලේ... කීරස්ලා කියන්නේ සැහැසිකම්වලට වගේම විෂබීජ, ලෙඩ රෝග, වසංගතවලටත් අරක් ගත්ත අමනුස්සයෝ. අපිට ආසාදනය වෙන වේගය අඩු කරන්න පුළුවන්, ඒත් අන්තිමේ දි ඔයාට හරි හමං ප්‍රතිකාරයක් ඕනැ වෙනවා. මං කිවුවේ, දේව බලයක්. එහෙම නැති වුණොත්..."

එයා ඒ සිතුවිල්ල සම්පූර්ණ කළේ නැහැ.

"මට අමාරුවක් වෙන එකක් නැහැ." වාඩි වෙන්න උත්සහ කළ මට එසැණින් ම ඉසේ කරකැවිල්ලක් දැනුණා.

"හෙමීට," තාලියා කිවුවා. "ඔයාට නැගිටින්න පුළුවන් වෙන්න කලින් ඔයා විවේක ගන්න ඕනැ."

"ඒකට වෙලාවක් නෑ." මම කානේෂන් මල දිහා බැලුවා. "එක යක්ෂණියක් ඉයාපෙෂස් ගැන කිවුවා. මට මතක තියෙනවා හරි ද? ඒ ටයිටන් කෙනෙක් ද?"

තාලියා නොසන්සුන්ව ඔළුව වැනුවා. "ක්‍රෝනොස්ගේ සහෝදරයා, ඇට්ලස්ගේ තාත්තා. එයා බටහිරට අධිපති ටයිටන් විදිහටයි ප්‍රසිද්ධ වෙලා හිටියේ. එයාගේ නමේ තේරුම 'සිදුරු කරන්නා'. මොකද ඒක තමයි එයා එයාගේ හතුරන්ට කරන්න කැමති. එයාගේ සහෝදරයෝ ටිකත් එක්ක එයාවත් ටාටරස්වලට විසි කළා. හරි නම් එයා තවමත් ඒක ඇතුළේ ඉන්න ඕනැ."

"ඒ වුණාට හේඩීස්ගේ කඩුවෙන් මරණයේ අගුළු අරින්න පුළුවන් නම්?" මම ඇසුවා.

"එහෙනම් සමහරවිට," නිකෝ කිවුවා. "ඒකට ශාපලත් එවුන්ව ටාටරස්වලින් පිටට කැඳවන්නත් පුළුවන් ඇති. එයාලට ඒක උත්සහ කරලා බලන්න ඉඩ දෙන්න අපිට බැහැ."

"'එයාලා' කවුද කියලා අපි තවම දන්නෙ නැහැ නේ," තාලියා කිවුවා.

"ක්‍රෝනොස්ට වැඩ කරන අර්ධ-ලෝහිතයා," මම කිවුවා. "ජේන හැටියට ඊතන් නකමුරා. එයා හේඩීස්ගේ සමහර දාසයන්ව එයාගේ පැත්තට බඳවා ගන්න පටන්ගෙන - කීරස්ලා වගේ අයව. යක්ෂයෝ හිතන්නේ ක්‍රෝනොස් යුද්ධයෙන් දිනුවොත්, උන්ට ව්‍යාකූලත්වයයි, නපුරයි වැඩියෙන් ලැබෙයි කියලා."

"මට හිතෙන්නෙ උන් හරි ඇති," නිකෝ කිවුවා. "මගේ තාත්තා උත්සහ කරන්නේ සමබරකම රැකගන්න. එයා ගොඩක් සාහසික අමනුස්සයන්ව පාලනේ කරනවා. බැරි වෙලාවත් ක්‍රෝනොස් පාතාල ලෝකයේ පාලකයා විදිහට එයාගේ සහෝදරයෙක්ව පත් කරොත්-"

"හරියට මේ ඉයාපෙෂස් හාදයා වගේ," මම කිවුවා.

"-එහෙනම් පාතාල ලෝකේ මීටත් වඩා ගොඩක් නරක් වෙයි," නිකෝ කිවුවා. "එහෙම වෙනවට කීරස්ලා ආස ඇති. ඒ වගේම මෙලිනොයිත්."

"මේ මෙලිනොයි කවුද කියලා ඔයා අපිට තවම කිවුවේ නැනේ."

නිකෝ තොල සැපුවා. "එයා තමයි අවතාරවල දෙවඟන - මගේ තාත්තගේ සේවකයින්ගෙන් කෙනෙක්. පොළොවේ හොල්මන් කරන, විවේකයක් නැති මළවුන්ව පාලනේ කරන්නෙ එයා. හැම රෑකම මිනිස්සුන්ව බය කරන්න එයා පාතාල ලෝකෙන් උඩට යනවා."

"මතුපිට ලෝකෙට යන්න එයාට එයාගෙම පාරක් තියෙනවා ද?"

නිකෝ ඔළුව වැනුවා. "ඒක නම් අගුළු දාලා ද කියලා මට සැකයි. සාමාන්‍යයෙන්, එයාගේ ගුහාවට හොරෙන් රිංගන්න කිසිම කෙනෙක් හිතන්නෙවත් නෑ. ඒත් මේ උප දෙවි හොරා එයා එක්ක ගනුදෙනුවක් ඇති කරගන්න තරම් නිර්භීත නම්-"



"එයාට ආපහු මතුපිට ලෝකෙට යන්න පුළුවන්," තාලියා අඩුව පිරෙව්වා. "ඊට පස්සේ කඩුව ක්‍රෝනොස් අතට දෙයි."

"එයා ඒක එයාගේ සහෝදරයින්ව ටාටරස්වලින් එළියට ගන්න පාවිච්චි කරයි," මම අනුමාන කළා. "ඊට පස්සේ අපි ලෝක අමාරුවක වැටෙයි."

මම අමාරුවෙන් දෙපයින් හිටගත්තා. ඒත් එක්කම ඉසේ කරකැවිල්ලක් ඇවිත් මාව ඇදගෙන වැටෙන්න ගියත්, තාලියා මාව අල්ලා ගත්තා.

"පර්සි," එයා කිවුවා. "ඔයා ඉන්නේ හොඳ තත්ත්වෙක නෙවෙයි-"

"මට මේක කරන්නම වෙනවා." කානේෂන් මලේ තවත් පෙත්තක් පරවී ගිලිහෙන දිහා මම බලා සිටියා. ලෝක විනාශය වෙන්න තව පෙති හතරයි තියෙන්නේ.

"මට මල් පැළේ දෙන්න. අපිට මෙලිනොයිගේ ගුහාව හොයාගන්න තියෙනවා."

අපි ඇවිද යද්දි, මම ධනාත්මක දේවල් ගැන හිතන්න උත්සහ කළා: මගේ ප්‍රියතම පැසි පන්දු ක්‍රීඩකයෝ, ඇනබෙත්ගෙයි මගෙයි අන්තිම කතාබහ, නත්තල් රෑ කෑමට මගේ අම්මා මොනවා හදාවි ද - වේදනාව ගැන ඇරෙන්න වෙන ඕනෑම දෙයක්. ඒ වුණත්, මට තවමත් දැනුණේ සේබර්-දත් ඇති කොටියෙක් මගේ උරහිස බරු ගහනවා වගෙයි. සටනක් ඇති වුනොත් නම් මට ඒ හැටි දෙයක් කරන්න බැරි වෙනවා. මගේ ආරක්ෂාව පහත දමා ගැනීම ගැන මම මටම දොස් කියාගත්තා. මට තිබුණේ තුවාල කරගන්නේ නැතුව ඉන්නයි. දැන් තාලියාටයි නිකෝටයි මෙහෙයුමේ ඉතිරිය පුරාවට ම කමකට නැති මාව ඇදගෙන යන්න සිද්ධ වෙලා.

මං ගැනම දුක් වෙවී ගිය මට නිකෝ කතා කරනකල් ම ගිගුම් දෙන වතුරේ හඬ ඇහුනේ නැහැ. "ඔහ්-අහ්."

අපිට මීටර් පහළොවක් විතර ඉදිරියෙන්, ගිනි කඳු පාෂාණයෙන් සැදුණු දුර්ග මගක් ඔස්සේ අඳුරු ගංඟාවක් කැලතෙමින් ගලා ගියා. මේක මම මීට කලින් දැකලා තිබුණ ස්ටයික්ස් ගඟ වගේ නෙවෙයි. මේක ඊට වඩා පටු සහ වඩාත් වේගවත් වුණා. එහි වතුර තීන්ත

වගේ කළු පාටයි, එහි එහා ඉවුරට තිබුණේ මීටර් දහයක විතර දුරක්. ඒත් ඒක පනින්න දුර වැඩියි. ඒ වගේම එගොඩ වෙන්න පාලමක් තිබුනෙත් නැහැ.

"ලීතී ගඟ," නිකෝ පෞරාණික ග්‍රීක බසින් ශාප කළා. "අපිට කවදාවත් මේක හරහා යන්න බැහැ."

මල ගඟේ එහා ඉවුර දෙසට හැරී තිබුණා - අන්ධකාර කන්දක් සහ එහි ඉහළින් ඇති ගුහාවකට ඇදෙන අඩි පාරක් දෙසට. කන්දට එපිටින්, පාතාල ලෝකයේ ප්‍රාකාර කළු ගලින් සැදි අඳුරු අහසක් වගේ නොපැහැදිලිව පෙනුණා. පාතාල ලෝකයට පිටත ගැටියක් ඇති කියලා මට කල්පනා වෙලා තිබුනේ නැහැ, ඒත් මේකෙන් එහෙම දෙයක් ඇති බව පෙනුණා.

"මේකෙන් එගොඩට යන්න ක්‍රමයක් තියෙන්න ම ඕනෑ," මම කිවුවා.

තාලියා ගං ඉවුර ළඟ දණ ගසාගත්තා.

"පරිස්සමෙන්!" නිකෝ කිවුවා. "මේක තමයි අමතක වන සුලු බවේ ගඟ. එක වතුර බිංදුවක් හරි ඔයාගේ ගෑවුනොත්, ඔයාට ඔයා කවුද කියන එක පවා අමතක වෙන්න පටන් ගනී."

තාලියා පසුබැස්සා. "මම මේ තැන දන්නවා. එක සැරයක් ලූක් මට මේක ගැන කිවුවා. නැවත උපදින්න තෝරගන්න ආත්ම මෙතැනට ඇවිල්ලා, පහුගිය ආත්මේ ගැන සම්පූර්ණයෙන් ම අමතක කරගන්නවලු."

නිකෝ ඔළුව වැනුවා. "මේ වතුරේ පීනුවොත් ඔයාගේ මතකය මුළුමනින් ම හේදිලා යනවා. ඊට පස්සෙ ඔයා අලුත ඉපදිච්ච බබෙක් වගේ වෙයි."

තාලියා එහා ඉවුර දිහා සැලකිල්ලෙන් බැලුවා. "මට එහා පැත්තට ඊතලයක් විදින්න පුළුවන්, සමහරවිට ඒකේ කඹයක් පටලවලා, එහා පැත්තේ ගලක ඇමිණුවොත්."

"ගැට ගහලාවත් නැති කඹේකට ඔයාගේ බර දරාගන්න පුළුවන් වෙයි කියලා ඔයා හිතනව ද?" නිකෝ ඇසුවා.



තාලියා නළල රැළි කරගත්තා. "ඔයා හරි. ඒවා චිත්‍රපටිවල තියෙන වැඩ, ඒත්... එපා. අපේ උදවුවට මැරිච්ච මිනිස්සුන්ව ගෙන්නන්න ඔයාට බැරි ද?"

"මට පුළුවන්, ඒත් එයාලා මතු වෙන්නේ ගඟේ මම ඉන්න පැත්තෙන් විතරයි. ගලන වතුර මළවුන්ට බාධාවක්. එයාලට ඒක හරහා යන්න බැහැ."

මම මූණ පුලුටු කරගත්තා. "මොන ගොන් නීතියක් ද ඒක?"

"හේයි, ඒක මම හදපු එකක්යෑ." එයා මගේ මූණ දිහා බලා සිටියා. "ඔයාගේ පෙනුම නම් දරුණුයි, පර්සි. ඔයා ටිකක් වාඩි වෙලා හිටියොත් හොඳයි."

"මට බැහැ. මේක කරන්න ඔයාලට මාව ඕනෑ."

"ඒ මොකටද?" තාලියා ඇසුවා. "ඔයා හිටගෙන ඉන්නෙත් අමාරුවෙන්."

"මේ තියෙන්නෙ වතුර, නේ? මට ඒක පාලනය කරන්න වෙනවා. සමහරවිට, අපි එගොඩ වෙනකල්, ගඟ ගලන අත අනිත් පැත්තට හරවන්න මට පුළුවන් වෙයි."

"ඔයා ඔය ඉන්න විදිහට?" නිකෝ ඇසුවා. "කොහෙත්ම බැහැ. ඊතලේ අදහස ඊට වඩා හොඳයි."

මම ගං ඉවුරට අමාරුවෙන් ඇවිද ගියා.

මට මේක කරන්න පුළුවන් වෙයි ද කියලා මම දැනගෙන හිටියේ නැහැ. මම පොසෙයිඩන්ගේ පුතා නිසා, මට කිසිම ප්‍රශ්නයක් නැතුව කරදිය පාලනය කරන්න පුළුවන්. සාමාන්‍ය ගංගා... සමහර වෙලාවට, ගඟට අධිපති ජල දේවතාවන් සහයෝගය දෙන්න කැමති නම්. ඒත් පාතාල ලෝකයේ මායා ගංගාවක්? ඒ ගැන මට කිසිම අදහසක් තිබුනේ නැහැ.

"පස්සට වෙන්න," මම කිවුවා.

මම සැඩ පහරට - වියරු ලෙස ගලා යන කළු වතුර කඳට සිත ඒකාග්‍ර කළා. එය මගේ ඇඟේම කොටසක් විදිහට මම හිතේ මවාගත්තා. මට ජල ප්‍රවාහය පාලනය කරන්න හැකි බව, මගේ කැමැත්තට එය නම්මා ගන්න හැකි බව හිතේ මවාගත්තා.

Scanned by TapScanner

මට ඒ හැටි විශ්වාසයක් නැති වුණත්, වතුරට මගේ බලය දනිලා වගේ වඩාත් චණ්ඩ ලෙස බුබුළු දමමින් කැලතුණා කියලා මට හිතුණා. ගංගාව සහමුලින්ම නවත්වන්න මට හැකියාවක් නැති බව මම දන සිටියා. එහෙම කළොත් පහුබහින වතුර කඳ, මම අත හැරිය හැටියේ ම පුපුරා ගිහින් දෙණියම යට කර දමාවි. ඒත් ඒකට තවත් විසඳුමක් තිබුණා.

"අපි මෙහෙම කරලා බලමු," මම කෙඳිරුවා.

මගේ ඔළුවට උඩින් යමක් ඔසවන විදිහට මම අත් එසෙව්වා. මගේ උරහිසට ලෝදිය වැටිලා වගේ පිච්චෙනවා දැනුණත්, මම එය නොසලකා ඉන්න උත්සහ කළා.

ගඟ ඉහළට එසවුණා. ගං ඉවුරුවලින් ඉහළට එසවුණ වතුර කඳ විශාල ආරුක්කුවක් ලෙස ඉහළට ගලා ගොස්, ආපසු පහළට ගැලුවා - මීටර් හයක් උස වියරු වතුර කඳකින් සෑදුණු කළු දේදුන්නක්.

අපි ඉදිරියේ වූ ගං පතුල ගඟට යටින්, දෙන්නෙකුට අත් අල්ලාගෙන යා හැකි තරම් පළල ඇති වියළෙන මඩ ගොහුරකට හැරුණා.

තාලියා සහ නිකෝ විස්මයෙන් මගේ දිහා බලා සිටියා.

"යන්න," මම කිවුවා. "මට මේක ගොඩක් වෙලා අල්ලගෙන ඉන්න බැහැ."

මගේ ඇස් ඉස්සරහ කහ පාට පැල්ලම් නටන්න ගත්තා. මගේ තුවාල වුණ උරහිස වේදනාවෙන් බෙරිහන් නොදුන්නා විතරයි.

ගං පතුලට හතර ගාතෙන් බඩගා ගිය තාලියා සහ නිකෝ මඩේ එරෙමින් ඒ හරහා යන්න ගත්තා.

*එක බිංදුවක්වත් වැටෙන්න බැහැ. එක වතුර බිංදුවක්වත් එයාලගේ ඇඟට වැටෙන්න දෙන්න බැහැ.*

ලීතී ගඟ මට විරුද්ධව සටන් කළා. ගං ඉවුරුවලින් බලහත්කාරයෙන් ඉවත් වෙන්න එයට උවමනා වුනේ නැහැ. එයට ඕනෑ වුණේ මගේ යාළුවෝ මතට කඩා වැටිලා, එයාගේ මතකය සුද්ධ කරලා දාලා, එයාලව ගිල්වන්නයි. ඒ වුණත් මම ආරුක්කුව රඳවාගෙන ම සිටියා.



එහා ඉවුරට නැග ගත් තාලියා නිකෝට උදවු කරන්න හැරුණා.

"ඉක්මන් කරන්න, පර්සි!" එයා කිවුවා. "එන්න!"

මගේ දණහිස් සැලෙමින්තුයි තිබුණේ. මගේ අත් දෙකත් වෙවුලුවා. ඉදිරියට අඩියක් තැබූ මම වැටෙන්න ගියා. ජල ආරුක්කුව සෙලවුණා.

"මට ඒක කරන්න බැහැ," මම කිවුවා.

"ඔව් ඔයාට පුළුවන්!" තාලියා කිවුවා. "අපිට ඔයාව ඕනෑ!"

කොහොම හරි, පහළ ගං පතුලට බඩගාන්න මට පුළුවන් වුණා. එක අඩියක්, ඊට පස්සේ තවත් එකක්. මට උඩින් සැඩ පහර ගලා යමින් තිබුණා. මගේ බූට්වලට යටින් මඩ මිරිකුණා.

ගං පතුල හරහා අඩ දුරක් ගියාම, මාව පැකිළී වැටුණා.

"නෑ!" තාලියා බෙරිහන් දෙනවා මට ඇසුණා. ඒත් එක්කම මගේ චිත්ත ඒකාග්‍රතාවය බිඳුණා.

ලීතී ගංගාව මගේ උඩට කඩා වැටෙද්දී, මම අන්තිම අධිෂ්ඨානය කළා: *නොතෙමී ඉන්න.*

මට ඇසුණු ගිගුරුම් හඬත් එක්කම ටොන් ගාණක වතුර මගේ ඇඟට කඩා වැටෙනවා මට දැනුණා. ඒත්...

මම ඇස් ඇරියා. මාව තනි අඳුරකින් වට වී සිටියත්, මම සිටියේ මුළුමනින්ම වියළිවයි. වායු පටලයක් මගේ වටේට දෙවෙනි හමක් වගේ බැඳී, වතුරේ බලපෑමෙන් මාව ආරක්ෂා කරමින් තිබුණා. මම අමාරුවෙන් දෙපයින් සිටගත්තා. අඩු තරමේ, වියළිව සිටීමට යෙදූ මේ පුංචි වෑයම පවා - ඒක සාමාන්‍ය මිරිදියේ දි මම ඕනෑ තරම් කරලා තිබුණ දෙයක් - මට දරාගන්න බැරි තරම් වුණා. ඇස් නොපෙනෙන කළුවර වතුරේ, වේදනාවෙන් දෙකට නැමීගෙන මම හෙමින් හෙමින් ඇවිද ගියා.

මම ලීතී ගඟෙන් ගොඩට බඩගානවා දැකලා පුදුම වුණ තාලියා සහ නිකෝ අඩි දෙක තුනක් පස්සට පැන්නා. කකුල් අද්දවමින් ඉදිරියට ගිය මම, මගේ යාළුවෝ ඉදිරියේ ඇද වැටී, සීතලෙන් සිහිසුන් වුණා.

නෙක්ටාර්වල රස මට නැවත සිහි කැදෙව්වා. මගේ උරහිස් වඩාත් හොඳ අතට හැරිලා වගේ දැනුණා, ඒත් මගේ කන් ඇතුළේ අපහසු දනවන ගුමුගුමුවක් තිබුණා. මගේ ඇස් දෙකත් ගිනියම් වී දැනුණේ, මට උණ හැදිලා වගෙයි.

"අපිට තව නෙක්ටාර් දීලා අවදානමක් ගන්න බැහැ," තාලියා කියමින් සිටියා. "එයාව ගිනි ගනියි."

"පර්සි," නිකෝ කතා කළා. "ඔයාට මාව ඇහෙනව ද?"

"ගිනි ගනියි," මම මිමිණුවා. "ඇහුණා."

මම හෙමින් හෙමින් නැගිටලා වාඩිවුණා. මගේ උරහිසට අලුතින් වෙළුම් යොදා තිබුණා. එය තවමත් වේදනා දුන්නත්, මට දරාගන්න පුළුවන් වුණා.

"අපි ළඟටම ඇවිල්ලා," නිකෝ කිවුවා. "ඔයාට ඇවිදින්න පුළුවන් ද?"

කන්ද අපිට ඉහළින් නැගී තිබුණා. දූවිල්ලෙන් පිරුණු අඩි පාරක් කන්දේ මීටර් සියයක් විතර ඉහළින් වූ ගුහා කටකට ඇදී ගොස් තිබුණා. එහි ප්‍රියජනක බව වැඩි කරන්න වගේ පාර දෙපැත්තේ මිනිස් ඇටකටු පෙළගැසී තිබුණා.

"ලැස්තියි," මම කිවුවා.

"මම නම් මේකට කැමති නැහැ," තාලියා මිමිණුවා. ගුහාව දිහාවට මූණ හරවාගෙන සිටි කානේෂන් මල එයාගේ අතේ තිබුණා. දැන් මලේ ඉතිරිව තිබුණු අන්තිම පෙති දෙක පෙනුණේ, දුකෙන් ඉන්න හාවෙකුගේ කන් දෙකක් වගෙයි.

"දැක්කම ඇඟ හිරිවැටෙන ගුහාවක්," මම කිවුවා. "අවතාරවල දෙවඟන. කොච්චර ෂෝක් ද?"

එයට ප්‍රතිචාරයක් වගේ, සූ හඬක් කන්ද පහළට දෝංකාර දුන්නා. කවුරු හරි වියළි-අයිස් යන්ත්‍රයක් ක්‍රියාත්මක කරලා වගේ, ගුහාව තුළින් සුදු පාට මීදුම ගලා එන්න පටන් ගත්තා.

ඒ මීදුමෙන් රූපයක් මතුවුණා - නොපීරූ තඹ කොණ්ඩයක් ඇති උස ගැහැනු කෙනෙක්. රෝස පාට නාන කබායක් ඇඳ සිටි එයා වයින් වීදුරුවක් අතේ තබාගෙන සිටියා. එයාගේ මුහුණ දයාවක්



නැති, අමනාපයෙන් පිරුණු එකක්. මට එයාව විනිවිද දකින්න පුළුවන් වුණ නිසා, එයා මොකක් හෝ අමනුස්ස ආත්මයක් කියලා මම දැනගෙන හිටියා, ඒ වුණත් එයාගේ කටහඬ නම් ඇත්තම එකක් වගෙයි.

"දැන් ඔයා ආපහු ඇවිල්ලා," එයා තරහෙන් ගෙරෙව්වා. "හොඳයි, දැන් ඒකට පරක්කු වැඩියි!"

නිකෝ දිහා බැලූ මම මිමිණුවා, "මෙලිනොයි ද?"

නිකෝ උත්තර දුන්නෙ නැහැ. එයා ගල් ගැහිලා, අවතාරය දිහා බලාගෙන හිටියා.

තාලියා දුන්න පහත දැමුවා. "අම්මා?" එයාගේ ඇස්වල කඳුළු පිරුණා. එක පාරටම එයා අවුරුදු හතක කෙනෙක් වුණා වගෙයි.

අවතාරය, එයාගේ වයින් වීදුරුව බිම දැමුවා. කැලිවලට බිඳුණු ඒක මීදුම තුළට දියවී ගියා. "අන්න හරි, කෙල්ලේ. මම පොළොව උඩ හොල්මන් කරන්න කාලකණ්ණි වුණා, ඒක ඔයාගේ වැරැද්ද! මම මැරෙන වෙලාවේ ඔයා කොහෙද හිටියෙ? මට ඔයාව ඕනෑ කරපු වෙලාවේ ඔයා ඇයි පැනලා ගියේ?"

"මම- මම-"

"තාලියා," මම කිවුවා. "ඒක නිකං අවතාරයක් විතරයි. ඔයාට මොනවත් කරන්න ඒකට බැහැ."

"මම ඊට වඩා වැඩි කෙනෙක්," අවතාරය ගෙරෙව්වා. "තාලියා ඒක දන්නවා."

"ඒත්- ඔයා මාව අත ඇරලා දැම්මා," තාලියා කිවුවා.

"කාලකණ්ණි කෙල්ල! පැනලා ගියපු ගුණමකු එකී!"

"නවත්තනවා!" නිකෝ කඩුව ඇදලා අරන් ඉදිරියට අඩිය තැබුවා. ඒත් එක්කම රූපය මාරු කළ අවතාරය එයාට මුහුණ දුන්නා.

මේ අවතාරය දැකගන්න වඩාත් අමාරු වුණා. එයා පරණ මෝස්තරයේ කළු වෙල්වට් ගවුමකින් සහ ඊට ගැළපෙන තොප්පියකින් සැරසුණු ගැහැනු කෙනෙක්. එයා මුතු වැලක් සහ සුදු පාට අත් මේස් පැලඳගෙන සිටියා. එයාගේ කළු කොණ්ඩය පිටුපසට කර ගැට ගසා තිබුණා.

නිකෝ උන් තැනම නැවතුණා. "නෑ..."

"මගෙ පුතේ," අවතාරය කිවුවා. "මම මැරුණේ ඔයා ගොඩක් චූටි කාලේ. ඔයයි ඔයාගේ අක්කයි ගැන කල්පනා කරකර මම ලෝකෙ පුරා හොල්මන් කරනවා."

"මමා?"

"නෑ, ඒ මගේ අම්මා," තාලියා මිමිණුවේ, එයාට තවමත් පෙනෙන්නේ පළවෙනි රූපය වගෙයි.

මගේ යාළුවෝ අසරණ වී සිටියා. එයාලගේ දෙපා වටා මීදුම තව තවත් ගන වෙමින්, වැල් වගේ කකුල්වල එතෙන්න ගත්තා. එයාලගේ ඇඳුම්වලින් සහ මුහුණුවලින් පාට මැකී යමින් තිබුණේ එයාලත් අවතාර බවට පත් වෙනවා වගෙයි.

"ඔය ඇති," මම කිවුවා, ඒත් මගේ කටහඬ නෑහුණ තරම්. වේදනාව නොතකා, මම කඩුව ඔසවාගෙන අවතාරය ඉදිරියට අඩිය තැබුවා. "ඔහේ කාගෙවත් මමා නෙවෙයි!"

අවතාරය මගේ පැත්තට හැරුණා. රූපය සැලෙද්දි, අවතාරවලට අධිපති දෙවඟනව සැබෑ ස්වරූපයෙන් මට පෙනුණා.

කාලයත් එක්ක ග්‍රීක භූතයින්ගේ පෙනුමට බය වෙන එක මම නතර කරා කියලා ඔයා හිතනවා ඇති, ඒත් මෙලිනොයි මාව පුදුම කළා. එයාගේ දකුණු අර්ධය හුණු වගේ පාණ්ඩු පාට වුණේ, හරියට එයාගේ ඇඟේ ලේ හිඳිලා වගෙයි. තාර වගේ කළු පාට වූ එයාගේ වම් අර්ධය මමියක හම වගේ දැඩි වී තිබුණා. එයා රත්තරන් පාට ගවුමකින් සහ රත්තරන් පාට සළුවකින් සැරසී සිටියා. හිස් කළු කුහර දෙකක් වූ එයාගේ ඇස් දිහා බලද්දි මට දැනුණේ මම මගේම මරණය දිහා බලා ඉන්නවා වගෙයි.

"නුඹේ හොල්මන් කෝ?" එයා නොරිස්සුමෙන් ප්‍රශ්න කළා.

"මගේ.... මන්දා. මට එහෙම කවුරුවත් නැහැ."

එයා දත් විළිස්සුවා. "හැම කෙනාටම හොල්මන් තියෙනවා - නුඹ පසුතැවිලි වෙන මරණ. වරදකාරී හැඟීම්. බය. මට නුඹේ ඒවා ජේනෙන්නෙ නැත්තෙ ඇයි?"



තාලියා සහ නිකෝ තවමත් මෝහනය වෙලා, දෙවඟන දිහා බලා සිටියේ එයාලගේ කාලෙකට-ඉස්සර නැති වුණ අම්මා එයා වගෙයි.

මට මැරෙනවා දකින්න සිද්ධ වුණ මගේ අනෙක් යාළුවන්ව සිහි වුණා - නම් වශයෙන් කියනවා නම්, බියන්කා ඩි ආන්ජෙලෝ, ෂෙසෝයි නයිට්ෂේඩ්, ලී ෆ්ලෙචර්.

"මම එයාලත් එක්ක සාමදාන වෙලයි ඉන්නේ," මම කිවුවා. "එයාලා යන්න ගිහින් ඉවරයි. එයාලා අවතාර නෙවෙයි. දැන් මගේ යාළුවන්ට යන්න දෙනවා!"

මම මෙලිනොයිට කඩුවෙන් කෙටුවා. එයා කේන්තියෙන් ගොරවමින් වේගයෙන් පස්සට පැන්නා. මගේ යාළුවෝ වටා වූ මීදුම පහ වී ගියා. එයාලා තදින් ඇහිපිය ගසමින් දෙවඟන දිහා බලා සිටියේ එයාගේ පෙනුම කොයි තරම් භයානක ද කියලා දැක්කේ දැන් වගෙයි.

"මේ මොකෙක් ද?" තාලියා ඇසුවා. "කොහෙද-"

"ඒක විජ්ජාවක්," නිකෝ කිවුවා. "එයා අපිව රැවැට්ටුවා."

"නුඹලා පරක්කු වැඩියි, උප දෙවියනේ," මෙලිනොයි කිවුවා. මගේ කානේෂන් මලෙන් තවත් පෙත්තක් ගිලිහුණේ, අන්තිම පෙත්ත විතරක් ඉතුරු කරමින්. "ගනුදෙනුව වෙලා ඉවරයි."

"මොන ගනුදෙනුව ද?" මම ඇසුවා.

මෙලිනොයි සූ හඬක් නැගුවා, ඒ එයා හිනාවෙන විදිහ කියලා මට තේරුණා. "හොල්මන් ගොඩක්, මගේ තරුණ උප දෙවියෝ. එයාලා කාලයක් තිස්සේ නිදහස් වෙන්න බලන් ඉන්නවා. ක්‍රෝනොස් ලෝකය පාලනේ කරන්න ගත්තා ම, මට දවල් රෑ දෙකේම මිනිස්සු අතරේ ඇවිදිමින්, හිතේ හැටියට භීතිය වපුරන්න ඉඩ ලැබෙයි."

"හේඩීස්ගේ කඩුව කොහෙද?" මම ප්‍රශ්න කළා. "ඊතන් කොහෙද?"

"ළඟම ඇති," මෙලිනොයි පොරොන්දු වුණා. "මම නුඹව නවත්තන්නෙ නැහැ. මට එහෙම කරන්න උවමනාවක් නැහැ.

ඉක්මනින් ම. පර්සි ජැක්සන්, තුඹට හොල්මන් ගොඩක් ලැබෙයි. ඒ වගේම තුඹට මාව මතක හිටියි."

දූත්තට ඊතලයක් ඇමිණූ තාලියා එය දෙවගතට මැනුවා. "ඔහේ ලෝකයට යන්න පාරක් ඇරියොත්, ක්‍රෝනොස් ඔහේට තෑගි දෙයි කියලා ඇත්තටම හිතනව ද? එයා හේඩීස්ගේ අනිත් සේවකයෝ ටිකත් එක්ක ඔහේවත් ටාටරස්වලට විසි කරයි."

මෙලිනොයි දත් විළිස්සුවා. "තුඹේ අම්මා කිවුවා හරි, තාලියා. තුඹ තරහෙන් පිරිච්ච කෙල්ලෙක්. පැනලා දුවන්න විතරයි දන්නේ. ඊට වඩා දෙයක් බැහැ."

ඊතලය පියඹා ගියා. ඒත් ඒක මෙලිනොයිගේ ගෑවෙද්දි ම එයා මීදුමකට හැරී විසිරී ගියේ, එයාගේ සූ ගාන හිනා හඬ ඇර වෙන කිසිවක් ඉතිරි නොකරමින්. තාලියාගේ ඊතලය ගලක වැදි, බිම වැටුණා.

"මෝඩ හොල්මන," එයා කෙඳිරුවා.

එයා ඉන්නේ ඇත්තටම සසල වෙලා කියලා මට තේරුණා. එයාගේ ඇස් වටේ රතු වෙලා. එයාගේ අත් වෙවුලුවා. නිකෝත් ඒ තරමට ම හිගැස්සිලා හිටියේ, හරියට කවුරු හරි එයාගේ ඇස් දෙක මැදට ගහලා වගෙයි.

"අර හොරා..." එයා අමාරුවෙන් කියාගත්තා. "ගුහාව ඇතුළේ ඇති. අපි එයාව නවත්තන්න ඕනෑ-"

එතකොටම, කානේෂන් මලේ අන්තිම පෙත්තත් ගිලිහුණා. කළු පාටට හැරුණු මල පරවුණා.

"පරක්කු වැඩියි," මම කිවුවා.

පිරිමියෙකුගේ හිනා හඬක් කන්ද පහළට දෝංකාර දුන්නා.

"එතැන දී තුඹ හරි," කටහඬක් රැව් දුන්නා. ගුහාවේ කට ළඟ දෙන්නෙක් හිටගෙන හිටියා - එක ඇසක් වසාගත් කොල්ලෙක් සහ හිරකරුවෙකුගේ ඇඳුමකින් සැරසුණු මීටර් තුනක් උස පිරිමියෙක්. මම කොල්ලව හඳුනා ගත්තා: ඊතන් නකමුරා, නෙමෙසිස්ගේ පුතා. එයාගේ අතේ වැඩ නිමා නොකළ කඩුවක් තිබුණා - කළු ස්ටයිජියන් යකඩින් සාදා, ඇටසැකිලි මෝස්තර රිදියෙන් කැටයම් කළ, දෙපැත්ත



කැපෙන තලයක්. එයට මිටක් සවිකර තිබුනේ නැහැ, ඒ වුණත් මට පර්සෙෆෝන් පෙන්වූ රූපයෙන් දකින්න ලැබුණු විදිහට ම, කඩු තලය පතුලේ රන් යතුරක් තිබුණා. ඒ යතුර දිදුලමින් තිබුණේ හරියට ඊතන් දැනටමත් එහි බලය කැඳවලා වගෙයි.

එයා ළඟ සිටි යෝධ පිරිමියාට තිබුණේ තනි රිදී ඇස් දෙකක්. එයාගේ මුහුණ රළු රැවුලකින් වැහිලා, අළු පාටට හැරුණු කොණ්ඩය අවුල් වෙලා තිබුණා. එයාගේ ඉරුණු හිරකරු ඇඳුම ඇතුළේ එයාට වැහැරුණු පෙනුමක් ලැබී තිබුණේ හරියට පහුගිය අවුරුදු දෙතුන්දාහ එයා ආගාධයක් පතුලේ ගෙවලා වගෙයි. ඒත් මේ අබලන් තත්ත්වයේ සිටිද්දිත්, එයාට තිබුණේ සෑහෙන බය උපදවන පෙනුමක්.

එයා අතක් ඉදිරියට දිගු කරද්දි යෝධ තෙල්ලයක් ම වුණා. තාලියා ඉයාපෙෂස් ගැන කියූ දේ මට සිහි වුණා: ***එයාගේ නමේ තේරුම 'සිදුරු කරන්නා'. මොකද ඒක තමයි එයා එයාගේ හතුරන්ට කරන්න කැමති.***

ටයිටන් කෲර ලෙස හිනාවුණා. "දැන් මං තුඹලාව විනාශ කරනවා."

***

"ස්වාමීනි!" ඊතන් මැදිහත් වුණා. සටනකට ඔබින ලෙස සැරසී සිටි එයා ගමන් මල්ලක් කරේ එල්ලාගෙන සිටියා. එයාගේ ඇස් ආවරණය ඇද වෙලා, මූණ දූළි සහ දහඩියෙන් වැහිලා තිබුණා. "කඩුව අපි ළඟ නේ. අපි දැන්-"

"ඔව්, ඔව්," ටයිටන් නොයිවසිල්ලෙන් කිවුවා. "තුඹ හොඳින් ඒක කෙරුවා, නවාකා."

"නකමුරා, ස්වාමීනි."

"ඕනෑ එකක්. මගේ සහෝදරයා ක්‍රෝනොස් තුඹට තෑගි දෙයි කියලා මට විශ්වාසයි. ඒත් දැන් අපි මුන්ව මරන එකට හිත යොදවන්න ඕනෑ."

"මගේ උතුමාණෙනි," ඊතන් නැවතත් උත්සහ කළා. "ඔබතුමා ඉන්නේ සම්පූර්ණ බලය ඇතිව නෙවෙයි. අපි උඩට ගිහිල්ලා, ඔබතුමාගේ සහෝදරයින්ව කැඳවන්න ඕනෑ. අපිට අණ ලැබිලා තියෙන්නේ පැනලා යන්න."

ටයිටන් වේගයෙන් එයා වෙතට හැරුණා. "පැනලා යන්න? තුඹ කිවුවේ පැනලා යන්න කියල ද?"

පොළොව දෙදුරුවා. පස්ස බිම ඇනෙන්න වැටුණු ඊතන් ආපස්සට බඩගෑවා. හේඩීස්ගේ නිමා නොකළ කඩුව හඬ නගමින් ගල් මතට වැටුණා. "ස්-ස්-ස්වාමීනී, කරුණාකරලා-"

"ඉයාපෙෂස් පැනලා යන්නෙ නැහැ! තරා වළෙන් එළියට එන්න මම යුග ගාණක් තිස්සේ බලන් හිටියා. මට ඕනෑ පළිගන්න. මේ නිවටයෝ ටික මරලා මම ඒක පටන් ගන්නවා!"

මට හෙල්ලය මැනූ එයා පහර දෙන්න දුවගෙන ආවා.

එයා සම්පූර්ණ ශක්තිය ඇතිව හිටියා නම්, මාව හරි මැදින් හිල් කරයි කියලා මට කිසිම සැකයක් නැහැ. මේ දැන් තරා වළෙන් එළියට ඇවිල්ලා දුර්වලව හිටියා වුණත්, මේ හාදයා වේගවත් වුණා. ටොනේඩෝවක් වගේ ආව එයා එල්ල කළ වේගවත් පහරින් යාන්තමින් බේරිලා මම පැත්තකට පැන ගනිද්දි මම හිටගෙන සිටි තැන ගල තුළට එයාගේ හෙල්ලය කිඳා බැස්සා.

මට දැනෙමින් තිබුණු ඉසේ කරකැවිල්ල නිසා මම කඩුව අල්ලගෙන හිටියෙත් හරිම අමාරුවෙන්. ඉයාපෙෂස් ගල් ගෙඩියෙන් හෙල්ලය ගලවා ගත්තා, ඒත් එයා මට මූණ දෙන්න හැරෙද්දි ම තාලියා එයාගේ උරහිස්වල ඉඳන් දණහිස් දක්වාම ඊතලවලින් සැරසුවා. එයා ගර්ජනා කරමින් තාලියා වෙත හැරුණේ වේදනාවට වඩා තරහා ගිහිල්ලා වගෙයි.

ඊතන් නකමුරා එයාගේ කඩුව ඇදලා ගන්න උත්සහ කළා, ඒත් නිකෝ එයාට තර්ජනය කළා, "මම නම් ඒක හොඳයි කියලා හිතන්නෑ!"

ඊතන් ඉදිරියේ පොළොව දෙබෑ වුණා. එයින් එළියට බඩගෑව අවිගත් ඇටසැකිලි තුන ඊතන්ට පහර දෙමින්, එයාව පස්සට තල්ලු කරා.

හේඩීස්ගේ කඩුව ගල් උඩ වැතිරී තිබුණා. මට ඒක ගන්න පුළුවන් වුණා නම්...

ඉයාපෙෂස් හෙල්ලයෙන් ගසද්දි තාලියා පැත්තකට පැන්නා. එයා කිණිසි අතට ගන්න දුන්න බිම දැමුවා. ඒත් මුහුණට මුහුණ



සටනකින් ඒ හැටි වෙලා පණ බේරගෙන ඉන්න එයාට පුළුවන් වෙන්නේ නැති වෙයි.

ඊතන්ව ඇටසැකිලිවලට බාරදුන් නිකෝ ඉයාපෙෂස්ට පහර දෙන්න පැන්නා. මම දැනටමත් හිටියේ එයාට ඉදිරියෙනුයි. මගේ උරහිස පුපුරන්න යනවා වගේ දැනුණත්, මම ටයිටන්ගේ ඇඟට පැනලා, රිප්ටයිඩ්ගෙන් පහළට කෙටුවේ, කඩු තලය ටයිටන්ගේ කෙණ්ඩයට කිඳා බහින විදිහටයි.

"ආහ්හ්!" තුවාලයෙන් රත් පාට අයිකෝර් පිටට විද්දා. වේගයෙන් කැරකුණ ඉයාපෙෂස් හෙල්ලයේ කඳෙන් මට ගැසූ පාරට මාව උඩින් විසිවුණා.

ලීති ගඟ ළඟම ගල උඩට මාව ඇද වැටුණා.

"මුලින්ම උඹ මැරියං!" තොණ්ඩි ගසමින් මගේ දිහාවට එන ගමන් ඉයාපෙෂස් ගිගුරුවා.

තාලියා, එයාගේ කිණිසිවලින් විදුලි කදක් යවලා, එයාගේ අවධානය හරවා ගන්න උත්සහ කළත්, එයා තාලියාව මදුරුවෙක් තරමටවත් ගණන් ගත්තේ නැහැ. නිකෝ එයාට කඩුවෙන් ඇන්නා, ඒත් ඉයාපෙෂස් එයා දිහා බලන්නවත් කරදර නොවී එයාව පැත්තකට තල්ලු කරලා දැම්මා. "මං උඹලා ඔක්කොම මරනවා! ඊට පස්සේ උඹලගේ ආත්ම ටාටරස්වල සදාකාලික අන්ධකාරේ කුණු වෙන්න දානවා!"

මගේ ඇස් පාට පාට එළිවලින් පිරිලා තිබුණා. මට හෙලවෙන්නවත් අමාරු වුණා. තවත් අඟල් දෙකක් ගියොත් මාව ඔළුව පහළට හිටින්න ගඟට වැටෙනවා.

*ගඟ.*

මගේ කටහඬ තවමත් වැඩ කරනවා ඇති කියලා බලාපොරොත්තු වෙමින් මම තදින් කෙළ ගිල්ලා. "ඔහේ- ඔහේ ඔහේගේ පුතාටත් වඩා කැතයි," මම ටයිටන්ට ඇද කරා. "ඇට්ලස්ට එයාගේ මෝඩකම ලැබිලා තියෙන්නේ කොහෙන්ද කියලා දැන් මට ජේනවා."

ඉයාපෙෂස් දත් විළිස්සුවා. එයා හෙල්ලය ඉහළට ඔසවමින්, මගේ දිහාවට බකල ගැහුවා.

Scanned by TapScanner

එයට උවමනා ශක්තිය මගේ ළඟ තියෙනවා ද කියලා මම දැනගෙන හිටියේ නැති වුණත්, අඩු තරමේ උත්සහ කරලා බලන්නවත් මට සිද්ධ වුණා. ඉයාපෙෂස් හෙල්ලය පහළට ගෙනෙද්දි මම පැත්තකට පෙරළුණා. හෙලි තුඩ මගේ ළඟම පොළොවට බැස්සා. පහළට එසවුණු මම එයාගේ කමිස කොලරය ඩැහැ ගත්තේ, එයා තුවාල වෙලා වගේම සමබරතාවයත් නැතුව ඉන්නවා ඇති කියන බලාපොරොත්තුවෙන්. එයා ආපසු කකුල් ස්ථාවරව රඳවා ගන්න දඟලුවත්, මම මගේ ඇගේ මුළු බරම යොදමින් එයාව ඉස්සරහට ඇද්දා. කකුල් පැටලී වැටුණු එයා, බයටම මගේ අතේ එල්ලුණා. ඒත් එක්කම අපි දෙන්නව ලීතී ගංගාවට විසිවුණා.

*ජබෝෂ්!* මාව කළු වතුරේ ගිලුණා.

මගේ රැකවරණය රැඳී තියෙන්න කියලා මම පොසෙයිඩන්ට යාඥා කළා.

ඒත් එක්කම මාව ගං පතුලට කිඳා බහිද්දි, මම තවමත් නොතෙමී ඉන්න බව මට තේරුම් ගියා. මගේ නම මොකක්ද කියලා මට තවමත් මතක තිබුණා. ඒ වගේම මම ටයිටන්ව කමිස කොලරයෙන් අල්ලාගෙන සිටියා.

සැඩ පහරේ වේගයට එයාව මගේ අතින් ගිලිහී යා යුතුව තිබුණත්, කොහොමදෝ ගඟ මගේ වටින් ගලා යමින්, අපිට අපේ පාඩුවේ ඉන්න දුන්නා.

ඉතිරිව තිබුණු අන්තිම ශක්තිය පොදෙන්, මම ගඟෙන් ගොඩට බඩගෑවේ, මගේ හොඳ අතෙන් ඉයාපෙෂස්වත් ඇදගෙනමයි. අපි ගං ඉවුර උඩට ඇද වැටුණා - මම මුළුමනින්ම වියළිව සහ ටයිටන් දිය බේරෙමින්. එයාගේ තනි රිදී පාට ඇස් හඳවල් දෙකක් වගේ ලොකු වෙලා තිබුණා.

තාලියා සහ නිකෝ මට එහා පැත්තෙන් සිටගෙන බලා සිටියේ තුෂ්නිම්භූත වෙලයි. කන්ද උඩ ගුහාවේ, ඒතන් නකමුරා අන්තිම ඇටසැකිල්ලත් කපා බිම හෙළුවා. ආපසු හැරුණු එයා, එයාගේ ටයිටන් සහයකයා රාජාලියෙක් වගේ බිම වැතිරිලා ඉන්න හැටි දැකලා ගල් ගැහුණා.

"ම-මගේ උතුමාණෙනි?" එයා කතා කළා.



නැගිටලා වාඩිවුණු ඉයාපෙෂස් ඇස් ලොකු කරගෙන එයා දිහා බලා සිටියා. ඊට පස්සේ මගේ දිහා බලපු එයා හිනාවුණා.

"හෙලෝ," එයා කිවුවා. "මම කවුද?"

"ඔයා මගේ යාළුවා," මට ඉබේටම කියවුණා. "ඔයා... බොබ්."

ඒක අහලා එයා සෑහෙන සතුටු වුණා වගෙයි. "මම ඔයාගේ යාළුවා බොබ්!"

පැහැදිලිවම, මේ වෙන දේවල් එයාට ගුණ නැති බව ඒතන්ට තේරුම් ගිහින් තිබුණා. එයා දූවිලි මත වැතිරී තිබුණු හේඩීස්ගේ කඩුව දිහාවට බැල්මක් හෙළුවා, ඒත් එය මතට පනින්න එයාට ඉඩක් ලැබෙන්න කලින්, එයාගේ දෙපා මුල පොළොවට රිදී ඊතලයක් වැදුණා.

"අද නෙවෙයි, පොඩි එකෝ," තාලියා අනතුරු ඇඟෙව්වා. "තව එක අඩියක් හරි ඉස්සරහට ආවොත්, මම ඔහේගෙ කකුල් දෙක ගලට අමුණනවා."

ඒතන් දිවුවා - කෙලින්ම මෙලිනොයිගේ ගුහාව තුළට දිවුවා.

තාලියා එයාගේ පිටුපසට ඉලක්කය ගත්තත්, මම එයාව වැළැක්වූවා. "එයාට යන්න දෙන්න."

එයා රවා බැලුවත්, දුන්න පහළ දැමුවා.

ඒතන්ට යන්න දෙන්න මට ඕනෑ වුණේ ඇයි කියලා මට විශ්වාස නැහැ, මං හිතන්නේ අපි එක දවසකට සෑහෙන්න ගහමරා ගැනීම් ඒ වෙද්දිත් කරලා තිබුණ නිසා වෙන්න ඇති. ඒ වගේම ඇත්තම කියනවා නම් මට ඒ ළමයා ගැන දුක හිතුණා. මේ සිද්ධිය ක්‍රෝනොස්ට රපෝර්තු කරන්න ගියාම එයාව මීට වඩා කරදරේක වැටෙයි.

නිකෝ භක්තිමත් ලෙස හේඩීස්ගේ කඩුව අහුලා ගත්තා. "අපි ඒක කළා. අපි ඇත්තටම ඒක කළා."

"අපි ඒක කළා?" ඉයාපෙෂස් ඇසුවා. "මමත් උදවු කරා ද?"

මට යාන්තමින් හිනාවක් පාන්න හැකිවුණා. "ඔව්, බොබ්. ඔයා නියමෙට වැඩේ කළා."

Scanned by TapScanner

***

ආපසු හේඩීස්ගේ මාලිගාවට යන්න අපිට අධිවේගී ප්‍රවාහන සේවයක් ලැබුණා. පොළොවෙන් ඉවතට කැඳවාගත් අවතාර කීපයක් අතේ නිකෝ පණිවුඩයක් යැවුවා, ඊට පස්සේ විනාඩි දෙක තුනක් ඇතුළත අපිව රැගෙන යන්න ෆියුරිලා තුන්දෙනා ආවා.

බොබ් නම් ටයිටන්වත් අරගෙන යන්න එයාලා නම් සතුටු වුනේ නැහැ, ඒත් එයාව මග දාලා යන්න මට හිත දුන්නෙ නැහැ, විශේෂයෙන් ම මගේ උරහිසේ තුවාලය දකලා "ඌයි," කියපු එයා එක ස්පර්ශයකින් ඒක සුව කරලා දුන්නටත් පස්සේ.

කොහොම හරි, අපි හේඩීස්ගේ සිංහාසන ශාලාවට ළඟා වෙන වෙලාව වෙද්දි, මට සෑහෙන සනීපයක් දැනුණා.

මළවුන්ගේ ස්වාමියා, එයාගේ ඇටකටු සිංහාසනයේ වාඩිවෙලා, එයාගේ කළු රැවුල අතගාමින් අපිට රවාගෙන හිටියේ හරියට අපිට වධ දෙන්න හොඳම ක්‍රමය කල්පනා කරනවා වගෙයි.

පර්සෙෆෝන් එයා ළඟින් වාඩිවෙලා, නිකෝ අපේ වික්‍රමාන්විතය ගැන විස්තර කරද්දි, වචනයක්වත් නොකියා අසා සිටියා.

කඩුව ආපහු දෙන්න කලින්, හේඩීස් දෙවිවරුන්ට විරුද්ධව ඒක පාවිච්චි කරන්නේ නැති බව දිවුරන්න කියලා මම බල කර ඉල්ලුවා. මාව අළු කරලා දාන්න උවමනාවෙන් වගේ එයාගේ ඇස් දැල්වුණත්, අන්තිමේ දි එයා දත් මිටි කමින් ඒ පොරොන්දුව දුන්නා.

නිකෝ, එයාගේ තාත්තාගේ පාමුල කඩුව තබා, නැමී ආචාර කරලා, එයාගෙන් ප්‍රතිචාරයක් ලැබෙන තුරු බලා සිටියා.

හේඩීස් එයාගේ බිරිඳ දිහා බැලුවා. "නුඹ මගේ ඍජු නියෝගවලට අකීකරු වුණා."

එයා මොනවා කියනවා ද කියලා මට තේරුනේ නැහැ, ඒ වුණත් පර්සෙෆෝන් එයාට ප්‍රතිචාර දැක්වූයේ නැහැ. අඩු තරමේ හේඩීස්ගේ විනිවිද යන බැල්ම යටතේදිවත්.



හේඩීස් ආපහු නිකෝ වෙත හැරුණා. එයාගේ බැල්ම යාන්තමින් මෘදු වුණා, හරියට වානේවල ඉදත් කළු ගලක් තරමට වගේ. "ඔයා මේ ගැන කාටවත් කියන්නෙ එහෙම නැහැ."

"එහෙමයි, උතුමාණෙනි," නිකෝ එකඟ වුණා.

දෙවියා මගේ දිහා රවා බැලුවා. "ඒ වගේම ඔයාගේ යාළුවෝ මේ ගැන කටක් හොලවලා තිබුනොත්, මම එයාලගේ දිවවල් කපලා දානවා."

"අනේ හොඳයි," මම කිවුවා.

හේඩීස් කඩුව දිහා බලා සිටියා. එයාගේ ඇස් පිරී තිබුණේ කේන්තියෙන් සහ තවත් හැඟීමකින් - හරියට කැදරකමක් වගේ දේකින්. එයා අසුරක් ගැසුවාම, එයාගේ සිංහාසනය මුදුනේ සිට ෆියුරිලා තටු සලමින් පහළට ආවා.

"මේ තලය ආපහු කම්මලට ගිහින් දෙනවා," එයා එයාලට කිවුවා. "කම්මල්කාරයා ඒක ඉවර කරනකල් එතැනටම වෙලා ඉදලා, ඊට පස්සේ ආපහු මට ගෙනැත් දෙනවා."

ෆියුරිලා ආයුධය සමග සුළි නංවමින් වාතයට මුසු වෙද්දි, මේ දවස ගැන මට පසුතැවෙන්න වෙන දවස කොයි තරම් ඉක්මනින් උදා වෙයි ද කියලා මම පුදුම වුණා. දිවුරුමක වුණත් පුංචි පුංචි හිඩැස් තියෙනවා, ඉතින් හේඩීසුත් මේ වගේ හිඩැසක් හොයාගන්න බලයි කියලා මට හිතුණා.

"ඔබතුමා බුද්ධිමත්, මගේ ස්වාමීනී," පර්සෙෆෝන් කිවුවා.

"මම බුද්ධිමත් වුණා නම්," එයා තරහෙන් ගෙරෙව්වා, "මම නුඹව නුඹේ කුටියට දාලා අගුළු දානවා. නුඹ ආයේ කවදා හරි මට අකීකරු වෙලා තිබුණොත්-"

එයා ඒ තර්ජනය සම්පූර්ණ නොකර ඇරියා. ඊට පස්සේ අසුරක් ගැසූ එයා අඳුර තුළට චුත වුණා.

පර්සෙෆෝන් හිටියටත් වඩා සුදුමැලි වෙලා වගෙයි. එයාගේ ඇඳුමේ රැළි සකසන්න මොහොතක් ගත් එයා, ඊට පස්සේ අපි දිහාවට හැරුණා. "නුඹලා හොඳින් කටයුත්ත කළා, උප දෙව්වරුනි." එයා අතක් වනද්දී රතු රෝස මල් තුනක් අපේ පාමුල මතු වුණා."

මේවා පොඩි කරන්න, එතකොට ඒවා ඔයාලව පණ ඇති ලෝකයට අරගෙන යයි. නුඹලාට මගේ ස්වාමියාගේ ස්තූතිය හිමි වෙනවා."

"මටත් ඒක තේරුණා," තාලියා කෙඳිරුවා.

"කඩුව හදන එක ඔයාගේ අදහසක් නේද," මට තේරුම් ගියා. "ඒ නිසා තමයි ඔයා අපිට මේ මෙහෙයුම බාර දෙනකොට හේඩීස් එතැන හිටියෙ නැත්තේ. කඩුව නැතිවෙලා කියලා හේඩීස් දැනගෙන හිටියෙ නැහැ. අඩු තරමේ එහෙම එකක් තියෙනවා කියලවත් එයා දැනගෙන ඉඳලා නැහැ."

"මනස්ගාත," දෙවඟන කිවුවා.

නිකෝගේ අත් මිට මෙළවුණා. "පර්සි කිවුවා හරි. හේඩීස්ට කඩුවක් හදවන්න ඕනෑ වෙලා තියෙන්නේ ඔයාටයි. එයා ඔයාට එපා කියලා කිවුවා. ඒක ගොඩක් අනතුරුදායකයි කියලා එයා දැනගෙන හිටියා. අනිත් දෙවිවරු කවදාවත් එයාව විශ්වාස කරන්නේ නැහැ. ඒකෙන් බලයේ සමබරතාවය නැති වෙලා යනවා."

"ඊට පස්සේ ඒක හොරකම් කළා," තාලියා කිවුවා. "පාතාල ලෝකය අඟුළු දැම්මේ ඔයා මිසක් හේඩීස් නෙවෙයි. සිද්ධ වෙලා තියෙන්නෙ මොනවද කියලා එයාට කියන්න ඔයාට පුළුවන්කමක් තිබුනේ නැහැ. හේඩීස් මේ ගැන හොයන්න කලින් කඩුව ආපහු හොයාගන්න ඔයාට අපිව ඕනෑ වුණා. ඔයා අපිව පාවිච්චි කරා."

පර්සෙෆෝන් දෙතොල් තෙත් කරගත්තා. "වැදගත් ම දේ තමයි හේඩීස් දූන් කඩුව පිළිගත්ත එක. එයා ඒකේ වැඩ ඉවර කරගනියි, ඊට පස්සේ මගේ ස්වාමියාත් සියුස්, නැත්නම් පොසෙයිඩන් තරමට ම බලවත් වෙයි. අපේ රාජධානිය ක්‍රෝනොස්ගෙන්... නැත්නම් අපිට තර්ජනයක් වෙන්න උත්සහ කරන වෙන ඕනෑම කෙනෙක්ගෙන් ආරක්ෂා වෙයි."

"ඒ ඔක්කොටම අපි තමයි වග කියන්න ඕනෑ," මම මූසල හඬින් කිවුවා.

"නුඹලා ගොඩක් උදවු කරා," පර්සෙෆෝන් එකඟ වුණා. " බාගදා නුඹලාගේ නිහඬතාවයට තෑග්ගක්-"



"ඔයා දැන් ගියොත් හොඳයි," මම කිවුවා, "මම ඔයාව ඇදගෙන ගිහිල්ලා ලීතී ගඟට අත අරින්න කලින්. ඒකට බොබ් මට උදවු කරයි. එහෙම නේද, බොබ්?"

"බොබ් ඔයාට උදවු කරනවා!" ඉයාපෙෂස් සතුටින් කිවුවා.

පර්සෙෆෝන්ගේ ඇස් ලොකු වුණා. එයා ඩේසි වැස්සක් මැදින් අතුරුදහන් වුණා.

★★★

නිකෝ, තාලියා සහ මම ඇස්ෆොඩෙල් යාය දෙසට යොමු වූ සඳලුතලයක් මත දි සමුගත්තා. බොබ් නම් ටයිටන් ඒක ඇතුළේ වාඩි වෙලා, ඇටකටුවලින් සෙල්ලම් ගෙයක් හදමින්, ඒක කඩා වැටෙන හැම වතාවකම මහ හඬින් හිනා වෙමින් සිටියා.

"මම එයාව බලාගන්නම්," නිකෝ කිවුවා. "දැන් එයාගෙන් කරදරයක් නැහැ. සමහරවිට... අනේ මන්දා. සමහරවිට හොඳ දේකට එයාව පුහුණු කරවන්න අපිට පුළුවන් වෙයි."

"මෙහෙ නවතින්න ඕනෑ කියලා ඔයාට විශ්වාස ද?" මම ඇසුවා. " පර්සෙෆෝන් ඔයාගේ ජීවිතේ කාලකණ්ණි කරලා දායි."

"මට නවතින්න වෙනවා," එයා ස්ථිර ලෙස කිවුවා. "මම මගේ තාත්තට ළං වෙන්න ඕනෑ. එයාට හොඳ උපදේශකයෙක් ඕනෑ."

එයට විරුද්ධව තර්ක කරන්න මට පුළුවන්කමක් තිබුනේ නැහැ. "හොඳයි, ඔයාට මොනවා හරි ඕනෑ වුනොත්-"

"මම කතා කරන්නම්," එයා පොරොන්දු වුණා. එයා තාලියාට සහ මට අතට-අත දුන්නා.

යන්න හැරුණු එයා, ආයෙමත් මගේ දිහා බැලුවා. "පර්සි, ඔයාට මගේ යෝජනාව අමතක වෙලා නැහැ නේ?"

මගේ කොඳු නාරටිය පහළට හිරියක් ගලා ගියා. "මම තවමත් ඒ ගැන හිතනවා."

නිකෝ ඔළුව වැනුවා. "හොඳයි, ඔයා ලෑස්ති නම් ඕනෑ වෙලාවක."

එයා ගියාම, තාලියා කතා කළා. "මොන යෝජනාව ද?"

Scanned by TapScanner

"පහුගිය ගිම්හානේ එයා මට කියපු දෙයක්," මම කිවුවා. "ක්‍රෝනොස් එක්ක සටන් කරන්න පුළුවන් ක්‍රමයක්. ඒක අනතුරුදායකයි. දැන් නම් මම දවසකට ඇති වෙන්න අනතුරුදායක දේවල් කරලයි තියෙන්නේ."

තාලියා ඔළුව වැනුවා. "ඒ ගැන කියනවා නම්, අපි රෑ කෑමට ගියොත් කොහොමද?"

මට හිනා නොවී ඉන්න බැරිවුණා. "මේ වෙච්ච දේවල් ඔක්කොටමත් පස්සේ, ඔයාට තවමත් බඩගිනියි ද?"

"හේයි," එයා කිවුවා. "අමරණීය අයටත් කෑම කන්න වෙනවා. මං හිත හිතා ඉන්නේ මැක්හේල් එකේ චීස් බර්ගර් ගැන."

ඊට පස්සේ අපි දෙන්නම එක්ව අපිව ආපසු ලෝකයට රැගෙන යන රෝස මල් පොඩි කළා.

•••••

මහා අනාවැකියේ සඳහන් වෙන වීරයාගේ තෝරාගැනීමෙන් ඔලිම්පස් සුරැකෙයි ද? වැනසෙයි ද?

දෙවිවරුන්ගේ සහ ටයිටන්වරුන්ගේ මහා සංග්‍රාමය - 'පර්සි ජැක්සන් සහ අවසන් ඔලිම්පියානුවා' ගෙන් හමුවෙමු.



# පර්සි ජැක්සන්

# උප දෙවි ලිපි ගොනු

ඔබ මේ පොත කියවමින් සිටිනවා නම්, ඔබේ ජීවිතය තව තවත් අන්තරාදායක වීමට ආසන්නයි.

අර්ධ-ලෝහිත කඳවුරේ ජ්‍යෙෂ්ඨ ලේකම් වන රික් රියෝඩන් මෙම අතිශය රහසිගත ලිපිගොනුවලින් ඔබට කිසිම සාමාන්‍ය මනුෂ්‍ය ළමයෙකුට දැකීමට ඉඩක් නැති උප දෙවි ලෝකය තුළට එබී බැලීමට ඉඩ ලබා දී ඇත.

මෙම රහසිගත ලිපිගොනුවට පර්සි ජැක්සන්ගේ අති බිහිසුණු වික්‍රමාන්විත තුනක් ඇතුළත් වේ.

ඉතින්, ඔබ මෙම පොතෙන් සන්නද්ධ නම්, ඔබගේ පුහුණුවීම් අතරතුරේ දී නොමැරී සිටීම සඳහා දැනගත යුතු සියලු දැනුම ඔබ සතු වේවි. මේ ඔබගේ වික්‍රමාන්විතයන්ගේ ඇරඹුම පමණයි...

ආශිර්වාද ප්‍රකාශකයෝ
නො.70, ගිරිඋල්ල පාර, මීරිගම
033 2275419, 0777 577299

Read this from your Mobile
facebook

ISBN 978-955-697-090-

9 789556 970906

Rs. 250/=

Scanned by TapScanner